# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2213/2 - 2021 පෙබරවාරි මස 01 වැනි සඳුදා - 2021.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

ලංකාසෙට්ල්
පද්ධති රීති

2021.02.01 දින නිකුත් කර ඇත
(2020.12.31 දින දක්වා සංශෝධන ඇතුළත්ය)

2.2 සංස්කරණය

*ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව*
*ශ්‍රී ලංකා මහ බැංකුව*

## 01 වන වෙළුම
## සාමාන්‍ය විධි විධාන

### පටුන


1. **පද්ධති විශ්ලේෂණය** ..... 4A
   - 1.1 තත්කාලීන දළ පියවීම් පද්ධතිය ..... 4A
     - 1.1.1 තත්කාලීන දළ පියවීම් පදනම මත ගෙවීම් පියවීම ..... 4A
     - 1.1.2 ශුද්ධ මූලික පදනම මත ගෙවීම් පියවීම ..... 4A
   - 1.2 ලංකාසෙක්‍යු පද්ධතිය - නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය (SSSS) සහ මධ්‍යම තැන්පතු පද්ධතිය (CDS) ..... 4A
   - 1.3 පද්ධති සංරචක ..... 4A

2. **සාමාන්‍ය විධි විධාන** ..... 6A
   - 2.1 අර්ථ නිරූපණය ..... 6A
   - 2.2 පද්ධති රීති සම්පාදනය ..... 9A
   - 2.3 පද්ධති රීතීන්හි අරමුණු ..... 9A
   - 2.4 පද්ධති නීති සඳහා වන සංශෝධන ..... 10A
   - 2.5 භාෂාමය අනුවාද ..... 10A
   - 2.6 පද්ධතියේ සහභාගිවන්නෙකු වීමට තිබිය යුතු සුදුසුකම් ..... 10A
   - 2.7 ලංකාසෙට්ල් පද්ධතිය තුළ සහභාගිත්වය ..... 10A
   - 2.8 සහභාගිවන්නෙකු වීමට පූර්ව අවශ්‍යතාවයන් ..... 10A
   - 2.9 අයදුම් ඇගයීම ..... 11A
   - 2.10 තොරතුරු / නිවේදන ලබාදීමේ යුතුකම ..... 11A
     - 2.10.1 සහභාගිවන්නන්ගේ මෙහෙයුම්වල වෙනස්වීම් ..... 11A
     - 2.10.2 ගෙවීම් දාමයට බාධා ඇති කිරීම ..... 11A
   - 2.11 බලයලත් අත්සන්කරුවෝ ..... 11A
   - 2.12 ගාස්තු සහ අයකිරීම් ..... 11A
     - 2.12.1 ගාස්තු සහ අයකිරීම් නිර්ණය කිරීම පිළිබඳ දැනුම් දීම ..... 11A
     - 2.12.2 ගාස්තු වෙනස්වීම් පිළිබඳ දැනුම් දීම ..... 12A
   - 2.13 තාවකාලික අත්හිටුවීම, අවසන්කිරීම, ඉවත්වීම, එක් සහභාගිවන්නෙකු විසින් තවත් සහභාගිවන්නෙකු හා ඒකාබද්ධ වීම හෝ අත්පත් කර ගැනීම. ..... 12A
     - 2.13.1 තාවකාලික අත්හිටුවීම, අවසන් කිරීම, ඉවත්වීම හෝ එක් සහභාගිවන්නෙකු විසින් තවත් සහභාගිවන්නෙකු හා ඒකාබද්ධ වීම හෝ අත්පත් කර ගැනීම සඳහා දැනුම් දීමේ කාලසීමාව. ..... 12A
     - 2.13.2 තාවකාලික අත්හිටුවීම, අවසන් කිරීම, ඉවත්වීම, ඒකාබද්ධ කිරීම හෝ එක් සහභාගිවන්නෙකු විසින් වෙනත් සහභාගිවන්නෙකු අත්පත් කර ගැනීම පිළිබඳ බැඳීම් ..... 12A
     - 2.13.3 පැහැදිලි කිරීම සහ නිවැරදි කිරීම ..... 13A
   - 2.14 පද්ධති කාර්යයන් සඳහා ප්‍රවේශය ..... 13A
   - 2.15 මැන්ඩේට් ගිවිසුම හෝ SWIFT සමඟ නොගැලපීම ..... 13A

2.16 සහභාගිවන්නන් සඳහා SWIFT ප්‍රලේඛනය ........ 13A

2.17 පද්ධති රීති තාවකාලිකව අත්හිටුවීම ........ !3A

2.18 තෙවන පාර්ශවයන්ට පැවරීම ........ 13A

2.19 රහස්‍යභාවය ........ 13A

**3. වගකීම් අත්හැරීම සහ සීමා කිරීම ........** 14A

3.1 අනුපාතික බලපෑම ........ 14A

3.2 වගකීම් සීමාව ........ 14A

3.3 අනුෂාංගික හානි ........ 15A

3.4 වන්දි පූර්ණය ........ 15A

3.5 බුන්වත්වීමේදී ශුද්ධ අගය ගණනය කිරීම ........ 15A

## 1. පද්ධති විශ්ලේෂණ

ලංකාසෙට්ල් පද්ධතියෙහි අයිතිය සහ මෙයෙවීම ශ්‍රී ලංකා මහ බැංකුව සතු වන අතර එය උප පද්ධති දෙකකින් සමන්විත වේ. එනම්
- තත්කාලීන දළ පියවීම් (RTGS) පද්ධතිය සහ
- ලංකාසෙක්‍යූ පද්ධතිය (LankaSecure)

තත්කාලීන දළ පියවීම් පද්ධතිය තත්කාලීන දළ පියවීම් මූලධර්මය භාවිතයෙන් සහභාගිවන්නන්ගේ ගිණුම් වල අරමුදල් හුවමාරු කිරීම සහ පියවීම සිදු කරනු ලබයි. එම සහභාගිවන්නන්ගේ ගනුදෙනුකරුවන් සිදු කරනු ලබන ගෙවීම් ද මෙම පියවීම් වලට ඇතුළත් වේ. ලංකාසෙක්‍යූ පද්ධතිය, රජයේ ණය සුරැකුම්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්ලේඛන ආකාරයෙන් නිකුත් කර ඇති සුරැකුම් පත් වල අයිතිය ඉලෙක්ට්‍රොනිකව ගබඩා කෙරෙන නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතියෙන් (SSSS) සහ මධ්‍යම තැන්පතු පද්ධතියෙන් (CDS) සමන්විත වේ. සුරැකුම්පත් වල අයිතිය පැවරීම සහ ඒ යටතේ අරමුදල් හුවමාරු කොට නිශ්කාෂණය කිරීම එකවර තත්කාලීනව සිදු කිරීම සඳහා වන බෙදාහැරීමට එදිරිව ගෙවීම් (DVP) යාන්ත්‍රණය භාවිතා කර ලංකාසෙට්ල් පද්ධතිය සුරැකුම්පත් ගනුදෙනු සිදු කරයි.

### 1.1 තත්කාලීන දළ පියවීම් පද්ධතිය

#### 1.1.1. තත්කාලීන දළ පියවීම් පදනම මත ගෙවීම් පියවීම

තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් ගනුදෙනු තනි තනි වශයෙන් හා තත්කාලීනව එම ගනුදෙනු පද්ධතියට ඇතුළත් කළ අවස්ථාවේදී සිදු කරනු ලබයි. ගෙවීම් සිදු කරනු ලබන ආයතනයෙහි පියවීම් ගිණුමෙහි සම්පූර්ණ ගනුදෙනුව සිදුකිරීමට ප්‍රමාණවත් අරමුදල් පවතී නම්, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන ආදායකයාගේ ගිණුමට ගෙවීම් සිදුකරන්නාගේ ගිණුමෙන් අදාළ වටිනාකම මාරු කිරීමෙන් පියවීම එසැනින්ම සිදු කරනු ලබයි. පියවීමක් පද්ධතියෙහි සටහන් කල විට, පියවීම අවසන් වන අතර, එය අහෝසි කළ නොහැකි වේ. කෙසේ නමුත්, අරමුදල් ප්‍රමාණවත් නොවන්නේ නම්, ගෙවීම් සිදු කරනු ලබන ආයතනයෙහි ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් එක්රැස් වන තෙක් ගෙවීම් උපදෙස් පෙළගස්වා ගබඩා කරනු ලබයි.

#### 1.1.2 ශුද්ධ පදනම මත ගෙවීම් පියවීම

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සියළුම ගනුදෙනු තත්කාලීන දළ පියවීම් මූලධර්මයන්ට යටත් විය යුතු නොවේ. පද්ධතියෙහි දළ පියවීම්, වටිනාකමින් අඩු, ප්‍රමාණයෙන් වැඩි ගෙවීම් වර්ග වල හුවමාරුව නිසා ඇති වන බැඳීම් වල ප්‍රමාද වූ ශුද්ධ පියවීම් හා සමව පවතී (උදා - චෙක්පත් සහ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා සිදු කෙරෙන අඩු වටිනාකමින් යුත් ඉලෙක්ට්‍රොනික ගෙවීම් සහ අනෙකුත් සුළු පරිමාණ ඉලෙක්ට්‍රොනික ගෙවීම් යාන්ත්‍රණ). මෙම සහභාගිවන්නන්ගේ වගකීම් වල පසු නිශ්කාෂණ පියවීම්, ගොනු වශයෙන් කලින් කලට ලංකාසෙට්ල් පද්ධතියෙහි බහු පාර්ශවීය ශුද්ධ පියවීම් ක්‍රමය මගින් සිදු කරයි.

### 1.2 ලංකාසෙක්‍යූ පද්ධතිය - නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය (SSSS) සහ මධ්‍යම තැන්පතු පද්ධතිය (CDS)

ලංකාසෙක්‍යූ පද්ධතිය පහත සඳහන් පහසුකම් සලසනු ලබයි.

- නිර්ලේඛන ලෙස නිකුත් කරනු ලබන රජයේ ණය සුරැකුම්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන සුරැකුම්පත් රඳවා තබා ගැනීමට විද්‍යුත් තැන්පතුවක්;
- සුරැකුම්පත්වල හිමිකම සහ තනි තනි අයෝජකයන්ගේ ගිණුම්වල ශේෂයන් සටහන් කිරීම සඳහා මධ්‍යම ලේඛනයක්;
- නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනු සඳහා තත්කාලීන බෙදාහැරීමට එදිරිව ගෙවීම් පදනම මත පියවීමේ යාන්ත්‍රණයක්;
- ගිණුම අතර අදාල අරමුදල් හුවමාරුවක් නොමැතිව (නිදහස් බෙදා හැරීම් හා නිදහස් ලැබීම) සුරැකුම්පත් හුවමාරුවක් සහ සහභාගිකරුවන්ගේ ගිණුම් අතර සුරැකුම්පත් හුවමාරු කිරීම (ප්‍රතිස්ථානය) සඳහා යාන්ත්‍රණයක්; සහ
- පද්ධතිය තුළ ද්‍රවශීලතාව පවත්වා ගැනීමට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම (ILF) සැපයුම සඳහා ඇපකර වෙන් කිරීමේ යාන්ත්‍රණයක්.

### 1.3 පද්ධති සංරචක

ලංකාසෙට්ල් පද්ධතිය පහත සංරචක මගින් මෙහෙය වේ.

(i) සහභාගිවන්නන්ගේ පිරික්සුම් වැඩබිම (Browser Workstation)
(ii) ශ්‍රී ලංකා මහ බැංකුවේ පිරික්සුම් වැඩබිම

(iii) SWIFT FIN-Y පිටපත් සේවාව සහ FIN ජාලය ඇතුළත්ව SWIFT Net


(iv) ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිවන්නන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සම්බන්ධ කෙරෙන CBSLNet

(v) ලංකාක්ලියර් පුද්ගලික සමාගම මගින් බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු සැකසුම සඳහා වන සබැඳිය (ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධති (SLIPS), චෙක්පත් නිශ්කාෂණය සහ අනෙකුත් සුළු පරිමාණ ඉලෙක්ට්‍රොනික ගෙවීම්) සහ

(vi) රජයේ ණය සුරැකුම්පත් පිළිබඳව අන්තර්ජාලය මගින් විමසීමේ පාරිභෝගික පහසුකම

පහත රූප සටහන මගින් පද්ධතිය සහ එහි සංරචක පිළිබඳ විශ්ලේෂණයක් දැක්වේ. පද්ධති සංරචකවල කාර්යයන් වැඩි විස්තර සහිතව 2 හා 3 වෙළුමෙහි විස්තර කර ඇත.

රූපසටහන 1 : ලංකා සෙට්ල් පද්ධති විශ්ලේෂණය



## 2. සාමාන්‍ය විධි විධාන

### 2.1 අර්ථ නිරූපණය

මෙම පද්ධති නීතිරීති වල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස;

**"ප්‍රවේශන ගිවිසුම"** යන්නෙන් අදහස් කරන්නේ සහභාගිවන්නෙකු සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති ගිවිසුමය.

**"ගිණුම්"** යන්නෙන් අදහස් කරන්නේ පියවීම් ගිණුම සහ සුරැකුම් පත් ගිණුම්ය.

**"ගිණුම් පැවරීම"** යන්නෙන් අදහස් කරන්නේ පියවීම් ගිණුම් පැවරීම් සහ/හෝ සුරැකුම්පත් ගිණුම් පැවරීම්ය.

**"ගිණුම් වර්ග"** යන්නෙන් අදහස් කරන්නේ ලංකාසෙක්‍යු පද්ධතියේ සහභාගිවන්නන් හෝ සහභාගිවන්නන්ගේ කාණ්ඩ විසින් නියෝග සහ පද්ධති නීතිරීතිවලට අනුකූලව පවත්වාගෙන යායුතු විවිධ වර්ගයේ සුරැකුම් පත් ගිණුම්ය.

**"උපස්ථ පහසුකම්"** යන්නෙන් අදහස් කරන්නේ පද්ධති නීතිරීති වලට අනුකූලව සෙවුම් (Browser) අතුරු මුහුණතෙහි හෝ ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු සංසද (SWIFT) අතුරු මුහුණතෙහි හෝ එහි කිසියම් කොටසක හෝ ඇණහිටීමක් හෝ බිඳ වැටීමක් හෝ වෙනත් ගැටළුකාරී අවස්ථාවකදී ක්‍රියා කිරීම සඳහා සහභාගිවන්නෙකු විසින් පවත්වාගෙන යා යුතු පද්ධති සහ ක්‍රියාපටිපාටීන්ය.

**"ගනුදෙනුකාර සෘජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් ප්‍රතිලාභ හිමිකරු හෝ පාරිභෝගිකයෙකු"** යන්නෙන් අදහස් කරන්නේ ගනුදෙනුකාර සෘජු සහභාගිවන්නෙකු මාර්ගයෙන් නිර්ලේඛන බිල්පත් බැඳුම්කර හෝ ඒ හා සම්බන්ධ අයිතියක් මිළදී ගැනීම, විකිණීම හෝ වෙනයම් ආකාරයකින් අත්පත් කර ගැනීම හෝ අතහැර දැමීම කරන පුද්ගලයකු හෝ ඉදිරියේදී විය හැකි භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර හෝ ඒ සම්බන්ධ අයිතියක් අත්පත් කර ගැනීමක් හෝ අතහැර දැමීමක් පිළිබඳ ගනුදෙනුකාර සෘජු සහභාගිවන්නකු සමඟ ප්‍රමාන්ත්‍රණය කරන පුද්ගලයකු අදහස් වන අතර සන්දර්භය එසේ ඉඩදෙන තැන එකී ගනුදෙනුකරුගේ හෝ ඔහුගේ වත්කම සම්බන්ධ නියෝජිතයකු ද ඇතුළත් විය යුතුය.

**"ව්‍යාපාරික දිනය"** යන්නෙන් අදහස් කරන්නේ ලංකාසෙට්ල් පද්ධතිය හරහා ගනුදෙනු පියවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විවෘතව තැබෙන දිනයයි.

**"ශ්‍රී ලංකා මහ බැංකුව"** යන්නෙන් අදහස් කරන්නේ 1949 අංක 58 දරණ මුදල් නීති පනත යටතේ ස්ථාපිත මුදල් මණ්ඩලයයි.

**"මහ බැංකු සුරැකුම්පත්"** යන්නෙන් අදහස් කරන්නේ 1949 අංක 58 දරණ මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සුරැකුම්පත්ය.

**"සීබීඑස්එල්නෙට් (CBSLNet)"** යන්නෙන් අදහස් කරන්නේ ලංකාසෙට්ල් පද්ධතියේ සියළුම සහභාගිකරුවන් සම්බන්ධ කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවා ගත් දත්ත සන්නිවේදන ජාලයයි.

**"ගනුදෙනුකරු"** යන්නෙන් ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතෙහි හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතෙහි පවරා ඇති අර්ථය අදහස් වේ.

**"අලෙවිකාර සෘජු සහභාගිකරුවකු"** යන්නෙන් අදහස් කරන්නේ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතෙහි සඳහන් පරිදි අලෙවිකාර සෘජු සහභාගිවන්නෙකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද සෘජු සහභාගිකරුවකුය.

**"භාරදීමට එරෙහිව ගෙවීම්"** යන්නෙන් අදහස් කරන්නේ ගෙවීම සිදු කලහොත් පමණක්ම බෙදාහැරීම සිදු කිරීම තහවුරු කරන, නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය (සුරැකුම්පත් පැවරීමේ පද්ධතිය) සහ තත්කාලීන දළ පියවීමේ පද්ධතිය (අරමුදල් පැවරීමේ පද්ධතිය) අතර වන සම්බන්ධය වේ.

**"නිළ ලත් අලෙවිකරුවෙකු නොවන ලංසු තබන්නා"** යන්නෙන් අදහස් කරන්නේ ප්‍රාථමික වෙන්දේසියට සහභාගී වීම සඳහා ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද, එහෙත් තම ගිණුම වෙනුවෙන් පමණක් සුරැකුම්පත් රඳවා තබා ගැනීමට සහ ගනුදෙනු කිරීමට හැකි පුද්ගලයාය.

**"සෘජු සහාගිකරුවෙකු"** යන්නෙන් අදහස් කරන්නේ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සෘජු සහභාගිකරුවෙකු ලෙස පත් කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු හෝ වෙනත් පුද්ගලයෙකුය.

**"ආරවුල"** යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගිකරුවෙකු අතර මෙම රීති අනුසාරයෙන් පැන නගින්නා වූ හෝ ඒ හා සම්බන්ධ වූ හෝ අසම්මුතියක් වුවද, ශ්‍රී ලංකා මහ බැංකුවට යම් සහභාගිවන්නෙකුගේ අධීක්ෂක හෝ නියාමක තත්වයෙන් කටයුතු කරමින් කිසියම් වූ ලිඛිත නීතියක් ප්‍රකාර එයට හිමි බලයක්, අධිකාරියක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම, ඒ අනුව කටයුතු කිරීම හෝ එසේ කිරීමේ අභිප්‍රාය දැක්වීම හේතුකොට ගෙන පැන නගින්නා වූ ආරවුලක් හෝ කාරණයක් මෙයට ඇතුලත් නොවිය යුතු වේ.

**"අවසන් කඩඉම් වේලාව"** යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂයෙන් සඳහන් කර නොමැති විටදී මෙම රීතිවල 4 වන වෙළුමෙහි 1.2 වන රීතියේ දෛනික මෙහෙයුම් කාලසටහනේ ලංකා සෙට්ල් පද්ධතියෙහි ව්‍යාපාර කටයුතු අවසන් කිරීම සඳහා නියම කර ඇති කාලයයි.

**"රාජ්‍ය සුරැකුම්පත්"** යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරය.

**"Gridlock"** යන්නෙන් අදහස් කරන්නේ සහභාගිකරුවෙකුගේ විධානයක් ක්‍රියාත්මක කිරීම ඇණහිටීම නිසා (ප්‍රමාණවත් තරම් අරමුදල් හෝ සුරැකුම්පත් අදාල ගිණුමෙහි නොමැති වීම හේතුවෙන්) තවත් සහභාගිකරුවෙකුගේ හෝ සහභාගිකරුවන්ගේ හෝ එම සහභාගිවන්නාගේම විධානයක් ක්‍රියාත්මක කිරීම වළක්වන ලෙසට ලංකාසෙට්ල් පද්ධතිය තුළ උද්ගතව විය හැකි තත්වයකි.

**"උපදෙස්"** යන්නෙන් අදහස් කරන්නේ ගෙවීම් උපදෙස් හෝ සුරැකුම්පත් පැවරීමේ උපදෙස්ය.

**"එක්දින ද්‍රවශීලතා පහසුකම"** යන්නෙන් අදහස් කරන්නේ එක් දින ද්‍රවශීලතා පහසුකම් ලබාදීමේ ගිවිසුමට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිවන්නෙකුට අරමුදල් සැපයීමයි.

**"එක්දින ද්‍රවශීලතා පහසුකම ලබාදීමේ ගිවිසුම"** යන්නෙන් අදහස් කරන්නේ සහභාගිකරුවෙකු හා ශ්‍රී ලංකා මහ බැංකුව අතර ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කර ඇති ගිවිසුමය.

**"ලංකාසෙක්‍යු පද්ධතිය"** යන්නෙන් අදහස් කරන්නේ මුදල් නීතිපනත අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාපනය කර ඇති නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය සහ මධ්‍යම තැන්පතු පද්ධතියයි.

**"ලංකාසෙට්ල් පද්ධතිය"** යන්නෙන් අදහස් කරන්නේ මුදල් නීති පනත අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාපනය කර ඇති තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙක්‍යු පද්ධතියයි.

**"බලපත්‍රලාභී වාණිජ බැංකුව"** යන්නෙන් අදහස් කරන්නේ වරින් වර සංශෝධනය කරන ලද 1988 අංක 30 දරණ බැංකු පනතින් දක්වා ඇති පරිදි බැංකු කටයුතු සිදු කිරීමට බලපත්‍ර ලබා දී ඇති බැංකුවය.

**"බලපත්‍රලාභී විශේෂිත බැංකුව"** යන්නෙන් අදහස් කරන්නේ වරින් වර සංශෝධනය කරන ලද 1988 අංක 30 දරණ බැංකු පනතින් දක්වා ඇති පරිදි තැන්පතු මුදල් භාර ගැනීම, ආයෝජනය කිරීම සහ එම මුදල් ණයට ලබා දීමේ කටයුතු සිදු කිරීමට බලපත්‍ර ලබා දී ඇති සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක්ය.

**"දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත"** යන්නෙන් අදහස් කරන්නේ වරින් වර සංශෝධනය කරන ලද 1923 හි අංක 08 දරණ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතයි.

**"මැන්ඩේට් ගිවිසුම (Mandate Agreement)"** යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවෙකුගේ පියවීම් ගිණුම සහ සුරැකුම්පත් ගිණුම පවත්වාගෙන යාම සහ මෙහෙයුම් කටයුතු කිරීමට අදාලව සහභාගිකරුවකු සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර එළඹෙන ගිවිසුමයි.

**"ගැළපීම"** යන්නෙන් අදහස් කරන්නේ ගනුදෙනුවකට අදාල වන කොන්දේසි සඳහා අදාළ පාර්ශවයන්ගේ එකඟතාව තහවුරු කිරීම වෙනුවෙන් එම පාර්ශවයන් විසින් පද්ධතියට ඇතුළත් කර ඇති උපදෙස්වල වෙළඳ/ පියවීම් දත්ත සැසඳීමේ ක්‍රියාවලියයි.

**"අවම ශේෂ අවශ්‍යතාව"** යන්නෙන් අදහස් කරන්නේ අදාළ විටදී පද්ධති නීති රීති වලට අනුකූලව සහභාගිවන්නෙකු විසින් සෑම අවස්ථාවකදීම තම පියවීම් ගිණුමෙහි පවත්වාගත යුතු අවම ශේෂයයි.

**"මුදල් මණ්ඩලය"** යන්නෙන් අදහස් කරන්නේ මුදල් නීති පනත යටතේ ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයයි.

**"මුදල් නීති පනත"** යන්නෙන් අදහස් කරන්නේ වරින් වර සංශෝධනය කරන ලද 1949 අංක 58 දරණ මුදල් නීති පනතයි.

**"බහු පාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව" හෝ ''ශුද්ධ පියවීම් ගොනුව"** යන්නෙන් අදහස් කරන්නේ පද්ධති නීතිරීති වල සඳහන් පරිදි ශුද්ධ පියවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලද (ගෙවීම් නිෂ්කාෂණය කිරීමේදී පද්ධතියේ උපචාරයක් හේතුවෙන් හට ගන්නා) බහුවිධ හර සහ බැර සම්බන්ධ පියවීම් ගිණුම පැවරීමක්ය.

**"විවට වෙළඳපල කටයුතු"** යන්නෙන් අදහස් කරන්නේ මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයේ V වන කොටස යටතේ සිදු කරනු ලබන ගනුදෙනුය.

**"නිළ මිල ගණන්"** යන්නෙන් අදහස් කරන්නේ දිනය ඇතුළත ද්‍රවශීලතා පහසුකම සඳහා පිරිනමන ලද සුරැකුම්පත් වටිනාකම නියම කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දෛනික පදනම යටතේ නියම කරන ලද සහ ලංකාසෙක්‍යු පද්ධතියේ සටහන් කරනු ලබන මිල ගණන්ය.

**"ගෙවීම් උපදෙස්"** යන්නෙන් අදහස් කරන්නේ පද්ධති නීතිරීති වල දැක්වෙන ආකාරයෙන් සහභාගිකරුවෙකු විසින් තමාගේ පියවීම් ගිණුම හර කිරීමට සහ ලංකාසෙට්ල් පද්ධතියේ වෙනත් සාමාජිකයෙකුගේ පියවීම් ගිණුම බැර කිරීම සඳහා දෙනු ලබන උපදෙස්ය.

**"සහභාගිකරුවා"** යන්නෙන් අදහස් කරන්නේ ප්‍රවේශ ගිවිසුමකට එළඹීම මගින් ලංකාසෙට්ල් පද්ධතියට සහභාගිවීමට බලය ලත් ආයතනයක්ය.

**"ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයා"** යන්නට 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත හෝ එය ප්‍රතිස්ථාපනය කරන ලද වෙනත් පනතක් මගින් කර ඇති අර්ථ නිරූපණය යොදාගැනේ.

**"ශ්‍රී ලංකාවේ අනේවාසික පුද්ගලයා"** යන්නට 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත හෝ එය ප්‍රතිස්ථාපනය කරන ලද වෙනත් පනතක් මගින් කර ඇති අර්ථ නිරූපණය යොදා ගැනේ.

**"ඔඩපනය"** යන්නට රෙගුලාසි වල ඇති අර්ථ නිරූපණය යොදා ගැනේ.

**"ප්‍රාථමික වෙන්දේසිය"** යන්නෙන් අදහස් කරන්නේ රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවීමට එදිරිව ප්‍රාථමික අලෙවිකරුවන්ට සහ නම් කරන ලද අලෙවිකරුවන් නොවන ලංසු තබන්නන්ට නිර්ලේඛන සුරැකුම්පත් මුලිකව වෙන් කිරීම සහ නිකුත් කිරීමයි.

**"ප්‍රාථමික අලෙවිකරු"** යන්නෙන් අදහස් කරන්නේ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ ප්‍රාථමික වෙන්දේසිවලට සහභාගි වීමට සහ තමන් වෙනුවෙන් සහ අන් අය වෙනුවෙන් නිර්ලේඛන සුරැකුම්පත් රඳවා තබා ගැනිමට සහ ගනුදෙනු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස පත්කර ඇති ආයතනයක්වේ.

**"තත්කාලීන දළ පියවීම් (RTGS)"** යන්නෙන් අදහස් කරන්නේ දළ පදනම මත තත්කාලීනව, ගෙවීම් සම්බන්ධ වගකීම් ක්‍රියාත්මක කිරීම සහ පියවීමයි.

**"ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත"** යන්නෙන් අදහස් කරන්නේ වරින් වර සංශෝධනය කරන ලද 1937 අංක 7 දරණ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත වේ.

**"රෙගුලාසි"** යන්නෙන් අදහස් කරන්නේ ලංකාසෙට්ල් පද්ධතිය සහ එහි මෙහෙයුම් කටයුතු වලට අදාලව මුදල් නීති පනත, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ පනවා ඇති රෙගුලාසි වේ.

**"ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම (REPO)"** යන්නෙන් අදහස් කරන්නේ එකඟ වූ දිනයකදී, එකඟ වූ කොන්දේසි මත නැවත එම සුරැකුම්පත් මිලදී ගැනීමේ පොරොන්දුව පිට එක් පාර්ශවයක් විසින් වෙනත් පාර්ශවයකට නිර්ලේඛන සුරැකුම්පත් විකිණීමට එකඟ වන ගිවිසුමය.

**"ප්‍රතිවිකුණුම් ගිවිසුම (Reverse Repo)"** යන්නෙන් අදහස් කරන්නේ එකඟ වූ දිනයකදී, එකඟ වූ කොන්දේසි මත නැවත එම සුරැකුම්පත් විකිණීමේ පොරොන්දුව පිට එක් පාර්ශවයක් විසින් වෙනත් පාර්ශවයකගෙන් නිර්ලේඛන සුරැකුම්පත් මිලදී ගැනීමට එකඟ වන ගිවිසුමය.

**"නිර්ලේඛන සුරැකුම්පත්"** යන්නෙන් අදහස් කරන්නේ පිළිවෙලින් දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත්, ආඥාපනත යටතේ නිකුත් කරන ලද නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් සහ නිර්ලේඛන භාණ්ඩාගාර බැඳුම්කර සහ මුදල් නීති පනත යටතේ නිර්ලේඛන ආකාරයෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්ය.

**"නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත්"** යන්නෙන් අදහස් කරන්නේ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිර්ලේඛන ආකාරයෙන් නිකුත් කර ඇති භාණ්ඩාගර බිල්පත්ය.

**"නිර්ලේඛන භාණ්ඩාගාර බැඳුම්කර"** යන්නෙන් අදහස් කරන්නේ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිර්ලේඛන ආකාරයෙන් නිකුත් කර ඇති භාණ්ඩාගාර බැඳුම්කරය.

**"සුරැකුම්පත් ගිණුම"** යන්නෙන් අදහස් කරන්නේ රෙගුලාසි සහ පද්ධති නීතිරීති වලට අනුකූලව ඍජු සහභාගිකරුවෙක් විසින් එකී ඍජු සහභාගිකරුගේද, එම ඍජු සහභාගිකරු ඔහුගේ ගනුදෙනු කරුවන්ගේ ඍජු අලෙවි සහභාගිකරුවෙක් නම්, ඔවුන්ගේද නිර්ලේඛන සුරැකුම්පත් වල හිමිකම සහ වෙනත් තොරතුරු සටහන් කර තැබීම වෙනුවෙන් ලංකාසෙක්‍යු පද්ධතියේ පවත්වාගෙන යන ගිණුම් ය.

**"සුරැකුම්පත් ගිණුම පැවරීම"** යන්නෙන් අදහස් කරන්නේ සහභාගිකරුවන් දෙදෙනෙකුගේ සුරැකුම්පත් ගිණුම් හර කිරීම හා බැර කිරීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලද සහභාගිකරුවකුගේ සුරැකුම්පත් ගිණුම් දෙකක් අතර සුරැකුම්පත් පැවරීමය.

**"සුරැකුම්පත් පැවරීමේ උපදේශ"** යන්නෙන් අදහස් කරන්නේ පද්ධති නීතිරීති වල දක්වා ඇති පරිදි ලංකාසෙක්‍යු පද්ධතියේ සහභාගිකරුවන් දෙදෙනෙකු විසින් නිශ්චිත වූ සුරැකුම්පත් ගිණුමකින් වෙනත් නිශ්චිත වූ සුරැකුම්පත් ගිණුමකට නිශ්චිත වූ නිර්ලේඛන සුරැකුම්පත් පැවරීම හෝ සහභාගිකරුවෙකුගේ සුරැකුම්පත් ගිණුම් අතර නිශ්චිත නිර්ලේඛන සුරැකුම්පත් නැවත ස්ථානගත කිරීමට ලබාදෙන උපදෙසකි.

**"පියවීම"** යන්නෙන් අදහස් කරන්නේ ගෙවීම් උපදෙස් වල, පියවීම් ගිණුම් පැවරීම් වල, සුරැකුම්පත් පැවරීම් උපදෙස් වල හෝ සුරැකුම්පත් ගිණුම් පැවරීම් වල හර සහ බැර වටිනාකම් සාර්ථක ලෙස අදාල ගිණුම් වලට පිටපත් කිරීම.

**"පියවීම් ගිණුම"** යන්නෙන් අදහස් කරන්නේ තැන්පතු සංචිත පවත්වාගැනීමට, ගෙවීම් නිශ්කාෂණය කිරීමට සහ සහභාගිවන්නන් අතර ශේෂයන් පියවීමට සහ සහභාගිවන්නන් අතර නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනු වල ගෙවීම් පියවීමට හෝ සහභාගිවන්නෙකුට අදාළ එවැනි වෙනයම් අරමුණක් උදෙසා හෝ මුදල් නීති පනතට අනුකූලව සහභාගිකරුවකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන ගිණුමකි.

**"පියවීම් ගිණුම පැවරීම"** යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවන් දෙදෙනෙකුගේ පියවීම් ගිණුම් හර කිරීම සහ බැර කිරීමය.

**"පද්ධති රීතීන්"** යන්නෙන් අදහස් කරන්නේ මුදල් නීති පනතට අනුව නිකුත් කර ඇති කලින් කලට සංශෝධනය විය හැකි රීතීන් වේ.

**"ස්විෆ්ට් (SWIFT)"** යන්නෙන් අදහස් කරන්නේ ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමයයි.

**"ස්විෆ්ට් අතුරු මුහුණත"** යන්නෙන් අදහස් කරන්නේ සහභාගිකරුවෙකු විසින් ලංකාසෙටල් පද්ධතියට ගෙවීම් විධිවිධාන සහ සුරැකුම්පත් විධිවිධාන ප්‍රේෂණය කිරීම සඳහා යොදා ගනු ලබන පරිඝණක පාදක පර්යන්තයයි.

**"තක්සේරු දිනය"** යන්නෙන් අදහස් කරන්නේ ගනුදෙනුවක පියවීම බලපැවැත්වෙන දිනයයි.
මෙම පද්ධති නීතිරීති වල

(අ) ස්ත්‍රී/ පුරුෂ එක් පාර්ශවයක් පමණක් දැක්වෙන වචන අනික් පාර්ශවයද නියෝජනය කරයි.

(ආ) බහු වචන සංඛ්‍යා සඳහා ඒකවචන ඇතුලත් වන අතර, ප්‍රතිලෝම ද වේ.

(ඇ) පරිශීලනයේ පහසුව සඳහා මාතෘකා යොදා ඇති අතර, එමගින් මෙම රීති වල අර්ථ නිරූපනය වෙනස් නොවේ.

(ඈ) ඕනෑම නීතියකට යොමු කිරීමට අදාළව එම නීතියට අනුව සාදන ලද හෝ නිකුත් කරන ලද කවර හෝ ව්‍යවස්ථාපිත රෙගුලාසි, රීති, නියෝග හෝ මෙවලම් සහ එම නීතිය යළි ස්ථාපිත කිරීම හෝ ආදේශ කිරීම හෝ සංශෝධන කිරීම ද ඇතුලත් වේ.

**2.2 පද්ධති රීති සම්පාදනය**

මුදල් නීති පනතේ සංශෝධනයන්ට අනුකූලව මෙම පද්ධති රීති නිකුත් කරනු ලැබේ.

**2.3 පද්ධති රීති වල අරමුණු**

(අ) ලංකාසෙටල් පද්ධතියේ ගෙවීම් හා පියවීම් වලට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගිකරුවන් අතර නීතිමය සබඳතාව ; සහ

(ආ) ගිණුම් හිමියන් ලෙස සහභාගිකරුවන් සහ පියවීම් නියෝජිතයා සහ පද්ධතියේ මෙහෙයුම්කරුවන් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව අතර වන ව්‍යාපාරික මට්ටමේ අන්තර් ක්‍රියා නියාමනය කිරීම, පද්ධති රීතීන් වල අරමුණ වේ.

**2.4 පද්ධති රීති සඳහා වන සංශෝධන**

ශ්‍රී ලංකා මහ බැංකුව කලින් කලට පද්ධති රීති වල අන්තර්ගතය වෙනස් කිරීම, නව රීතින් එක් කිරීම හෝ පවතින රීති ඉවත් කිරීම සිදු කරන අතර සහභාගිකරුවන් එම සංශෝධිත රීති අනුගමනය කිරීමට බැඳී සිටී.

පද්ධති රීති වෙනස් කිරීම සඳහා සහභාගිකරුවන්ට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යෝජනා ඉදිරිපත් කළ හැකි අතර එම යෝජනාවල අරමුණ සහ එමගින් ඇතිවන ප්‍රතිලාභ පිළිබඳව සවිස්තරාත්මකව ලිඛිතව දැන්විය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව එවැනි යොජනා සලකා බලන නමුත් එවැනි ක්‍රියාවලි හෝ පද්ධති වෙනසක් ක්‍රියාත්මක කිරීමේ පූර්ණ අභිමතය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කොට ඇති යෝජිත සංශෝධනයන් සහ නව එක් කිරීම් සහභාගිවන්නන් වෙත දැනුම් දෙනු ලැබේ. එම සංශෝධන බලාත්මක වීමට අවම වශයෙන් දින 30 කට පෙර එවැනි දැනුම් දීම් සහභාගිවන්නන් වෙත යවනු ලැබේ. කෙසේ වෙතත්, පහත දැක්වෙන අවස්ථාවන්හිදී දින 30 කට අඩු කාලයකදී එම දැනුම්දීම් සහභාගිවන්නන් වෙත යවනු ලැබේ.

- නීතිය ක්‍රියාත්මක කිරීම හෝ අධිකරණමය තීරණයක් හෝ තීන්දුවක් මගින් අදාළ සංශෝධනය හෝ නව එක්කිරීම සිදු කර ඇති විටකදී;
  සහ
- විශේෂ හේතුන් පවතින බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලකනු ලබන විටදී.

**2.5 භාෂාමය අනුවාද**

පද්ධති රීතින් භාෂා තුනෙන්ම ලබා ගත හැක.

**2.6 පද්ධතියේ සහභාගිවන්නෙකු වීමට තිබිය යුතු සුදුසුකම්**

පහත කාණ්ඩයන්ට අයත් ආයතන සහභාගිවන්නන් වීමට සුදුසුකම් ලබයි.

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු

(ඇ) ප්‍රාථමික අලෙවිකරුවන්

(ඈ) ඍජු සහභාගිකරුවන් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත සහ දේශිය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ පත් කර ඇති පාර්ශව

**2.7 ලංකාසෙට්ල් පද්ධතිය තුළ සහභාගිත්වය**

සුදුසුකම්ලත් ආයතනයක් විසින් අදාළ ලිපි ලේඛන සහ තොරතුරු සමඟ ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිත්වය සඳහා විධිමත් ඉල්ලීමක් අධ්‍යක්ෂක, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01 වෙත යොමු කළ යුතුය.

ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිකරුවකු වීමට යම් ආයතනයක් එහි නිත්‍ය පදිංචිය හෝ ශාඛාවක් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යා යුතුය. ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිකරුවන්ගේ ගෙවීම් වල පියවීම් සිදු කිරීම සඳහා ඔවුන්ව තනි ස්ථරයේ සාමාජික ව්‍යුහයක් යටතේ ලංකාසෙට්ල් පද්ධතියට ඍජුවම සම්බන්ධ කොට ඇත.

යම් ආයතනයක් ලංකාසෙට්ල් පද්ධතියට සහභාගිවීමට අයදුම් කල පසු, එම අයදුම සලකා බලා අදාළ ආයතනය ලංකාසෙට්ල් පද්ධතියට සහභාගි වීමට සුදුසු බව ආදර්ශනය කිරීමෙන් අනතුරුව සහභාගිත්වය පිළිගනු ලබන අතර, මෙම වෙළුමෙහි 2.8 නීතියේ (උ) අයිතමයේ සඳහන් වන ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ගිවිසුම අත්සන් කිරීමෙන්, එම ආයතනය පද්ධති නීති අනුගමනය කිරීමට බැඳී සිටී.

**2.8 සහභාගිකරුවෙකු වීමට පූර්ව අවශ්‍යතාවයන්**

ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිකරුවකු ලෙස පිළිගැනීමට සුදුසුකම් ලත් ආයතනයක් විසින් පහත දැක්වෙන පූර්ව අවශ්‍යතා සපුරාලිය යුතුය.

(අ) වලංගු නීතිමය තත්වයක් සහ පද්ධති රීතින් මගින් ඇති වන වගකීම, බැඳීමක් සහිතව උපකල්පනය කිරීමේ හැකියාවක් පැවතීම;

(ආ) ආයතනය පිහිටා ඇති රටෙහි මෙම පද්ධති රීති වලංගු සහ බලාත්මක කල හැකි බවට එකඟ වීම;

(ඇ) ලංකාසෙට්ල් පද්ධතියට ගෙවීම් තොරතුරු සම්ප්‍රේෂණය කිරීම සඳහා ස්විෆ්ට් (SWIFT) පහසුකමට ප්‍රවේශ වීමට ඇති හැකියාව;

(ඈ) සීබීඑස්එල්-නෙට් (CBSLNet) සඳහා ප්‍රවේශය;

(ඉ) පරීක්ෂණ පද්ධතියට සහභාගිවීම තුළින් අදාළ ආයතනයෙහි මෙහෙයුම් කාර්ය මණ්ඩලයට ලංකාසෙට්ල් පද්ධතියට සහභාගි වීම සඳහා අවශ්‍ය මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය දැනුම සහ නිපුණත්වය ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවට සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට ආදර්ශනය කර පෙන්වීම;

(ඊ) අවදානම් කළමණාකරණය, ආපදා ප්‍රතිපත්ති සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇතුළුව ආරක්ෂිත තාක්ෂණික පද්ධති සඳහා අවශ්‍ය පද්ධති සහ ක්‍රියාවලි අදාළ ආයතනය සතුව පවතින බවට ආදර්ශනය කිරීම;

(උ) ලංකාසෙට්ල් පද්ධතියට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ මැන්ඩේට් ගිවිසුම, ප්‍රවේශ ගිවිසුම සහ අනෙකුත් අදාල ගිවිසුම් (එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා දීමේ ගිවිසුම, ප්‍රධාන ප්‍රති මිලදී ගැනීම්, ප්‍රති විකුණුම් ගිවිසුම සහ ප්‍රධාන ස්ථාවර පහසුකම් ගිවිසුම) වලට ඇතුළත් වීම.

බලපත්‍රලාභී විශේෂිත බැංකු ඉහත (අ) සිට (උ) දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අමතරව **ඇමුණුම (අ)** යන්නෙහි සඳහන් අවශ්‍යතාවයන්ද පළමුව සපුරාලිය යුතුය.

### 2.9 අයදුම් ඇගයීම

ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගින්නෙකු වීමට අයදුම් කර ඇති ආයතනය පද්ධති නීතිරීති වල සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇතිදැයි ඇගයීමට, අදාළ ආයතනයෙහි වියදමින් ඕනෑම පරීක්ෂණයක් පැවැත්වීමට සහ පහත තොරතුරුද ඇතුළත්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවශ්‍යය යැයි සලකනු ලබන ලේඛන හෝ තොරතුරු ලබාගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පූර්ණ අයිතිය ඇත.

- ආයතනයේ නීතිමය තත්ත්වය සහ පද්ධති රීතීන් මගින් ඇතිවන වගකීම බැඳීමක් සහිතව උපකල්පනය කිරීමේ හැකියාව පිළිබඳව ප්‍රකාශයක්
- බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් නම්, ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු, අදාළ බැංකුව මෙම වෙළුමෙහි 2.8 නීතිය සමඟ සහ **ඇමුණුම (අ)** හි දැක්වෙන පරිදි පද්ධති නීතිරීති වලට අනුකූලව ක්‍රියා කිරීමට ඇති හැකියාව පිළිබඳ ඇගයීමක් සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලකා බලනු ලැබේ.
- ආයතනයෙහි මව් රටෙහි (අයදුම්කරනු ලබන ආයතනයෙහි ලියාපදිංචි කාර්යාලය විදේශයක නම්) නීතිරීති පිළිබඳව ප්‍රකාශයක් එම රට තුළ මෙම පද්ධති රීතීන්හි වලංගුභාවය සහ ඒවා බලාත්මක කිරීම සඳහා වැදගත් වේ (එම රටෙහි මතය).

### 2.10 තොරතුරු/ නිවේදන ලබාදීමේ යුතුකම

#### 2.10.1 සහභාගිවන්නන්ගේ මෙහෙයුම්වල වෙනස්වීම්

සහභාගී වන්නන්ගේ මෙහෙයුම්වල වෙනස් වීම් වල ප්‍රතිඵලයක් ලෙස, සහභාගිකරුගේ සුදුසුකම් තත්ත්වය හෝ ලංකාසෙට්ල් පද්ධතියේ කාර්යයන් මත සැලකිය යුතු බලපෑමක් ඇතිකළ හැකි මෙහෙයුම්වල යම් වෙනස්වීම් පිළිබඳව සහභාගිවන්නා විසින් ස්වේච්ඡාවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට දැනුම්දිය යුතුය.

#### 2.10.2 ගෙවීම් දාමයට බාධා ඇති කිරීම

සහභාගිකරුවකු වෙත ලංකාසෙට්ල් පද්ධතියේ ගෙවීම් දාමයට බාධා ඇති කෙරෙන ආකාරයේ යම් තොරතුරක් දැනගැනීමට ලැබුණු විටදී ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කිරීම සහභාගිකරුගේ යුතුකමකි. ශ්‍රී ලංකා මහ බැංකුව එවැනි තත්වයන් පිළිබඳව දැනගත් විගස හැකි ඉක්මනින් සහභාගිකරුවන්ට දැනුම් දිය යුතුය.

### 2.11 බලයලත් අත්සන්කරුවෝ

සෑම සහභාගිකරුවෙක්ම මෙම පද්ධති රීති අනුව අත්සන් කිරීමට සහ උපදෙස් ලබාදීමට, සන්නිවේදනයට සහ තහවුරු කිරීමට බලයලත් නිලධාරීන්ගේ නම් සහ අත්සන් සහිත ලැයිස්තුවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතු අතර එම ලැයිස්තුව සහ අත්සන් නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට වග බලා ගත යුතුය.

### 2.12 ගාස්තු සහ අය කිරීම්

#### 2.12.1 ගාස්තු සහ අයකිරීම් නිර්ණය කිරීම පිළිබඳ දැනුම් දීම

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනුදෙනු සඳහා වන ගාස්තු නිර්ණය කර නිවේදනය කිරීම වරින් වර කරනු ලබයි.
- සෑම සහභාගිවන්නෙකුම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගාස්තු ගෙවිය යුතුය.
- පිරිවැය ආවරණ මූලධර්මය මත පදනම්ව ගාස්තු නියම කරනු ලබන අතර විශාල වටිනාකම් සහිත ගෙවීම් පියවීම සඳහා ලංකාසෙට්ල් පද්ධතිය භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා තව දුරටත් සැලසුම් සකස් කර ඇත.

- ශ්‍රී ලංකා මහ බැංකුවට විශේෂ නියෝගයකින් ලංකාසෙට්ල් පද්ධතියේ වැඩිදියුණු කිරීම් හෝ නව සේවාවන් හඳුන්වා දීම සඳහා සහභාගිකරුවන්ගෙන් ගාස්තු අය කල හැක.

**2.12.2 ගාස්තු වෙනස්වීම් පිළිබඳ දැනුම් දීම**

නව ගාස්තු ක්‍රමය බල පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින 30 කට පෙර එම ගාස්තු වෙනස්වීම පිළිබඳව දැනුම් දීමක් සහභාගිකරුවන්ට යැවිය යුතුය.
කෙසේ වෙතත්,

(අ) එකී ගාස්තු සංශෝධනය නව නීති සම්පාදනය හෝ පවත්නා නීති සංශෝධනය හෝ අධිකරණ තීරණයක් හෝ තීන්දුවක් හේතුකොටගෙන සිදු කරනු ලබන සංශෝධනයක්; හා

(ආ) විශේෂ හේතුන් පවතින බවට ශ්‍රී ලංකා මහ බැංකුව සලකන අවස්ථාවන් හිදී ගාස්තු වෙනස්වීම පිළිබඳ දැනුම්දීම දින 30කට අඩු කාලයක් තුළදී කළ හැකිය.

**2.13 තාවකාලික අත්හිටුවීම, අවසන් කිරීම, ඉවත් වීම, එක් සහභාගිකරුවෙකු විසින් තවත් සහභාගිකරුවෙකු හා ඒකාබද්ධ වීම හෝ අත්පත් කරගැනීම**

(අ) සහභාගිකරු යම් අවස්ථාවකදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිර්දේශ කරනු ලබන යෝග්‍යතා නිර්ණායක සපුරාලීමට අපොහොසත් වීම හෝ එම සහභාගිවන්නා බුන්වත් බවට ප්‍රසිද්ධ කිරීම හෝ බැංකු කටයුතු කිරීමේ/ ප්‍රාථමික අලෙවිකරුවෙකු වීමේ බලපත්‍රය හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති අනුමැතිය අහෝසි කිරීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උචිත යැයි සලකනු ලබන වෙනත් හේතුවක් මත හෝ අදාළ සහභාගිකරුවාගේ අනුමැතිය තාවකාලිකව අත්හිටුවීමට හෝ අවසානාත්මක වශයෙන් හෝ තාවකාලිකව අවසන් කිරීමට පූර්ණ බලතල ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතී.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතිය ලබා දී තිබේනම්, සහභාගිකරුවකුට ලංකාසෙට්ල් පද්ධතියෙන් ඉවත් වීමට හෝ වෙනත් සහභාගිකරුවකු සමඟ ඒකාබද්ධ වීමට හෝ වෙනත් සහභාගිකරුවකුගෙන් ව්‍යාපාරය අත්පත් කර ගැනීමට කටයුතු කල හැකිය.

(ඇ) ඉහත සඳහන් ඕනෑම සිදුවීමකදී, ශ්‍රී ලංකා මහ බැංකුව, සුදුසු පරිදි එහි සහභාගිකරුගේ හිමිකම්, පද්ධති, මෘදුකාංග සහ ලංකාසෙට්ල් පද්ධතිය හා සම්බන්ධ වෙනත් දෑ නැවත භාරදෙන ලෙසට අදාල සහභාගිකරුට විධාන කළ යුතු අතර, සහභාගිකරු එවැනි උපදෙස් වලට අනුකූල විය යුතුය.

**2.13.1 තාවකාලිකව අත්හිටුවීම, අවසන් කිරීම, ඉවත් වීම හෝ එක් සහභාගිකරුවෙකු විසින් තවත් සහභාගිකරුවෙකු හා ඒකාබද්ධ වීම හෝ අත්පත් කර ගැනීම සඳහා දැනුම් දීමේ කාලසීමාව**

(අ) තාවකාලික හෝ ස්ථිර පදනමක් මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිවන්නෙකු තාවකාලිකව අත්හිටුවීමක් හෝ අවසන් කිරීමක් සිදු කළ අවස්ථාවකදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ සහභාගිවන්නා වෙත ඉලෙක්ට්‍රොනිකව හෝ ෆැක්ස් මගින් දැනුම් දිය යුතු අතර, අදාල ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා හෝ ඒ හා සමාන තනතුරක් දරන නිළධාරියෙක් වෙත ලිපියක් මගින්ද වහාම දැනුම්දීමක් සිදු කල යුතුය. සහභාගිවන්නා වෙත ඉලෙක්ට්‍රොනික පණිවිඩය හෝ සහභාගිවන්නාගේ ප්‍රධාන කාර්යාලයට ෆැක්ස් පත යොමුකළ විගස එකී දැනුම්දීම කළාසේ සැලකේ. තාවකාලික ඉවත් කිරීම හෝ අවසන් කිරීම පිළිබඳව එසැණින් ඒ හා සමාන සන්නිවේදන ක්‍රමයක් ඔස්සේ අනෙකුත් සහභාගිවන්නන්ට සහ අදාල පාර්ශවයන්ට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනුම් දෙනු ලැබිය යුතුය.

(ආ) සහභාගිවන්නන් ඉවත් වීමක් හෝ ඒකාබද්ධ කිරීමක් හෝ එක් සහභාගිවන්නෙකුගේ ව්‍යාපාරයක් වෙනත් සහභාගිවන්නෙකු විසින් අත්පත් කර ගැනීමක් වැනි අවස්ථාවකදී, එම ඉවත් වීමට, ඒකාබද්ධ කිරීමට හෝ අත්පත් කරගැනීමට අදාළ සියළු පාර්ශවයන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ. එවැනි ඉවත් වීමක්, ඒකාබද්ධ කිරීමක් හෝ අත්පත් කර ගැනීමක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන දිනයට දින 45 කට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය.

(ඇ) එවැනි සහභාගිවන්නෙකුගේ ඉවත් වීමක්, ඒකාබද්ධ කිරීමක් හෝ අත්පත් කර ගැනීමක් පිළිබඳව අවම වශයෙන් දින 15 කට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිකුත් සියළුම සහභාගිකරුවන් හා අදාල පාර්ශවයන් වෙත දැනුම්දිය යුතු වේ.

(ඈ) අහෝසි කිරීමකදී හෝ තාවකාලිකව අත්හිටුවීමකදී හෝ තාවකාලික අවසන් කිරීමකදී එම අහෝසි කිරීම පිළිබඳව අවම වශයෙන් දින 10 කට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිකුත් සහභාගිවන්නන් සහ අදාල පාර්ශවයන් දැනුවත් කළ යුතුය.

**2.13.2 තාවකාලිකව අත්හිටුවීම, අවසන් කිරීම, ඉවත් වීම, ඒකාබද්ධ කිරීම හෝ එක් සහභාගිවන්නෙකු විසින් වෙනත් සහභාගිවන්නෙකු අත්පත් කර ගැනීම පිළිබඳ බැඳීම්**

(අ) ලංකාසෙට්ල් පද්ධතියෙන් සහභාගිවන්නෙකු තාවකාලිකව අත්හිටවූ, අවසන් කළ හෝ ඉවත් වූ අවස්ථාවකදී එම සහභාගිවන්නාගේ නිම නොකළ සියළුම ගෙවීම් පණිවිඩ, පද්ධතිය විසින්ම ස්වයංක්‍රීයව අවලංගු කරනු ලැබේ. කෙසේ වෙතත් එම ගෙවීම් අදාල පාර්ශවයන්ට නිසි වේලාවට සිදු

කිරීමට සහභාගිකරු තවදුරටත් බැඳී සිටී. තවද සහභාගිකරු ලංකාසෙට්ල් පද්ධතිය වෙත රැස්ව ඇති සහ රැස්වන බැඳීම් ඉටුකිරීම සඳහා බැඳී සිටී.

(ආ) සහභාගිකරු ඒකාබද්ධ කිරීමේදී හෝ එක් සහභාගිකරුවෙකු විසින් තවත් සහභාගිකරුවෙකුගේ ව්‍යාපාරයක් අත්පත් කර ගැනීමේදී එම ව්‍යාපාරය පවරන සහභාගිකරුට ලංකාසෙට්ල් පද්ධතිය වෙත ඇති බැඳීම් එම සහභාගිකරුගේ ලිඛිත අනුමැතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යාපාරය අත්පත් කරගනු ලබන සහභාගිකරු වෙත යොමු කිරීමට කටයුතු කළ හැකිය.

(ඇ) ඉහත (අ) යන්නෙහි සඳහන් බැඳීම් සපුරා ඇති විට ලංකාසෙට්ල් පද්ධතියෙන් තාවකාලිකව අත්හිටවූ/ අවසන් කල සහභාගිකරුවන් හා ලංකාසෙට්ල් පද්ධතිය අතර වන ගිවිසුම්, කොන්ත්‍රාත් සහ වෙනත් සබැඳි ලේඛණ බල රහිත වේ.

**2.13.3 පැහැදිලි කිරීම සහ නිවැරදි කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව, සහභාගිකරුවකු නතර කිරීමට සලකා බලයි නම්, සාධාරණ කාලසීමාවක් තුලදී පැහැදිලි කිරීමක් සහ නිවැරදි කිරීමක් සිදු කිරීමට එම සහභාගිකරුවාට අවස්ථාව ලබා දිය යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රත්‍යක්ෂ ලෙස එයට අනවශ්‍ය හෝ කිසියම් විශේෂ හේතුවක් ඇති බව සොයාගත හොත් අත්හිටුවීමට පෙර පැහැදිලි කිරීම සඳහා අවස්ථාව ලබා දීම අවශ්‍ය නොවේ.

**2.14 පද්ධති කාර්යයන් සඳහා ප්‍රවේශය**

සහභාගිවන්නන්ට ඔවුන්ගේ ආයතනික තත්ත්වය මත පදනම්ව ලංකාසෙට්ල් පද්ධතියේ පහසුකම් සහ කාර්යයන් වෙත ප්‍රවේශ වීමට ඉඩකඩ ලබා දී ඇත. "ගනුදෙනුකාර ඍජු සහභාගිකරුවෙකු" ("Dealer Direct Participant") ලෙස පත් කර ඇති සහභාගිකරුවන් හට තමන්ගේ ගිණුම සහ තම පාරිභෝගිකයන්ගේ ගිණුම් වෙනුවෙන් නිර්ලේඛන සුරැකුම්පත් රඳවා තබා ගැනීමට සහ පැවරීමට අදාළ පහසුකම් සහ කාර්යයන් වෙත ප්‍රවේශය තිබිය යුතුය. "ගනුදෙනුකරුවෙකු නොවන ලංසු තබන්නෙකු" ("Non Dealer Bidder") ලෙස පත් කර ඇති සහභාගිවන්නන් හට තමන්ගේ ගිණුම යටතේ පමණක් නිර්ලේඛන සුරැකුම්පත් රඳවා තබා ගැනීමට සහ පැවරීමට අදාළ පහසුකම් සහ කාර්යයන් වෙත ප්‍රවේශය තිබිය යුතුය.

**2.15 මැන්ඩේට් ගිවිසුම හෝ SWIFT සමඟ නොගැලපීම**

මෙම රීති වල ඇතුළත් විධි විධාන සහ මැන්ඩේට් ගිවිසුමේ ඇතුළත් විධිවිධාන වල කිසියම් ආරවුලක් හෝ නොගැළපීමක් ඇති අවස්ථාවකදී මෙම රීති වල විධිවිධාන බල පැවැත්වේ.
SWIFT විධිවිධාන සමඟ පද්ධති රීතීන්හි විධිවිධාන වල නොගැළපීමක් ඇති වූ අවස්ථාවකදී SWIFT හි විධිවිධාන බල පැවැත්වේ.

**2.16 සහභාගිවන්නන් සඳහා SWIFT ප්‍රලේඛනය**

සහභාගිවන්නන්, එකිනෙකා සමඟ සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ව්‍යාපාරික මට්ටමින් අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියා කළයුතු ආකාරය පද්ධති රීතීන් විස්තර කරයි. කෙසේ වෙතත්, මෙම පද්ධති රීති වලට අමතරව ලංකාසෙට්ල් පද්ධතිය හා සම්බන්ධ අනෙකුත් ලේඛන සහ මෙහෙයුම් මට්ටමකදී පද්ධති දෙක අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය පැහැදිළි කරන SWIFT පද්ධතියේ අවශ්‍යතාවන් සහභාගිකරුවන් විසින් නිර්දේශනය කළ යුතුය.

**2.17 පද්ධති රීති තාවකාලිකව අත්හිටුවීම**

(අ) පද්ධති රීති එක දිගට භාවිතා කිරීම හේතුවෙන් පද්ධතියේ මෙහෙයුම් සහ එහි ස්ථාවරත්වයට බාධා ඇති වන අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් පද්ධති රීතිවල වලංගුභාවය තාවකාලිකව අත්හිටුවනු ඇත.

(ආ) පද්ධති රීති වල කොටසක් තාවකාලිකව අත්හිටුවා ඇති අවස්ථාවකදී එහි ඉතිරිව ඇති පද්ධති රීතිවලට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගිකරුවන් පද්ධතියේ මෙහෙයුම් කටයුතු හැකි පමණ අඛණ්ඩව පවත්වාගෙන යාමට උත්සාහ කළ යුතුය.

(ඇ) පද්ධති රීති තාවකාලිකව අත්හිටුවා ඇති විටෙක, සහභාගිකරුවන් සමඟ සාධාරණ අදහස් විමසීමෙන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි පද්ධති මෙහෙයුම් සිදු කල යුතුය.

(ඈ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවන් හට ක්ෂණිකව උපදෙස් දී, ප්‍රායෝගිකව හැකි ඉක්මනින් පද්ධති රීති වලංගුභාවය නැවත යථා තත්වයට පත් කරනු ඇත.

**2.18 තෙවන පාර්ශවයන්ට පැවරීම**

මුදල් නීති පනතේ 112 (ආ) වගන්තියේ විධිවිධාන වලට යටත්ව, ශ්‍රී ලංකා මහ බැංකුවට හෝ සහභාගිකරුවාට පද්ධති රීති යටතේ වන තම අයිතීන් හා වගකීම් අනෙක් පාර්ශවයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව තෙවන පාර්ශවයක් වෙත පැවරීමක් කල නොහැක.

**2.19 රහස්‍යභාවය**

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගිකරුවන් අදාල නීතීන්ට අනුකූලව උපදෙස්, ගිණුම් පැවරීම්, ගිණුම්, සහභාගිකරුවන් සහ සහභාගිකරුවාගේ ගනුදෙනුකරුවන් පිළිබඳව වන තොරතුරු වල රහස්‍යභාවය පවත්වා ගත යුතුය.

(ආ) සහභාගිවකරුවන්ගේ පද්ධතිය තුළ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු විගණන කටයුතු සඳහා සහභාගිකරු විසින් දැනුම් දී ඇති පාර්ශවයන් වෙත ලබාදීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලා සිටිය හැකි අතර ඒ සඳහා බලය ලබා දිය හැක.

(ඇ) ඉහත 2.19 (අ) රීතියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවට සහ සහභාගිකරුවන්ට පහත තොරතුරු අනාවරණය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම සිදු කල හැක.

(i) පද්ධතියේ මෙහෙයුම් පිළිබඳව සමස්ත හෝ සංක්ෂිප්ත දත්ත;

(ii) පද්ධතිය පිළිබඳ අධ්‍යාපනික හා විස්තරාත්මක තොරතුරු.

(ඈ) පද්ධතියේ ඕනෑම සහභාගිකරුවෙකුගේ ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන නිළධාරීන් වෙත ලබාදීමට ශ්‍රී ලංකා මහ බැංකුවට අයිතිය ඇත.

(ඉ) කිසියම් අදාල නීතියකට යටත්ව, තොරතුරු නිදහස් කිරීමට ඉල්ලා සිටින විටෙක තොරතුරු නිදහස් කිරීමට කිසියම් අධිකරණයකින් නියෝගයක් ලැබුණහොත්, හෝ යම් නීතියකට අනුව තොරතුරු නිදහස් කිරීම අවශ්‍ය නම්, තොරතුරු මුදා හැරීම සිදු කළ යුතු බව සහභාගිකරු සහ ශ්‍රී ලංකා මහ බැංකුව පිළිගනී.

(ඊ) සහභාගිකරුවෙකුගේ පද්ධතිය තුළ සහභාගිත්වය අවසන් වී තිබියදීත්, මෙම රීති ප්‍රතිපාදනයන් මගින් විදහා දක්වන බැඳීම් අඛණ්ඩව ඉටුකිරීමට සහභාගිකරු බැඳී සිටී.

## 3. වගකීම් අත්හැරීම සහ සීමාකිරීම

### 3.1 අනුපාතික බලපෑම

(අ) මෙම රීති යටතේ ඇති බැඳීම් ඉටුකිරීම වළක්වාලන යම් ක්‍රියාවක්, පැහැර හැරීමක් හෝ අපොහොසත් වීමක් හටගෙන ඇත්තේ තමුන්ගේ පාලනයෙන් බැහැර වූ කිසියම් හෝ සාධාරණ හේතුවක් නිසා නම් පමණක් මෙම පද්ධති රීති යටතේ වන බැඳීම් ඉටුකිරීම, පැහැර හැරීම හෝ අපොහොසත් වීම වැනි කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව හෝ සහභාගිකරුවන් වගකිව යුතු නොවේ. (මෙම සංසිද්ධිය අනුපාතික බලපෑම ලෙස හැඳින්වේ.)

පහත සඳහන් අවස්ථාවන්හිදී එය අනුපාතික බලපෑම් සංසිද්ධියක් ලෙස සලකනු නොලැබේ.

(i) පද්ධති රීති යටතේ තමුන්ගේ වගකීම් නිසියාකාරයෙන් ඉටුකලේ නම් අදාළ තත්වය හෝ එමගින් ඇතිවන බලපෑම ශ්‍රී ලංකා මහ බැංකුවට හෝ සහභාගිවන්නාට වළක්වාගැනීමේ හැකියාව තිබී ඇති අවස්ථාවකදී ;

(ii) සෑහෙන තරම් වූ ප්‍රමිතියකින් යුතුව සැලකීමක් දැක්වූයේ නම්, අදාල සිද්ධියෙන් වූ බලපෑම නිවාරණය කිරීමේ හෝ වලක්වා ගැනීමේ හැකියාව තිබූ අවස්ථාවකදී ;

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව හෝ සහභාගිකරු හෝ ඔවුන්ගේ සේවකයෙකු හෝ නියෝජිතයකු සෘජුවම වගකිව යුතු සිදුවීමකදී.

(ආ) අනුපාතික බලපෑම් සංසිද්ධියක් හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට හෝ සහභාගිවන්නෙකුට තම බැඳීම් ඉටුකිරීමට නොහැකි වූයේ නම් ශ්‍රී ලංකා මහ බැංකුව හෝ අදාළ සහභාගිවන්නා හැකි ඉක්මනින්

(i) සිය වගකීම් ඉටු කිරීමට නොහැකිවීමට හේතුවූ අනුපාතික බලපෑම පිළිබඳව සහ එමගින් වගකීම් ඉටුකිරීම කෙතරම් ප්‍රමාණයක් වළක්වා ඇත්ද යන්න ද, එසේ වීමට හේතු සහ අනුපාතික බලපෑමෙහි අපේක්ෂිත කාලය පිළිබඳව අනෙක් පාර්ශවයට ලිඛිතව දැනුම් දීමට;
සහ

(ii) අනුපාතික බලපෑමේ සංසිද්ධියට මූලික වූ හේතුව වැළැක්වීමට හෝ ඉවත් කිරීමට හැකි සෑම උත්සාහයක්ම දැරීම සහ හැකි ඉක්මණින් තම වගකීම් ඉටුකිරීමට කටයුතු කළ යුතු අතර, ඒ සමගම එවැනි අනුපාතික බැලපෑමේ සංසිද්ධියේ බලපෑම මැඩ පැවැත්වීමටද කටයුතු කළ යුතුය.

### 3.2 වගකීම් සීමාව

මහ බැංකුව විසින් පද්ධති රීති යටතේ සිය වගකීම් ඉටු කිරීමට යාමේදී යම් ක්‍රියාවක් සිදු කිරීම හෝ ක්‍රියාවක් සිදු කිරීමට අසමත් වීමක් හෝ සිදු කරන ලද යම් ක්‍රියාවක ප්‍රතිඵලයක් නිසා හෝ යම් නොසලකා හැරීමක් නිසා හෝ යම් සහභාගිකරුවෙකු මුහුණපාන මොනයම් ආකාරයක පාඩුවක්, අවස්ථාවක් අහිමිවීමක් හෝ අනෙකුත් සෘජු හෝ වක්‍ර හානි හෝ ලාභය, වෙළඳපොළ, කීර්ති නාමය, පොළිය, වියදම, හිමිකම අහිමිවීමක් මහ බැංකුව හෝ එහි සේවකයන් හෝ නියෝජිතයන් විසින් කරන ලද යම් නොසලකා හැරීමක් හෝ හිතාමතා කරන ලද පැහැරහැරීමක්, වංචාවක් හෝ සොරකමක් හේතුවෙන් සිදුවූවාක් නම් මිස පද්ධති රීති හෝ පද්ධති රීති ක්‍රියාත්මක කිරීමේදී ඇති වූවක් නම් මහ බැංකුව ඒ සඳහා වගකීමට නොබැඳේ. [එසේ නමුත් මහ බැංකුව, එහි සේවකයන් හෝ නියෝජිතයන් විසින් කරන ලද යම් නොසලකා හැරීමක හෝ හිතාමතා කරන ලද පැහැර හැරීමක, වංචාවක හෝ සොරකමක සෘජු ප්‍රතිඵලයක් ලෙස යම් සහභාගිකරුවෙක්ට අහිමිවන අරමුදල් හෝ සුරැකුම්පත් වල වටිනාකම සහභාගිකරුට ප්‍රතිස්ථාපනය කරගත නොහැකි වන අවස්ථාවක (කිසිදු ප්‍රමාදයකින් තොරව ප්‍රමාණවත් පියවර ගෙන තිබීම මත) නම් එවන් වටිනාකමක් ගෙවීමට මහ බැංකුව බැඳී සිටී. එවන් හානිපූර්ණයක් ලබා ගැනීමට නම් සහභාගිකරුගේ ගිණුමේ ඇති වූ අහිමිවීම, සහභාගිකරුගේ, සේවකයෙකුගේ හෝ නියෝජිතවරයෙකුගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නිසා සිදු නොවිය යුතුය.]

### 3.3 ආනුෂාංගික හානි

සැකය මහ හැරීම සඳහා, සහභාගිකරුවන්ට ඇතිවන ඕනෑම ආකාරයක වක්‍ර, විශේෂ, අනියම් හෝ ආනුෂාංගික පාඩුවක් හෝ හානියක් (සහභාගිකරුවන්ගේ පද්ධතිවල ආදායම් හෝ ලාභ අහිමි වීම, දත්ත හානි, ව්‍යාපාර සඳහා බාධා කිරීම් හෝ වැරදීම් වලින් සිදුවන පාඩු හෝ සුරැකුම් පත් උල්ලංඝණය කිරීම් වැනි දෑ ඇතුලත්ය). ශ්‍රී ලංකා මහ බැංකුව එවැනි අවස්ථාවක් පිළිබඳව පූර්ව දැනුවත් කිරීමක් සිදු කර තිබුණද, ඒ පිළිබඳව වගකියනු නොලබන බවට සහභාගිකරුවන් විශේෂයෙන් එකඟ වේ.

### 3.4 වන්දි පූර්ණය

සහභාගිකරුවෙකුගෙන් හෝ එහි සේවකයෙකුගෙන් හෝ නියෝජිතයෙකුගෙන් (සහභාගිකරු විසින් බලය ලබා දී ඇති හෝ නැති) සහ/ හෝ සහභාගිකරු පද්ධති රීති වලට අනුකූල නොවන අතපසුවීමක් මගින් ඍජුව හෝ වක්‍රව පැන නගින ක්‍රියාවක් හෝ නොකරහැරීමක් නිසා මහ බැංකුවට පද්ධති මෙහෙයුම්කරු ලෙස බලපාන සියළුම වියදම්, හිමිකම් හානිවීම් සහ වගකීම් වලට එරෙහිව සහභාගිකරු මුදල් මණ්ඩලය, එහි සාමාජිකයින්, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින් සහ නියෝජිතයින්ට වන්දි ගෙවිය යුතුය. මෙම වන්දිපූර්ණය සහභාගිකරුගේ සහභාගීත්වය අවසන් වූ අවස්ථාවකදී වුවද බලපැවැත්වේ.

### 3.5 බුන්වත් වීමේදී ශුද්ධ අගය ගණනය කිරීම

2002 අංක 32 දරණ මුදල් නීති (සංශෝධිත) පනතෙහි 62 (අ) වගන්තියෙහි (8) උපවගන්තියෙහි (අ) ඡේදය හි අරමුණු සඳහා සහභාගිකරුවෙකු සම්බන්ධයෙන් ඇවර කිරීමේ කටයුතු ආරම්භ කර ඇත්නම්, පද්ධතියට ඇතුලත් කර ඇති උපදෙස් වලට අනුකූලව එවැනි සහභාගිකරුවෙකුගෙන් අනිකුත් සහභාගීවන්නන්ට ඇති වගකීම් වලට එදිරිව අනිකුත් සහභාගිකරුවන්ගෙන් එවැනි සහභාගිකරුවෙකු සඳහා පද්ධතියට ඇතුලත් කර ඇති උපදෙස් වලට අදාල වගකීම් වලට අනුකූලව සලකා බැලිය යුතු අතර එහිදී එම වගකීම් සඳහා ගෙවීම් කාලය සම්පූර්ණ වී ඇත්ද නැත් ද යන්න අදාල නොවේ.

02 වන වෙළුම

**තත්කාලීන දළ පියවීම් පද්ධතිය**
**(RTGS පද්ධතිය)**

පටුන


**1. තත්කාලීන දළ පියවීම් පද්ධතියේ මෙහෙයුම් ..................... 18A**
1.1 සහභාගිකරුවන්ගේ ගිණුම්..................... 18A
1.2 ගෙවීම් පණිවිඩ සන්නිවේදනය ..................... 18A
1.3 ගෙවීම් පියවීම ..................... 18A
1.4 අවලංගු කළ නොහැකි බව සහ අවසන් බව ..................... 18A
1.5 පද්ධතියේ සේවා කාලය ..................... 18A
1.6 ලංකාසෙට්ල් පද්ධතියට සහභාගිකරුවන්ගේ සම්බන්ධතාවය ..................... 18A

**2. තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ පණිවිඩ යැවීම ..................... 18A**
2.1 SWIFT FIN Y – Copy සේවාව ..................... 18A
2.2 SWIFT FIN ..................... 19A
2.3 සංවෘත පරිශීලක කණ්ඩායම (Closed User Group) පරිපාලනය ..................... 19A
2.4 SWIFT අනන්‍යතාවයේ සංශෝධන ..................... 19A
2.5 සහභාගිකරුවන් හඳුනාගැනීමේ කේත (BIC) ..................... 19A
2.6 RTGS සඳහා SWIFT FIN Y – Copy සේවාව හැඳුනුම ..................... 20A
2.7 සංවෘත පරිශීලක කණ්ඩායමෙහි පිළිගත් පණිවුඩ වර්ග..................... 20A
2.8 ලංකාසෙට්ල් පද්ධතියේ පියවීම් පණිවිඩ ..................... 20A
2.9 අසාර්ථක වීමේ නිවේදනය (MT019) සහ අසාර්ථක වීමට හේතු කේත ..................... 20A
2.10 ග්‍රාහක දැනුම්දීම් (MT012) ..................... 20A
2.11 SWIFT ගාස්තු සහ ප්‍රති අය කිරීම ..................... 20A

**3. නිශ්චිත පණිවිඩයන්හි අන්තර්ගතයේ අවශ්‍යතා..................... 21A**
3.1 පාරිභෝගික ප්‍රතිලාභියා හඳුනාගැනීම ..................... 21A
3.2 ගනුදෙනු යොමු අංක ..................... 21A
3.3 ගෙවීම් දිනය හා ගෙවීම් ගබඩා කිරීම ..................... 21A
3.4 ව්‍යවහාර මුදල් ..................... 21A
3.5 ශාඛා හඳුනාගැනීම ..................... 21A

**4. වැරදි ලෙස ක්‍රියාත්මක වූ ගෙවීම් ..................... 21B**
4.1 වැරදීමකින් පියවීම් සිදුකල ගෙවීමක් ආපසු ගෙන්වා ගැනීම ..................... 21B
4.2 අයදුම් කල නොහැකි ගෙවීම් ..................... 21B

**5. පියවීම් ගිණුම් අතර සිදුවන පැවරුම් ..................... 22A**

**6. පෙළ ගැස්ම කළමනාකරණය ..................... 22A**
6.1 අරමුදල් පවතින බව තහවුරු කිරීම ..................... 22A
6.2 පෙළ ගැස්වීම ..................... 22A
6.3 ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ පෝලිම් ක්‍රමය ..................... 22A
6.4 ගනුදෙනු සඳහා පවරා ඇති ප්‍රමුඛතා ..................... 22A
6.5 දැනටමත් ඇති ගෙවීම් වල අනුපිළිවෙල වෙනස් කිරීම ..................... 23A
6.6 පෙළෙහි ඇති ගෙවීම් අවලංගු කිරීම ..................... 23A
6.7 Gridlock Resolution ..................... 23A
6.8 දිනය අවසානයේදී පියවීම් නොකරන ලද ගනුදෙනු සඳහා පිළියම් ..................... 23A

**7. එක් දින ද්‍රවශීලතා පහසුකම (ILF) ..................... 23A**
7.1 දළ විශ්ලේෂණය ..................... 23A
7.2 යෝග්‍ය සුරැකුම්පත් ..................... 23A
7.3 එක් දින ද්‍රවශීලතා පහසුකම් (ILF) ගිවිසුම ..................... 24A

**8. අවම ශේෂ අවශ්‍යතාවය ..................... 24A**

**9. බහු පාර්ශවීය ශුද්ධ පියවීම් කාණ්ඩ** ........ 24A
- 9.1 තෙවන පාර්ශවීය පියවීමේ වගකීම් වලට අදාල උපදෙස් ක්‍රියාත්මක කිරීමට ඇති බලය ........ 24A
- 9.2 ලංකාසෙට්ල් පියවීම් ගිණුම් හරහා ශුද්ධ පියවීම් සිදු කිරීම ........ 24A
- 9.3 ප්‍රමාණවත් අරමුදල් නොමැති වීම හේතුවෙන් පියවීම් කාණ්ඩ අත්හිටුවීම හෝ අසාර්ථක වීම ........ 24A
- 9.4 පියවීම් ගිණුමේ ප්‍රමාණවත් නොවන අරමුදල් සඳහා පැහැර හැරීමේ ගාස්තු ........ 25A
- 9.5 පැහැර හැරීමක් සඳහා කාල සීමාව ගණනය කිරීම ........ 25A
- 9.6 පියවීමේ ගිණුමට පැහැර හරින ලද ගාස්තු හර කිරීම ........ 25A

**10. අන්තර් පාර්ශවීය ඉදිරි දාතම් අගය/ එක්දින පියවීම් සහිත ගනුදෙනු** ........ 25A
- 10.1 ඉදිරි දාතම් කල ගනුදෙනු ........ 25A
- 10.2 එකම දින පියවන ගනුදෙනු ........ 26A

**11. ව්‍යාපාර අඛණ්ඩතාවය සහ සුරක්ෂිතතාවය** ........ 26A

## 1. තත්කාලීන දළ පියවීම් පද්ධතියේ (RTGS) මෙහෙයුම්

### 1.1 සහභාගිකරුවන්ගේ ගිණුම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෑම සහභාගිත්ව ආයතනයක් සඳහාම පියවීම් ගිණුමක් තත්කාලින දළ පියවීම් පද්ධතිය තුළ සපයනු ලබන අතර එමඟින් ගෙවීම් කරනු ලබන සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමේ මූල්‍ය තත්ත්වය මත සහභාගිකරුවන්ගේ තනි පුද්ගල ගෙවීම් තත්කාලීනව පියවීම සඳහා පහසුකම් සපයනු ඇත.

### 1.2 ගෙවීම් පණිවිඩ සන්නිවේදනය

සහභාගිකරුවන් සහ ලංකාසෙට්ල් පද්ධතිය අතර පණිවිඩ හුවමාරුව SWIFTNet සහ CBSLNet හරහා සිදු විය යුතුය. ලංකාසෙට්ල් පද්ධතියේ සියළුම සහභාගිකරුවන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන SWIFT සංවෘත පරිශීලක කණ්ඩායමේ (Closed User Group -CUG) සාමාජිකත්වය ලබා තිබිය යුතුය. ලංකාසෙට්ල් පද්ධතියට ගෙවීම් පණිවිඩයක් සම්ප්‍රේෂණය කල හැක්කේ CUG හි සාමාජිකත්වය ලත් සාමාජිකයින්ට පමණි. පණිවිඩ හුවමාරු තාක්ෂණය SWIFT පණිවිඩ ආකෘතිය සහ SWIFT Fin Copy සේවාව අනුව රඳා පවතී. ගෙවීම් උපදෙස් වලට අදාළ සියළුම පණිවිඩ SWIFT net හරහා පද්ධතියට එක් කල යුතුය. තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පණිවිඩ හුවමාරුවට අදාල විස්තර හා විධාන මෙම වෙළුමෙහි 2 වන රීතිය යටතේ දක්වා ඇත.

### 1.3 ගෙවීම් පියවීම

සහභාගිකරුවන් විසින් ගෙවීම් උපදෙස් පද්ධතියට යොමු කල පසු එවැනි ගනුදෙනු තනි පුද්ගල වශයෙන් හා තත් කාලීනව දළ පදනමෙන් සිදු කරනු ලබයි. සෑම ගනුදෙනුවක් සඳහාම ගෙවීම් කරනු ලබන ආයතනයෙහි පියවීම් ගිණුමෙහි අදාළ ගනුදෙනුව සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් ශේෂයක් පවතින්නේනම් අදාල වටිනාකම ගෙවීම් කරන්නාගේ පියවීම් ගිණුමේ සිට ගෙවීම් ලබන්නාගේ ගිණුමට හුවමාරු වී එම ගනුදෙනුව ක්ෂණිකව පියවීම සිදු වේ. මෙම සෑම ගනුදෙනුවක්ම අදාල ගිණුම් හර සහ බැර කරමින් එකවිට පද්ධතිය තුළ සටහන් වේ. කෙසේ නමුත්, ගිණුමේ ශේෂය ප්‍රමාණවත් නොවන්නේ නම් අදාළ ගෙවීම් තොරතුරු ගෙවීම් ආයතනයේ ගිණුමට ප්‍රමාණවත් අරමුදල් ලැබෙන තෙක් පෙළ ගස්වා තබනු ලැබේ. RTGS හි මෙම පෙළ ගැස්වීම සම්බන්ධ විස්තර මෙම වෙළුමෙහි 6 වන රීතිය යටතේ දක්වා ඇත.

### 1.4 අවලංගු කල නොහැකි බව සහ අවසන් බව

තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා පියවීම සිදු කල ගෙවීමක් පද්ධතියේ සටහන් වූ පසු අවලංගු කල නොහැකි හා අවසන් වූ බවට සලකනු ලැබේ. ගෙවීම් උපදෙස් අනුව අදාල ගිණුම් හර සහ බැර වූ පසු සහභාගිකරුවන්ට එම ගනුදෙනුව කිසිලෙසවත් අවලංගු කල නොහැක. ගනුදෙනුවට අදාල ගිණුම්, පද්ධතිය හරහා හර සහ බැර වූ පසු ගෙවීම් තොරතුරු අවලංගු කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සහභාගිකරුවන්ට අවස්ථාව නොලැබේ.

### 1.5 පද්ධතියේ සේවා කාලය

සෑම බැංකු කටයුතු සිදු කරන ව්‍යාපාරික දිනයකදීම පෙ ව 8.00 සිට ප ව 4.30 දක්වා තත්කාලීන දළ පියවීම් පද්ධතිය ගෙවීම් පණිවිඩ පියවීම සඳහා විවෘතව පවතී. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් දෛනික මෙහෙයුම් සටහන වරින් වර ප්‍රකාශට පත් කරනු ලැබේ. වලංගු හේතුවක් පවතින විටක, ශ්‍රී ලංකා මහ බැංකුවට දෛනික ආරම්භක වේලාව තාවකාලිකව වෙනස් කල හැකිය. එවැනි අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා මහ බැංකුව සුදුසු යැයි තීරණය කරනු ලබන අකාරයකට හැකි සියළුම අවස්ථාවන්හිදී සහභාගිකරුවන් කල්තියා දැනුම්වත් කරනු ඇත.

### 1.6 ලංකාසෙට්ල් පද්ධතියට සහභාගිකරුවන්ගේ සම්බන්ධතාවය

සෑම සහභාගිකරුවෙක්ම ලංකාසෙට්ල් පද්ධතිය සමඟ ඇති සම්බන්ධතාවය විවෘතව හා ප්‍රමාණවත්ව තබා ගත යුතු අතර ලංකා සෙට්ල් පද්ධතිය විවෘතව පවතින කාලසීමාව තුල එහි මෙහෙයුම් සඳහා ප්‍රමාණවත්, නිපුණත්වයෙන් යුතු කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය.

## 2. තත්කාලීන දල පියවීම් පද්ධතිය තුල පණිවිඩ යැවීම


### 2.1 SWIFT FIN – Y Copy සේවය

ලංකාසෙට්ල් පද්ධතිය ගෙවීම් පණිවිඩ සම්ප්‍රේශණය කිරීම සඳහා SWIFT ජාලය භාවිතා කරනු ලබයි.

ගෙවීම් උපදෙස් හුවමාරුව සඳහා SWIFT FIN – Y Copy සේවාව භාවිතා කරයි. SWIFT මගින් සියළුම සහභාගිකරුවන්ගේ ගෙවීම් ගනුදෙනු අධීක්ෂණය කරන අතර ලංකාසෙට්ල් පද්ධතියට සම්බන්ධ ඕනෑම ගෙවීම් තොරතුරක් ඇතුලත් පණිවිඩ SWIFT FIN – Y Copy සේවාව වෙත යොමු කරනු ලබයි. පියවීම් සඳහා අවශ්‍ය තොරතුරු SWIFT පණිවිඩ හරහා ගෙවීමේ ක්‍රියාවලිය සඳහා ලංකා සෙට්ල් පද්ධතිය වෙත යොමු කරනු ලබයි. ලංකා සෙට්ල් පද්ධතියෙන් ලැබෙන පියවීම් පිළිබඳ මුල් උපදෙස්, අනුමැතිය ලැබිය යුතු හෝ නිෂ්ප්‍රභා කරනු ලබන පණිවිඩ පිළිබඳ තොරතුරු SWIFT හි රඳවා තබා ගනු ලැබේ. ගෙවීමක් පියවීමේදී, යොමු කරනු ලැබූ සහභාගිකරුවාගේ පියවීම් ගිණුම හර කරමින්ද ගෙවීම ලබන සහභාගීකරුවාගේ පියවීම් ගිණුම බැර කරමින්ද ක්ෂණිකව සටහන් තබනු ලැබේ. ලංකාසෙට්ල් පද්ධතිය මගින් පියවීමෙහි තත්වයන් අඩංගු තහවුරු කල පණිවිඩයක් SWIFT ජාලය වෙත

යොමු කරනු ලැබේ. ගෙවීමක් පියවීමට නොහැකි නම්, එය RTGS පද්ධතිය තුළ පෙලගස්වා තබනු ලැබේ. ගෙවීම් සම්බන්ධ පණිවිඩයද, අනුමැතිය ලැබෙන තුරු හෝ නිෂ්ප්‍රභා කරන තුරු SWIFT මගින් රඳවා තබා ගනී.

**මූලික පණිවිඩ ගලායාමේ ක්‍රියාවලිය පහත දැක්වේ.**




## 2.2 SWIFT FIN

සීමිත පරාසයක වටිනාකමක් නොමැති (non-value) පණිවිඩ, උදා - විමසීම් සහ තහවුරු කිරීම්, හුවමාරු කිරීම සඳහා ද ලංකාසෙට්ල් පද්ධතිය FIN ජාලය භාවිත කරනු ලබයි. SWIFTNet භාවිතා කර RTGS පද්ධතියේ ගෙවීම් උපදෙස් හුවමාරුව හා පියවීම් යවනු ලබයි. පද්ධතියේ ගෙවීම් උපදෙස් වල පියවීම් සඳහා සහයවන පරිදි FIN – Y Copy සේවාවට ප්‍රතිපාදන සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව SWIFT සේවාව සමඟ ගිවිසුමකට පැමිණ තිබේ.

පියවීම් අවසර දීම සඳහා තෝරාගත් තොරතුරු RTGS පද්ධතියට පිටපත් කර ගැනීමට SWIFT FIN – Y Copy සේවය FIN පණිවිඩ සේවාවේ පහසුකම් භාවිතා කරනු ලබයි.

SWIFT FIN – Y Copy සංවෘත පරිශීලක කණ්ඩායම සමන්විත වන්නේ

- ➢ පරිපාලකයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව (මධ්‍යම ආයතනය) ; සහ
- ➢ සහභාගිකරුවන්

## 2.3 සංවෘත පරිශීලක කණ්ඩායම (Closed User Group (CUG)) පරිපාලනය

CUG සාමාජිකත්වය තීරණය කිරීම, CUG විසින් සහය දක්වන පණිවිඩ වර්ග/ අන්තර්ගතය සහ SWIFT FIN – Y Copy සේවාවේ අනෙකුත් අංගයන් ඇතුළුව SWIFT FIN – Y Copy සේවාවේ පරිපාලනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරයි.

## 2.4 SWIFT අනන්‍යතාවයේ සංශෝධන

සහභාගිකරුවෙකු විසින් ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිත්වයට බලපෑමක් විය හැකි SWIFT අනන්‍යතාවයේ හෝ හැකියාවන් ගේ සංශෝධන සඳහා වන SWIFT සේවාවේ ඕනෑම ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලබාගත යුතු වේ.

## 2.5 සහභාගිකරුවන් හඳුනාගැනීමේ කේත (BIC)

ලංකාසෙට්ල් පද්ධතියේ ගනුදෙනු සිදු කිරීම සඳහා සෑම සහභාගිකරුවෙකුම තනි බැංකු හඳුනාගැනීමේ කේතයක් (BIC) පවත්වා ගෙන යා යුතුය. RTGS පද්ධතිය තුල පියවීම් සම්පූර්ණ කිරීමෙන් පසු යොමු කරන ලංකාසෙට්ල් පද්ධතියේ සියළු ගෙවීම් පණිවිඩ යායුතු හා ගෙවීම් පණිවිඩ යොමු කල යුතු වන හඳුනාගැනීමේ කේත අංකය මෙය වේ.

සහභාගිකරුවෙකුට ලංකාසෙට්ල් පද්ධතියේ ගෙවීම් පණිවිඩ සඳහා වන අන්තයක් ලෙස එක් හඳුනාගැනීමේ කේතයක් නම් කල හැක.

ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිකරුවන්ගේ හඳුනාගැනීමේ කේත ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

**2.6 RTGS සඳහා SWIFT FIN – Y Copy සේවාව හැඳුනුම**

SWIFT FIN – Y Copy සේවාව විසින් එය හුවමාරු කරගෙන පිටපත් කිරීම සඳහා පිටතට යවනු ලබන SWIFT ගෙවීම් උපදෙස් තුළ අක්ෂර තුනක සේවා හඳුනාගැනීමේ කේතයක් යවනු ලබන සහභාගීකරුවෙකු විසින් ඇතුළත් කළ යුතුය.

ලංකාසෙට්ල් පද්ධතියේ RTGS ගනුදෙනු සඳහා සේවා හඳුනාගැනීමේ කේතය (පරිශීලන ශීර්ෂයේ 103 ක්ෂේත්‍රයෙහි හෝ කාණ්ඩ 03 හි තබා ඇති) LKB වේ.

**2.7 සංවෘත පරිශීලක කණ්ඩායමෙහි පිළිගත් පණිවිඩ වර්ග**

පහත දැක්වෙන SWIFT පණිවිඩ වර්ග (ගෙවීම් උපදෙස්) සංවෘත පරිශීලක කණ්ඩායමෙහි භාවිතා කිරීමට හැකිය.

| | |
|---|---|
| MT102 | බහුකාර්ය ගනුදෙනුකරුවන්ගේ ණය පැවරීම |
| MT103 | තනි ගනුදෙනුකරුවෙකුගේ ණය පැවරීම |
| MT202 | සාමාන්‍ය මූල්‍ය ආයතන පැවරීම |
| MT205 | මූල්‍ය ආයතන පැවරීම් ක්‍රියාත්මක කිරීම |

**2.8 ලංකාසෙට්ල් පද්ධතියේ පියවීම් පණිවිඩ**

SWIFT FIN – Y Copy සේවාව, පියවීම් ක්‍රියාවලිය සිදු කිරීම සඳහා පහත සඳහන් පණිවිඩ වර්ග භාවිතා කරයි.
MT096 - RTGS පද්ධතියට පැමිණෙන FIN Copy පණිවිඩ
MT097 - RTGS පද්ධතියෙන් පිටතට යන පණිවිඩ සඳහා බලය ලබා දීමට/ ප්‍රතික්ෂේප කිරීමට අදාල නිවේදනය දැක්වෙන FIN – Copy පණිවිඩ

ලංකාසෙට්ල් පද්ධතියෙන් ධනාත්මක හෝ සෘණාත්මක ප්‍රතිචාර ලැබෙන තුරු ලැබෙන ගෙවීම් උපදෙස් හුවමාරු කිරීම, පිටපත් කිරීම හා ගබඩා කිරීම සිදු කරනු ලබයි. SWIFT FIN – Y Copy සේවාව අර්ධ පිටපත් මාදිලිය තුල ක්‍රියාත්මක වේ. එනම් ලංකාසෙට්ල් පද්ධතියේ පියවීම් ක්‍රියාවලියට (ක්ෂේත්‍ර 20 හා 32A එම ගනුදෙනු යොමුව, ගෙවීම් සිදු කරන දිනය, මුදල් කේතය සහ ප්‍රමාණය) අදාළ තොරතුරු කිහිපයක් පමණක් ශීර්ෂ (ග්‍රාහක සහ ප්‍රතිග්‍රාහක) අවශේෂ කොටස සමඟ MT096 තුල ඇතුලත් වේ.

ලංකාසෙට්ල් පද්ධතිය MT096 ක්‍රියාත්මක කරනු ලබන අතර MT097 මගින් SWIFT FIN – Y Copy වෙත ප්‍රතිචාර දක්වයි.

සාර්ථක ලෙස ගෙවීම් කරන ලද ගෙවීම් උපදෙස් (උදා. MT103), යොමු කරන ලද පණිවිඩයේ ශීර්ෂ කොටස තුළ ඇති පියවීම් විස්තරය ප්‍රතිග්‍රාහක සහභාගිවන්නා වෙත SWIFT FIN-Y Copy මගින් යවනු ලැබේ. ලංකාසෙට්ල් පද්ධතියේ තහවුරු කිරීමේ ක්‍රියාවලිය තුල MT096 අසාර්ථක වුවහොත්, සෘණාත්මක MT097 ක් (ප්‍රතික්ෂේපිත ප්‍රතිචාරය) SWIFT FIN – Y Copy වෙත ආපසු යොමු කරනු ලැබේ.

**2.9 අසාර්ථක වීමේ නිවේදනය (MT019) සහ අසාර්ථක වීමට හේතු කේත**

RTGS පද්ධතියට ගෙවීම් උපදෙස් පියවීමක් සම්පූර්ණ කිරීමට නොහැකි වූ විට එය SWIFT FIN – Y Copy සේවාව වෙත සෘණාත්මක MT097 ක් (ප්‍රතික්ෂේපිත ප්‍රතිචාරය) යවයි. එවිට SWIFT FIN - Y Copy සේවාව, ප්‍රතික්ෂේප කිරීමේ හේතුව දන්වමින් උපදෙස් එවන ලද සහභාගිකරුවා වෙත අසාර්ථක වීමේ නිවේදනය (MT019) යවනු ලබයි.

ප්‍රතික්ෂේපය සඳහා වන සෑම හේතුවකටම අංක දෙකකින් යුත් අසාර්ථක වීමේ නිවේදන කේතයක් (ඇමුණුම ආ) වෙන්කරනු ලබයි. මෙය අසාර්ථක වීමේ නිවේදනයෙහි (MT109) 432 ක්ෂේත්‍රයෙහි දක්නට ලැබේ. SWIFT හෝ RTGS පද්ධතිය විසින් ප්‍රතික්ෂේප කරන ක්‍රියාවලිය තුල හේතුව සහ හේතු වන කරුණ හඳුනාගැනීම් මත අසාර්ථක වීමේ නිවේදන කේතය වෙන් කල හැකිය.

**2.10 ග්‍රාහක දැනුම් දීම (MT012)**

RTGS පද්ධතියෙන් ධනාත්මක බලයලත් ප්‍රතිචාරයක් ලැබීමෙන් පසු SWIFT FIN – Y Copy මගින් යවනු ලබන සහභාගිකරුවා හට ග්‍රාහකගේ දැනුම් දීම (MT012) යොමු කරනු ලබයි.

**2.11 SWIFT ගාස්තු සහ ප්‍රති අය කිරීම්**

අදාල ගිවිසුම් වලට අනුකූලව SWIFT සේවාව විසින් තීරණය කරනු ලබන ගාස්තු අනුව, සෑම සහභාගිකරුවකු විසින් දෙනු ලබන ගෙවීම් උපදෙස් සඳහා SWIFT FIN – Y Copy සේවාවට අදාල පිරිවැය SWIFT වෙත ගෙවීමට සෑම සහභාගිකරුවෙකුම සෘජුව බැඳී සිටී.

LankaSecure පද්ධතියේ ගනුදෙනු සිදුකිරීම සඳහා එවැනි සහභාගිකරුවෙකු විසින් ලබා දෙන උපදෙස් සඳහා වන පණිවිඩකරණ පිරිවැය SWIFT වෙත ගෙවීම සඳහා සෑම සහභාගිකරුවෙක්ම බැඳී සිටී.

RTGS පද්ධතිය හා LankaSecure පද්ධතිය හරහා ආපසු හර කිරීම් යටතේ සහභාගිකරුවන් වෙත යවනු ලබන පණිවිඩ වලට අදාල ගාස්තු SWIFT වෙත ගෙවීම සඳහා සෑම සහභාගිකරුවෙකුම බැඳී සිටී. උදා - SWIFT ගාස්තු සාමාන්‍යයෙන් SWIFT පණිවිඩ යවනු ලබන්නාගෙන් අය කරනු ලැබේ.

## 3. නිශ්චිත පණිවිඩයන්හි අන්තර්ගතයේ අවශ්‍යතා

### 3.1 පාරිභෝගික ප්‍රතිලාභියා හඳුනා ගැනීම

සහභාගිකරුවන් විසින් ගිණුමේ නම සහ අංකය භාවිතයෙන් ගෙවීම් උපදෙස් හි ඇති පාරිභෝගික ප්‍රතිලාභීන් හඳුනා ගත යුතුය.

### 3.2 ගනුදෙනු යොමු අංක

සියළුම ගෙවීම් උපදෙස් සඳහා යොමු අංකයක් සඳහන් කිරීමට සහභාගිකරුවන් වගබලා ගත යුතු අතර එම යොමු අංකය එක් වර්ෂයක කාලයක් සඳහා අනන්‍ය විය යුතුය.

### 3.3 ගෙවීම් දිනය සහ ගෙවීම් ගබඩා කිරීම

සෑම දිනයක් ආරම්භයේදීම ලංකාසෙට්ල් පද්ධතිය තුල ගබඩා කර ඇති සෑම ගෙවීම් උපදෙසක් සඳහාම වලංගු ගෙවීමේ දිනයක් තිබේදැයි පරීක්ෂා කරනු ලබයි. ගබඩා කර ඇති උපදෙස් හි දක්වා ඇති ගෙවීමේ දිනය දැනටමත් පසුවී ඇතිනම් එය ප්‍රතික්ෂේප කරනු ලබයි.
අනාගත ගෙවීමේ දින සහිත පියවීම් වලට අදාළ ගෙවීම් උපදෙස් පිළිගෙන ගබඩා කිරීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියට හැකියාව ඇත. පවතින ගෙවීමේ දිනයේ සිට කැලැන්ඩර් දින 10 ක් ඉදිරියට පියවීම් සඳහා වන ගෙවීම් උපදෙස් පද්ධතිය භාර ගනු ලබයි. කැලැන්ඩර් දින 10 ඉක්මවූ ගෙවීම් දින සහිත ගනුදෙනු ප්‍රතික්ෂේප කරනු ලබයි.

ව්‍යාපාරික දිනයක් නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශ කල විටදී උදා - විශේෂිත හේතුවක් මත ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපාර කටයුතු සඳහා විවෘත නොකරන අවස්ථාවකදී, එම ගෙවීම් දිනයට අදාල ගෙවීම් උපදෙස් අවලංගු කිරීම හෝ නව ගෙවීම් දිනයක් සහිතව නැවත එම ගෙවීම් උපදෙස් පද්ධතියට ඇතුළත් කිරීම සහභාගිකරුවන්ගේ වගකීම වේ.

### 3.4 ව්‍යවහාර මුදල්

සියළුම ලංකාසෙට්ල් ගෙවීම් උපදෙස් ශ්‍රී ලංකා රුපියල් වලින් නාමනය කල යුතු අතර ශ්‍රී ලංකා රුපියල් වලින් පියවීම් කල යුතුය.

### 3.5 ශාඛා හඳුනා ගැනීම

සෑම සහභාගිකරුවෙකුම, හැකි සෑම අවස්ථාවකදීම, නේවාසික රටෙහි ප්‍රතිලාභී ගිණුමට අදාළ සහභාගිකරුගේ ශාඛාව හඳුනා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සකසා තිබිය යුතුය.

## 4. වැරදි ලෙස ක්‍රියාත්මක වූ ගෙවීම්

### 4.1 වැරදීමකින් පියවීම් සිදුකල ගෙවීමක් ආපසු ගෙන්වා ගැනීම

නොපියවූ ගෙවීම් උපදෙස් ඔවුනගේ පියවීම් පෙළෙන් ඉවත් කර ගැනීමේ හැකියාව යොමු කරනු ලබන සහභාගිකරුට ඇති අතර, ලංකාසෙට්ල් පද්ධතියේ ගිණුම් අතර පියවීම සිදු වූ පසු යොමුකරනු ලබන සහභාගිකරුට එය ආපසු හැරවීමේ හැකියාවක් නොපවතී.

එවැනි අවස්ථාවකදී, යොමු කරනු ලබන සහභාගිකරුට, ගෙවීම ලබන සහභාගිකරුගෙන් එම ගෙවීම ආපසු හරවා එවන ලෙසට ෆැක්ස් මගින් හෝ දුරකථනයෙන් (ෆැක්ස් මගින් තහවුරුවක් සමඟ) ඉල්ලීමක් කල හැක. ගෙවීම් ලබන සහභාගිකරු එවැනි ඉල්ලීමට අනුකූල විය යුතුද යන්න පිළිබඳව ස්වයං ඇගයුමක් කල යුතුය.

### 4.2 අයදුම්කල නොහැකි ගෙවීම්

ගෙවීමක් සිදු කල නොහැකි අවස්ථාවකදී එනම්,
- අවසන් ප්‍රතිලාභියාගේ ගිණුම් තොරතුරු අඩුවීමක් හෝ නොගැලපීමක් ඇති විට හෝ
- ගෙවීමෙහි නම් කරනු ලබන අවසන් ප්‍රතිලාභියාගේ ගිණුම වසා ඇති විට

එම ගෙවීම ලබන සහභාගිකරු විසින් යොමු කරනු ලැබූ සහභාගිකරු වෙත ලැබුණු හා පියවූ ගෙවීම් ආපසු හරවා යැවිය යුතුය.

සහභාගිකරුවන් අතර සිදු වන එවැනි ගෙවීම් (MT202 සහ MT205) එම ව්‍යාපාරික දිනය තුලදීම, යොමු කරනු ලැබූ සහභාගිකරු වෙත ආපසු හරවා යැවිය යුතු අතර පාරිභෝගිකයන් සමඟ සිදුවන ගෙවීමකදී (MT 102 සහ MT 103) එලඹෙන ඊළග ව්‍යාපාරික දිනයේදී ආපසු යොමු කල යුතුය.

සහභාගිකරුවන් දෙදෙනෙකු අතර සිදුවන එවැනි ගෙවීමක් ආපසු හරවා යැවීමකදී, එම ගෙවීම පිළිබඳ තොරතුරු නව MT 202 පණිවිඩයකින් යොමු කල යුතුය. ආපසු හරවා යැවීමේ උපදෙස් තුළ මුල් උපදෙසෙහි යොමු අංකය සහ එම ගෙවීම "ආපසු ගෙවීමක්" ද යන්න පැහැදිලිව සඳහන් විය යුතුය. ගෙවීමක් ආපසු යොමු කිරීමේදී ඒ සඳහා වැය වූ සාධාරණ වියදම් යොමු කරනු ලබන සහභාගිකරුගෙන් අයකර ගැනීමට නැවත යවනු ලබන සහභාගිකරුට හැකියාව පවතී.

## 5. පියවීම් ගිණුම් අතර සිදුවන පැවරුම්

පියවීම් ගිණුම් අතර සිදුවන පැවරුම් යනු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෘජුව සහභාගිකරුවන්ගේ පියවීම් ගිණුම් අතර ක්‍රියාත්මක කරන හර සහ බැර කිරීම්ය. මෙම සෘජු ගිණුම් මෙහෙයුම් විධි විධාන මැන්ඩේට් ගිවිසුමේ එන කරුණු වල දැක්වෙන අවශ්‍යතා මත සිදුවේ.

සහභාගිකරුවන්ට මෙම ගනුදෙනු වලට අදාළ හර සහ බැර නිවේදන (MT900 සහ MT910) SWIFT සේවාව හරහා ලැබෙනු ඇත.

## 6. පෙළ ගැස්ම කළමනාකරණය

### 6.1 අරමුදල් පවතින බව තහවුරු කිරීම

සහභාගිකරුවෙකුගේ පියවීම් ගිණුම හර කිරීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියට ගෙවීම් උපදෙස් ලැබුනු විට, අදාල පියවීම් ගිණුමේ අරමුදල් පවතින බව පද්ධතිය විසින් පරීක්ෂා කරනු ලබයි. පරීක්ෂා කරනු ලබන අවස්ථාවේදී පියවීම් ගිණුමේ ප්‍රමාණවත් තරම් අරමුදල් නොමැති වුවහොත් ගනුදෙනු ක්‍රියාත්මක නොකෙරේ. ගිණුමේ ශේෂය මෙන්ම අවම ශේෂ අවශ්‍යතා සහ පියවීම් ගිණුම් සීමාව (තිබේනම්) වැනි ගිණුම මත පනවා ඇති වෙනත් නිර්ණායක මත අරමුදල් ලබා ගැනීමේ හැකියාව තහවුරු කරනු ලබයි.

ප්‍රමාණවත් තරම් අරමුදල් පවතී නම්, මූලික ගෙවීම් උපදෙස් වල සඳහන් කර ඇති පරිදි යොමු කරනු ලබන සහභාගිකරුගේ පියවීම් ගිණුම හර කරනු ලබන අතර, ගෙවීම් ලබන සහභාගිකරුගේ පියවීම් ගිණුම බැර කර අදාල ප්‍රතිදාන පණිවිඩය නිකුත් කරනු ලබයි.

### 6.2 පෙළගැස්වීම්

ගෙවීම් සිදු කිරීම සඳහා බලපාන ලෙස අදාල පියවීම් ගිණුමේ ප්‍රමාණවත් තරම් අරමුදල් නොමැති ගෙවීම් උපදෙස් පද්ධතිය තුල පෙළ ගැසේ. එම පියවීම් ගිණුමට අරමුදල් බැර වූ විට අරමුදල් ඇති බවට පරීක්ෂා කර ගැනීම සඳහා පෙළ ගැසුනු ගෙවීම් උපදෙස් පද්ධතිය මගින් නැවත පරීක්ෂා කරනු ලැබේ.

### 6.3 ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ පෝලිම් ක්‍රමය

එක් එක් ගනුදෙනුව සඳහා පවරා ඇති ප්‍රමුඛතාවය මත පදනම්ව සියළු ගෙවීම් උපදෙස් පෙළ ගස්වා ඇති අතර, පවරා ඇති ප්‍රමුඛතාවය තුළ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් පදනම මත අරමුදල් පැවතීම තහවුරු කර ගැනීම සඳහා නැවත යොමු කරනු ලබයි. එනම් සමාන ප්‍රමුඛතාවයක් ඇති සියළුම ගෙවීම් උපදෙස් ඒවා ලැබුණු අනුපිළිවෙල අනුව පෙළ ගැසෙන අතර, එක් එක් සහභාගිකරුගේ පෙළෙහි පැරණිම ගනුදෙනුව අරමුදල් පැවතීම සඳහා පළමුව තහවුරු කරනු ලබයි. අරමුදල් පැවතීම තහවුරු කරනු ලබන්නේ එක් එක් සහභාගිකරුගේ පෙළෙහි පළමු ගනුදෙනුව මගින් පමණි.

පෝලිම් වල ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් අනුපිළිවෙල අභිබවා යා හැක්කේ මෙම වෙළුමෙහි 6.4 රීතියෙහි විස්තර කර ඇති පෙළ කළමනාකරණ පහසුකම් භාවිතයෙන් පමණි.

### 6.4 ගනුදෙනු සඳහා පවරා ඇති ප්‍රමුඛතා

0 ත් 99 අතර පරාසයේ අංක අනුව ගෙවීම් උපදෙස් වලට ප්‍රමුඛතාවයන් පවරා ඇති අතර, ඉහළ ප්‍රමුඛතාවය සඳහා 0 ද පහළම ප්‍රමුඛතාවය සඳහා 99 ද වේ. 0 – 11 ත් අතර ප්‍රමුඛතාවයන් සහ 99 වන ප්‍රමුඛතාව පද්ධතිය සඳහා හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ භාවිතය සඳහා වෙන් කර ඇත. 12 – 98 ත් අතර ප්‍රමුඛතාවයන් සහභාගිකරුවන්ගේ භාවිතය සඳහා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් පැවරුම් සඳහා සෑම අවස්ථාවකදීම ඉහළම ප්‍රමුඛතාවය දෙනු ලැබේ. එක්දින ද්‍රවශීලතා පහසුකමෙහි අරමුදල් නිශ්චිත කාලයක් තුල ලබා දීම සහ නැවත ගෙවීම් තහවුරු කිරීමට එක්දින ද්‍රවශීලතා පහසුකම් ගනුදෙනු සඳහා 5 ක ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දේ.

සහභාගිකරුවෙකු ප්‍රමුඛතා අංකයක් නොමැතිව ගෙවීම් හෝ සුරැකුම්පත් උපදෙසක් ඉදිරිපත් කරයි නම් එයට පෙරනිමි ප්‍රමුඛතාවය වන 98 ලබා දෙනු ලැබේ. එනම් සහභාගිකරුවන්ගේ ගෙවීම් උපදෙස් පෙළෙහි පහළ/ අවසානයේ එය ස්ථානගත කරයි.

### 6.5 පෙළෙහි දැනටමත් ඇති ගෙවීම් වල අනුපිළිවෙල වෙනස් කිරීම

සහභාගිකරුගේ සේවුම් අතුරු මුහුණත් පහසුකම භාවිතා කර පුද්ගල ගෙවීම් ප්‍රමුඛතා කිරීම මගින්, ගෙවීම් යොමු කරනු ලබන සහභාගිවන්නාට පෙළෙහි ඇති ගෙවීම් උපදෙස් වල ප්‍රමුඛතාවය වෙනස් කළ හැක.

ගෙවීම් උපදෙස් ප්‍රමුඛතා පෙළ වෙනස් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට මැදිහත් විය හැක. එය පෙළෙහි අවහිරතා ඉවත් කිරීම සහ පියවීම් ගැටළු නිරවුල් කිරීම සඳහා වන විශේෂ වැඩපිළිවෙලකි.

### 6.6 පෙළෙහි ගෙවීම් අවලංගු කිරීම

ගෙවීම් යොමු කරනු ලබන සහභාගිකරුවෙකුට පෙළෙහි ඇති ඕනෑම ගෙවීම් උපදෙසක් සහභාගිකරුගේ සෙවුම් අතුරු මුහුණත් පහසුකම භාවිතයෙන් අවලංගු කල හැක.

සහභාගිකරුවෙකුට පියවීම් ගිණුම් පැවරීම එම පෙළෙන් අවලංගු කල නොහැක. පියවීම් ගිණුම් පැවරීම අවලංගු කල හැක්කේ ශ්‍රී ලංකා මහ බැංකුවට පමණි.

### 6.7 Gridlock Resolution

පෙළ ගැසී ඇති ගෙවීම් උපදෙස් වල සැලකිය යුතු ප්‍රමාදයන් විසඳා ගැනීම සඳහා වන මෙවලම් සමඟින් ලංකාසෙට්ල් පද්ධතියේ යෙදුම් මෘදුකාංගයේ Gridlock Resolution ව්‍යුහය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතියි.

මෙම ව්‍යුහය මගින්, ප්‍රමාණවත් තරම් අරමුදල් නොමැති වීම නිසා පෙළ ගැසී ඇති ගෙවීම් උපදෙස් වල උප කුලකයක් තෝරා ගැනීම සඳහා ගණිතමය සැකැස්මක් භාවිතා කරයි. මෙමගින්, අවම ගිණුම් ශේෂ සීමාවන් උල්ලංඝණය නොවන පරිදි කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක කල හැකි වන අතර, කණ්ඩායමක් ලෙස පියවීමටද හැකිවේ. Gridlock Resolution සඳහා ගෙවීම් තෝරාගනු ලබන්නේ එක් එක් පියවීම් ගිණුමට අනුරූපීව ඒවා පෙළගැසී ඇති අනුපිළිවෙලටය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති කාලයන් හෝ කාල පරාසයන්හිදී ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වීමට Gridlock Resolution සැලසුම් කර ඇත. එමෙන්ම පියවීම් නොකරන ලද ගෙවීම් උපදෙස් විශාල ප්‍රමාදයක් ඇති විට, ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත් වීමෙන් ශ්‍රමිකව ද එය සිදුකල හැක.

### 6.8 දිනය අවසානයේදී පියවීම් නොකරන ලද ගනුදෙනු සඳහා පිළියම්

පවතින ව්‍යාපාරිකකරන දිනය ගෙවීම් දිනය ලෙස දී ඇති ගෙවීම් උපදෙස්, එම මෙහෙයුම් දිනය අවසානයේදී ගෙවීම් සිදු නොකළ හොත් පද්ධතිය මගින් ප්‍රතික්ෂේප කරනු ලබයි. මෙම ප්‍රතික්ෂේප කිරීම දැනුම් දෙමින් ග්‍රාහකයාට SWIFT පණිවිඩයක් ලැබේ.

## 7. එක්දින ද්‍රවශීලතා පහසුකම (ILF) (එ. ද්‍ර.ප)

### 7.1 දළ විශ්ලේෂණය

තත්කාලීන දළ පියවීම් පද්ධතිය යටතේ සහභාගිකරුවන්ට ඔවුන්ගේ එක්දින ද්‍රවශීල අවශ්‍යතා සපුරා ගැනීමට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුදුසුකම් ලත් සහභාගිවන්නන් සඳහා එක්දින ද්‍රවශීලතා පහසුකම සපයනු ලැබිය හැක. සියළුම අලෙවිකරණ ඍජු සහභාගිවන්නන් සඳහා දෛනික ද්‍රවශීලතා පහසුකම ලබා ගත හැකි අතර ඔවුනට ගනුදෙනු කරන දිනය ඇතුළත එක්දින ද්‍රවශීලතා පහසුකම කිහිපවාරයක්ම ඉල්ලා සිටීමටද ඔවුන්ගේ අභිමතය පරිදි නැවත හරවා යැවීමද කල හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තම අභිමතය පරිදි තීරණය කරනු ලැබුවහොත් පමණක්, නම් කර ඇති තැරැව්කරුවෙකු නොවන ලංසුකරුවෙකුට එ.ද්‍ර.ප. ලබාගත හැක.

ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු මගින් එ.ද්‍ර.ප. සපයනු ලබන අතර යෝග්‍ය සුරැකුම්පත් මගින් එය සම්පූර්ණයෙන්ම සුරක්ෂිත කරනු ලැබේ. එ.ද්‍ර.ප. සඳහා සුදුසුකම් ලබන සහභාගිකරුවෙකු ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එ.ද්‍ර.ප. ගිවිසුමකට එළඹිය යුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් වලට අනුකූල විය යුතුය.

### 7.2 යෝග්‍ය සුරැකුම්පත්

සියළුම නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් සහ නිර්ලේඛන භාණ්ඩාගාර බැඳුම්කර එක්දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම සඳහා යෝග්‍ය සුරැකුම්පත් ලෙස සැලකිය හැක. කෙසේ වෙතත් ශ්‍රී ලංකා මහ බැංකුව තම අභිමතය පරිදි සහභාගිකරුවන්ට දින 7 ක පූර්ව දැනුම් දීමකින් සුරැකුම්පත් වල යෝග්‍යතාවය වෙනස් කල හැකිය. සහභාගිකරුවන් තම එක්දින ද්‍රවශීලතා පහසුකම ලබාගැනීම සඳහා ඇපකර ලෙස යෝග්‍ය නොවන සුරැකුම්පත් ඇතුලත් නොකල යුතුය.

අලෙවිකරණ ඍජු සහභාගිකරුවන් දෛනික ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම සඳහා ඇපකරයක් ලෙස ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ට අයත් සුරැකුම්පත් භාවිතා නොකළ යුතුය.

**7.3 එක්දින ද්‍රවශීලතා පහසුකම් (ILF) ගිවිසුම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති දෛනික ද්‍රවශීලතා පහසුකමට අදාල නියමයන් සහ කොන්දේසි, දෛනික ද්‍රවශීලතා පහසුකම් ගිවිසුමෙහි සවිස්තරව දක්වා ඇති අතර, මෙම රීතීන් සහ දෛනික ද්‍රවශීලතා පහසුකම් ගිවිසුමෙහි ඇතුළත් විධිවිධාන අතර කිසියම් නොගැලපීමක් ඇති වුවහොත්, දෛනික ද්‍රවශීලතා ගිවිසුමෙහි විධිවිධාන වලට පූර්වතාවයක් ලැබේ.

**8. අවම ශේෂ අවශ්‍යතාවය**

ශ්‍රී ලංකා මහ බැංකුවට ඕනෑම අවස්ථාවක සහභාගිකරුවන්ට සාධාරණ දැනුම් දීමකින් පසු ලංකාසෙට්ල් පද්ධතියේ අවම ශේෂ අවශ්‍යතාවයක් පැනවිය හැක. එවැනි අවශ්‍යතාවයක් පැනවූ විටක, ඔවුන්ගේ පියවීම් ගිණුමෙහි ශේෂය නියම කරන ලද අවම ශේෂයට වඩා අඩුකරන ගනුදෙනු පියවීම සිදු නොකරන අතර, එම ගනුදෙනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ පෙළගස්වා තබනු ලැබේ.

**9. බහු පාර්ශවීය ශුද්ධ පියවීම් කාණ්ඩ**

**9.1 තෙවන පාර්ශවීය පියවීමේ වගකීම් වලට අදාල උපදෙස් ක්‍රියාත්මක කිරීමට ඇති බලය**

බලයලත් තෙවන පාර්ශවීය නිශ්කාෂණකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට කෙලින්ම එවනු ලබන හර සහ බැර උපදෙස් ගෙවීම් නිශ්කාෂණ විධිවිධාන යටතේ ඔවුන්ගේ වගකීම් ඉටු කර ගැනීම සඳහා ඔවුන්ගේ පියවීම් ගිණුම් හර හෝ බැර කිරීමට සහභාගිකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ලබා දෙයි. එවැනි උපදෙස් මත ශ්‍රී ලංකා මහ බැංකුව, පියවීම් ගිණුම් වල හර සහ බැර සටහන් තබනු ලබන අතර, කිසියම් තෙවන පාර්ශවීය නිශ්කාෂණය ක්‍රියාකරුවෙකු විසින් කරනු ලබන කිසියම් දෝෂයක් තිබේ නම් එහි වගකීම් භාර නොගනී.

**9.2 ලංකාසෙට්ල් පියවීම් ගිණුම් හරහා ශුද්ධ පියවීම් සිදු කිරීම**

ශුද්ධ පියවීම් කාණ්ඩයක් යනු ගෙවීම් හෝ සුරැකුම්පත් නිශ්කාෂණය පද්ධතියක් පවත්වාගෙන යාමෙන් පැන නගින ශුද්ධ බැඳීම් පියවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලද බහු හර සහ බැර ඇතුලත් පියවීම් ගිණුම් සමූහයකි.

ලංකාක්ලියර් (පුද්) සමාගම (LCPL) විසින් සිදු කරන පහත සඳහන් නිශ්කාෂණය පද්ධති වල ශුද්ධ පියවීම් කාණ්ඩ විධිවිධාන, පියවීම සඳහා දැනට ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කර ඇත.

- ප්‍රධාන චෙක්පත් නිශ්කාෂණය
- ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධති (SLIPS) නිශ්කාෂණය
- ගැලපුම් නිශ්කාෂණය
- පියවීම් නිශ්කාෂණය

මෙයට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවට ස්වකීය අභිමතය පරිදි ඕනෑම නිශ්කාෂණය පියවීමක් අනුමත කල හැකිය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති දෛනික මෙහෙයුම් කාල සටහනේ සඳහන් වන පරිදි ශුද්ධ පියවීම් කාණ්ඩයන් පද්ධතියට මාරු කරනු ලබයි.

**9.3 ප්‍රමාණවත් අරමුදල් නොමැති වීම හේතුවෙන් පියවීම් කාණ්ඩ අත්හිටුවීම හෝ අසාර්ථක වීම**

ශුද්ධ පියවීම් කාණ්ඩයක් ක්ෂණිකව සැකසීමට ඉඩ දීම සඳහා සහභාගිවන්නන් ඔවුන්ගේ පියවීම් ගිණුම් වල ප්‍රමාණවත් අරමුදල් ඇති බව සහතික විය යුතුය. ශුද්ධ නිශ්කාෂණය හර කිරීමක් සහිත ඕනෑම අයෙකු හෝ වැඩි සහභාගීකරුවන් ගණනක් එහි/ ඔවුන්ගේ පියවීම් ගිණුම/ ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් නොමැති අවස්ථාවකදී මුළු කාණ්ඩයම අත්හිටවනු ලබයි. ශුද්ධ හර නිශ්කාෂණය අගයක් සහිත සියළුම සහභාගිකරුවන් ඔවුන්ගේ පියවීම් ගිණුම් වල ප්‍රමාණවත් අරමුදල් පවතින තෙක් නම් ශුද්ධ පියවීම් කාණ්ඩයන්ට අදාළ කිසිදු හර හෝ බැර කිරීමක් කරනු නොලැබේ. ශුද්ධ පියවීම් කාණ්ඩ සඳහා අවශ්‍ය උපදෙස් පද්ධතියට ඇතුළත් කරන විට, සහභාගිකරුගේ ශුද්ධ නිශ්කාෂණය හර ශේෂ කාණ්ඩය පියවීම් සම්පූර්ණ වන තෙක් සහභාගිකරුවන්ගේ පියවීම් ගිණුම් වල ඇති අරමුදල් සලකුණු කිරීමට සහ එම පියවීම් ගිණුම හර කිරීම සඳහා දී ඇති උපදෙස් ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමටත් ශ්‍රී ලංකා මහ බැංකුවට අයිතිය ඇත. RTGS පද්ධතියේ වෙනත් නියමිත ශුද්ධ පියවීම් විධිවිධාන වලට යටත්ව ඕනෑම අවස්ථාවක අසාර්ථක වූ ශුද්ධ පියවීම් කාණ්ඩයක් නැවත ආරම්භ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකිය.

ප්‍රමාණවත් නොවන අරමුදල් හේතුවෙන් ශුද්ධ පියවීම් කාණ්ඩයක් අත්හිටුවන ලද අවස්ථාවකදී, ශ්‍රී ලංකා මහ බැංකුවට සම්බන්ධ කරගත හැකි ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු සෑම සහභාගිකරුවෙකුම නම් කල යුතුය. එසේ දැනුම් දීමෙන් පසු පියවීම සම්පූර්ණ කිරීමට හැකිවන පරිදි සහභාගිකරු සිය පියවීම් ගිණුමට අරමුදල් සම්පාදනය කිරීමට වහාම කටයුතු කල යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් හිඟකම පිළිබඳව සහභාගිකරුට දැනුම් දීම

අනිවාර්ය නොවන අතර, පියවීම් ගිණුමේ අරමුදල් වල ප්‍රමාණාත්මකභාවය සහතික කිරීම සඳහා එක් එක් සහභාගිකරු පූර්ණ වගකීම දරයි.

ව්‍යාපාර කටයුතු අවසන් කරන අවස්ථාව වන විට දී ශුද්ධ පියවීම් කාණ්ඩය අත්හිටුවා තිබේ නම්, එකී කාණ්ඩයේ සියළුම ගනුදෙනු ප්‍රතික්ෂේප කරනු ඇත. සහභාගිවන්නෙකු වසරක් තුල දී එක් වරකට වඩා වැඩි වාර ගණනක් පියවීම් පැහැර හරිනු ලැබුවහොත් අනෙක් සහභාගිකරුවන්ට එවැනි අවශ්‍යතාවයක් පනවා නොමැති වුවද නියමිත වේලාවට නිශ්කාෂණ ශේෂය පියවා ගැනීමේ අරමුණ ඇතිව එවැනි සහභාගිවන්නෙකුට එහි RTGS පියවීම් ගිණුමේ නියමිත අවම ශේෂයක් පවත්වාගැනීම අවශ්‍ය වේ.

### 9.4 පියවීම් ගිණුමේ ප්‍රමාණවත් නොවන අරමුදල් සඳහා පැහැර හැරීමේ ගාස්තු

පියවීමක් අවසන් වන තුරු ශුද්ධ පියවීම් කාණ්ඩයක් සැකසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති දෛනික මෙහෙයුම් කාල සටහනෙහි නියම කර ඇති කාල සීමාව තුල ප්‍රමාණවත් අරමුදල් එහි පියවීම් ගිණුමේ ඇති බව සහතික කිරීම එක් එක් සහභාගිකරුවාගේ වගකීම වේ. අදාල හර කිරීම් සඳහා අවශ්‍ය ශුද්ධ හර පියවීම් අගයක් සහිතව සහභාගිකරුගේ පියවීම් ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් නොතිබුවහොත්, සහභාගිවන්නා පහත සඳහන් පරිදි පැහැර හැරීමේ ගාස්තුවකට යටත් වේ.

පළමු පැයට හෝ එහි කොටසක් සඳහා රු. 100,000/-
දෙවන පැය හෝ එහි කොටසක් සඳහා රු. 200,000/-
අරමුදල් ප්‍රමාණවත් නොවීම පැය දෙකකට වඩා වැඩි නම් රු. 500,000/- ක අතිරේක මුදලක්

### 9.5 පැහැර හැරීමක් සඳහා කාලසීමාව ගණනය කිරීම

ඉහත 9.4 රීතියෙහි දක්වා ඇති පරිදි, පැහැර හැරීමේ ගාස්තුව ගණනය කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාසෙට්ල් පද්ධතියට පියවීම සඳහා නිශ්කාෂණය කාණ්ඩය මුලින්ම ඉදිරිපත් කල වේලාවේ සිට එම කාණ්ඩය පියවීම් කරන වේලාව දක්වා වූ කාලය පැහැර හැරීමේ කාලය ලෙස ගණනය කරනු ලැබේ. කෙසේ වුවද, පැහැර හරින ලද සහභාගිකරු විසින් ඔහුගේ කාණ්ඩය පියවීමට පෙර RTGS පද්ධතියට ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් වලට අමතරව, එහි අසාර්ථක ගෙවීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සිය පියවීම් ගිණුමට ඇතුලත් කර, එම අරමුදල් නඩත්තු කරන්නේ නම් පැහැර හරින ලද කාලය ගණනය කිරීමේදී එම කාලය අතිරේක අරමුදල් සපයන ලද වේලාව දක්වා පමණක් වන ලෙස සලකයි.

### 9.6 පියවීම් ගිණුමට පැහැර හරින ලද ගාස්තු හර කිරීම

කිසියම් ව්‍යාපාරික දිනකට අදාල ප්‍රමාද ගාස්තු පැහැර හරින ලද දිනට පසු එළඹෙන ව්‍යාපාරික දිනයේදී ශුද්ධ පියවීම් කරන ලද කාණ්ඩ පියවීම සඳහා ප්‍රමාණවත් අරමුදල් පවත්වා ගැනීමට අසමත් වූ සහභාගිවන්නාගේ ගිණුම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හර කර, ශ්‍රී ලංකා මහ බැංකු ගිණුම බැර කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එසේ අය කරගන්නා ලද පැහැර හරින ලද ගාස්තු වලින් 10% ක් පරිපාලන ගාස්තුවක් ලෙස තබා ගන්නා අතර ඉතිරිය බැංකුකරුවන්ගේ පුහුණු කටයුතු සඳහා උපයෝගී කරගත හැක. ඒ සඳහා සීමාසහිත ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය විසින් අනුමත කර ඇති අයදුම්පතක් මගින් ඉල්ලීම් කිරීමෙන් පසු මුදල් මණ්ඩලයේ අනුමැතියට යටත්ව ගෙවනු ලබයි.

පැහැර හැරීමක් වෙනුවෙන් නියම කළ ඕනෑම දඩයක්, යම් සහභාගිකරුවෙකු විසින් ශුද්ධ පියවීම් කාණ්ඩයේ වගකීමක් පියවීමට අපොහොසත් වීම නිසා ඇති වන්නාවූ ඕනෑම අධිකරණ ක්‍රියාමාර්ගයක්, නඩුකරයක් හෝ අධිකරණ කටයුත්තකදී ශ්‍රී ලංකා මහ බැංකුව හෝ සහභාගිවන්නකු හෝ සතු හිමිකම හෝ අයිතිය ක්‍රියාවේ යෙදවීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුව හෝ එම සහභාගිවන්නා හෝ වළක්වන්නක් හෝ එම හිමිකමේ හෝ අයිතියේ අගය පහත හෙලන්නක් හෝ එයට ආදේශකයක් වන්නක් හෝ නොවිය යුත්තේය.

## 10. අන්තර් පාර්ශවීය ඉදිරි දාතම් අගය/ එක්දින පියවීම් සහිත ගනුදෙනු

### 10.1 ඉදිරි දාතම් කල ගනුදෙනු

ඉදිරි දාතම් කල අගයන් සඳහා සහභාගිකරුවන් අතර එළඹෙන මුදල් වෙළඳපොළ සහ විදේශ විනිමය ගනුදෙනු (රුපියල් කොටස) ලංකාසෙට්ල් පද්ධතියේ අදාල අගය පියවිය යුතු දිනයේ කල්වේලා ඇතිව පියවිය යුතුය. ඒ අනුව ගෙවීම් කරන පාර්ශවයන් විසින් එකී ගනුදෙනු පියවීම් දිනයේ පෙ. ව. 10.00 වන විට පියවීමට වග බලාගත යුතුය.

**10.2 එකම දින පියවන ගනුදෙනු**

මුදල් වෙළඳපොළ හා විදේශ විනිමය ගනුදෙනු (රුපියල් කොටස) සඳහා එකම දිනයේ පියවෙන ගනුදෙනු ලංකාසෙට්ල් පද්ධතිය තුළදී එකී ගනුදෙනු පද්ධතියට ලැබී පැය 2ක් ඇතුලත පියවීමට ගෙවීම් කරන සහභාගිකරුවන් විසින් වගබලා ගත යුතුය.

**11. ව්‍යාපාර අඛණ්ඩතාව සහ සුරක්ෂිතභාවය**

ලංකාසෙට්ල් පද්ධතිය සඳහා ආපදා ප්‍රතිප්‍රාප්ති මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙන් භූගෝලීය ලෙස වෙන් වූ ස්ථානයක පිහිටා ඇත. ලංකාසෙට්ල් පද්ධතියෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සියළු තීරණාත්මක තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා නිරන්තරයෙන් පරීක්ෂා කරනු ලබයි. ප්‍රධාන පරිශ්‍රයෙහි මෙහෙයුම් බිඳ වැටීමකදී සහභාගිකරුවෙකුට දැනුම් දී පැය 2ක් ඇතුළත ලංකාසෙට්ල් පද්ධතියේ ආපදා ප්‍රතිප්‍රාප්ති මධ්‍යස්ථානයට අදාල මෙහෙයුම් කටයුතු මාරු කල හැක.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමෙහි උපදේශයන්ට අනුකූලව අඛණ්ඩ මෙහෙයුම් සහතික කිරීම සඳහා සෑම සහභාගිකරුවෙක්ම ආපදා ප්‍රතිප්‍රාප්ති මධ්‍යස්ථානයක් පිහිට විය යුතු අතර, අවිනිශ්චිත සිදුවීමකදී අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටි පැහැදිලි කරමින් ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ලේඛනයක් සකස් කල යුතුය.

3 වන වෙළුම

## ලංකාසෙක්‍යු පද්ධතිය

## (නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය සහ මධ්‍යම තැන්පතු පද්ධතිය)

පටුන


1. පද්ධති විශ්ලේෂණය ...... 29A
   - 1.1 ලංකාසෙක්‍යු පද්ධතියේ ව්‍යුහය, කාර්යයන් සහ ක්‍රියාකාරීත්වය ...... 29A
   - 1.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය ...... 29A
2. සහභාගිකරුවන් සහ භාරකාරත්වයේ වගකීම් ...... 29A
   - 2.1 සහභාගිකරුවන් ...... 29A
   - 2.2 භාරකාරත්වයේ වගකීම් ...... 30A
3. නිර්ලේඛිත සුරැකුම්පත් ...... 32A
   - 3.1 සුරැකුම්පත් නිර්ලේඛිත ස්වරූපයෙන් නිකුත් කිරීම සඳහා පවතින ව්‍යවස්ථාදායක අධිකාරිය ...... 32A
   - 3.2 ලංකාසෙක්‍යු පද්ධතියේ පවතින සුරැකුම්පත් ...... 32A
     - 3.2.1 භාණ්ඩාගාර බිල්පත් ...... 32A
     - 3.2.2 භාණ්ඩාගාර බැඳුම්කර ...... 32A
     - 3.2.3 මහ බැංකු සුරැකුම්පත් ...... 32A
   - 3.3 ලේඛිත සුරැකුම්පත්හි සහපැවැත්ම ...... 32A
   - 3.4 ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය International Securities Identification Number (ISIN) ...... 32A
   - 3.5 ඒකක ප්‍රමාණය සහ අලෙවි කල හැකි අවම කොටස් ...... 33A
4. සුරැකුම්පත් ගිණුම් ...... 33A
   - 4.1 ගිණුම් නිර්වචනයන් සහ සැකැස්ම ...... 33A
   - 4.2 ලංකාසෙක්‍යු පද්ධතිය තුළ පවතින ගිණුම් වර්ගීකරණයන් ...... 34A
   - 4.3 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රති විකුණුම් ගනුදෙනු වාර්තාකරණයට අදාල විශේෂ මාර්ගෝපදේශයන් ...... 36A
     - 4.3.1 සහභාගිකරුවන් දෙදෙනෙකු අතර සිදුවන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුව ...... 36A
     - 4.3.2 සහභාගිකරුවන් දෙදෙනෙකුගේ ගනුදෙනුකරුවන් දෙදෙනෙකු අතර සිදුවන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුව ...... 36A
     - 4.3.3 සහභාගිකරුවෙකු සහ ඔහුගේ ගනුදෙනුකරුවෙකු අතර සිදුවන ප්‍රති මිලදි ගැනීමේ ගනුදෙනුව ...... 37A
     - 4.3.4 සහභාගිකරුවෙකු සහ ඔහුගේ ගනුදෙනුකරුවෙකු අතර සිදුවන ප්‍රති විකුණුම් ගනුදෙනුව ...... 38A
     - 4.3.5 එක් සහභාගිකරුවෙකුගේ ගනුදෙනුකරුවන් දෙදෙනෙකු අතර සිදුවන ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුව ...... 38A
5. වෙළඳ ගනුදෙනු සැකසුම සහ පියවීම ...... 39A
   - 5.1 ලංකාසෙක්‍යු පද්ධතියේ කාර්යභාරය ...... 39A
   - 5.2 ගනුදෙනු වර්ග ...... 39A
   - 5.3 සහභාගිකරුවන්ගේ සුරැකුම්පත් ගිණුම් අතර හුවමාරු වීම් ...... 39A
   - 5.4 පණිවුඩ යැවීමේ ක්‍රියාවලිය ...... 39A
   - 5.5 ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මූල්‍ය සන්නිවේදන සංගමය (SWIFT) විසින් සහභාගිකරුවන් සඳහා දෙන ලද බැංකු හඳුනාගැනීමේ කේත අංකයන් (BIC) ...... 40A
   - 5.6 SWIFT පණිවුඩ සඳහා වන දත්ත අවශ්‍යතාවයන් ...... 40A
   - 5.7 වෙළඳ නියමයන් පිළිබඳ ගිවිසුම සඳහා අනුගමනය කළයුතු සුරැකුම්පත් උපදෙස් ...... 40A
   - 5.8 ඉදිරි දාතම ගනුදෙනු ...... 40A
   - 5.9 වෙළඳ ගනුදෙනු ගැලපීම ...... 40A
   - 5.10 ප්‍රති මිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු ...... 41A
   - 5.11 උපදෙස් අවලංගු කිරීම ...... 41A
   - 5.12 ගෙවීමට එදිරිව මුදා හැරීමේ/පියවීමේ ක්‍රියාවලිය ...... 41A
   - 5.13 ගනුදෙනු වාර්තාකරණයට අදාල විශේෂ උපදෙස් ...... 43A
   - 5.14 ලංකාසෙක්‍යු පද්ධතිය තුළ පෙළගැසීම් ...... 44A

5.15 ලංකාසෙක්‍යු පද්ධතියෙහි ජාල හිරවීම සඳහා විසඳුම (Gridlock Resolution) ......................... 44A
5.16 දවස අවසාන වන විට ලංකාසෙක්‍යු තුළ නොපියවුණු ගනුදෙනු සඳහා පිළියම 44A

6. ප්‍රාථමික වෙන්දේසි.............................................................................................................................. 44A
6.1 ප්‍රාථමික වෙන්දේසි පද්ධතිය සමග ලංකාසෙක්‍යු පද්ධතියේ අන්තර් ක්‍රියාකාරීත්වය 44A
6.2 ප්‍රාථමික වෙන්දේසි පියවීම .............................................................................................. 45A
6.3 ප්‍රාථමික වෙන්දේසි පියවීමට ක්‍රියා නොකිරීම .......................................................................... 45A

7. කල්පිරීම් ගෙවීම .................................................................................................................................. 45A
7.1 කල්පිරීමේ වටිනාකම් ගෙවීමේ ක්‍රියාවලිය .............................................................................. 45A
7.2 කල් පිරීමට පෙර පියවීමේ විකල්පය සහිත සුරැකුම්පත් ........................................................... 45A
7.3 කල්පිරීමේ දිනය බැංකු නිවාඩු දිනයක් වීම ................................................................................... 45A
7.4 කල්පිරීමේ ගෙවීම් ගනුදෙනුකරුවන් වෙත ගෙවීම සම්බන්ධයෙන් සහභාගිකරුගේ වගකීම් ...................................................................................................................................... 46A
7.5 ගනුදෙනුකරුවන්ට කල් පිරීමේ මුදල් ගෙවීමට නොහැකි වීම ............................................... 46A

8. පොලී ගෙවීම ....................................................................................................................................... 46A
8.1 පොලී ගෙවීම් ක්‍රියාවලිය ...................................................................................................... 46A
8.2 නිවාඩු දිනයන්වලට යෙදෙන පොලී ගෙවීම ........................................................................... 46A
8.3 වාර්තාගත හිමිකමට අනුව පොලී ගෙවීම ............................................................................... 46A
8.4 ගනුදෙනුකරුවාට අයත් පොලී ගෙවීමේදී සහභාගිකරුගේ වගකීම ......................................... 46A
8.5 ගනුදෙනුකරුට පොලී ගෙවීමට නොහැකි වීම ......................................................................... 47A

9. ගනුදෙනුකරුවන්ගේ ප්‍රකාශන .............................................................................................................. 47A
9.1 ගනුදෙනුකරුවන්ගේ තොරතුරු වාර්තාගත කිරීම ………………………………………… 47A
9.2 ගනුදෙනුකරුවන්ගේ හිමිකම් සහ ගනුදෙනු සම්බන්ධ ප්‍රකාශනය ……………………..........…. 48A
9.3 ගනුදෙනුකරුවන්ගේ පොලිය සහ කල්පිරීම සම්න්ධ ප්‍රකාශනය …………………………...... 48A
9.4 සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධ කෙටි පණිවිඩ/ විද්‍යුත් තැපැල හරහා දැනුම් දීම 48A
9.5 ලිපිනයන් වැරදි ලෙස වාර්තා වීම …………………………………………………….…… 49A

10. ඔඩපන කිරීම් ……………………………………………………………………….....…….. 49A
10.1 ඔඩපන සටහන් කිරීම ……………………………………………………………………. 49A
10.2 ඔඩපන ප්‍රකාශන සහ තහවුරු කිරීම් …………………………………………………..…… 51A
10.3 ඔඩපන බලාත්මක කිරීම සඳහා සහභාගිකරුවන්ගේ වගකීම …………………………......… 51A

11. එක්දින ද්‍රවශීලතා පහසුකම……………………………………………………………..........…… 51A
11.1 එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි ක්‍රියාකාරිත්වය ……………………………………………..…. 51A
11.2 එක් දින ද්‍රවශීලතා පහසුකම සඳහා යෝග්‍ය සුරැකුම්පත් ………………………………..…… 51A
11.3 එක් දින ද්‍රවශීලතා රීති උල්ලංඝනයට අදාල වන දඩ ……………………………......... 51A
11.4 සහභාගිකරුවන් විසින් හසුරුවා ගනු ලබන එක් දින ද්‍රවශීලතා පහසුකම ………................…. 51A
11.4.1. එක් දින ද්‍රවශීලතා පහසුකම සඳහා කාල සීමාව දීර්ඝ කිරීම …………………… 52A

1. **පද්ධති විශ්ලේෂණය**

1.1 **ලංකාසෙක්‍යු පද්ධතියේ ව්‍යුහය, කාර්යන් සහ ක්‍රියාකාරීත්වය**

ලංකාසෙක්‍යු පද්ධතිය, ලංකාසෙට්ල් පද්ධතියෙහි අත්‍යාවශ්‍ය අංගයකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතට අනුව ලංකාසෙක්‍යු පද්ධතිය ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. ලංකාසෙක්‍යු පද්ධතිය පහත සඳහන් කාර්යන් ඉටු කිරීම සඳහා තත්කාලීන දළ පියවුම් (RTGS) පද්ධතිය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වේ.

- විද්‍යුත් මාධ්‍යයෙන් රජයේ සුරැකුම්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම (නිර්ලේඛිත සුරැකුම්පත්);
- හිමිකම පිළිබඳ මධ්‍යගත වූ වාර්තාකරණයක් පවත්වාගෙන යාම;
- තත්කාලීන දළ පියවුම් (RTGS) පද්ධතියේ ඇති සහභාගිකරුවන්ගේ පියවීම් ගිණුම් හරහා පොලී සහ කල්පිරීම් ගෙවීම්;
- සුරැකුම්පත් ගනුදෙනු පියවීම, ගෙවීමට එදිරිව මුදා හැරීමේ (DVP) පදනම මත සිදුවීම, එනම් සුරැකුම්පත් හුවමාරු වීම සහ අරමුදල් පියවීම සිදුවන්නේ සහභාගිකරුවන්ගේ අදාල ගිණුම් වල සුරැකුම්පත් සහ අරමුදල් පවතින්නේ නම් පමණි;
- මුදල් ලැබීමක් නොමැතිව මුදා හැරීම/ මුදල් ලැබීමක් නොමැතිව ලබා ගැනීම පදනම මත ගිණුම් අතර සුරැකුම්පත් හුවමාරු කිරීම; සහ
- හිමිකාරීත්වය සහ අයිතියේ අරමුණ අනුව බෙදා දැක්වීම සඳහා ඉඩ ලබාදීමට සුරැකුම්පත් ගිණුම් සඳහා ප්‍රතිපාදන සැලසීම.

ලංකාසෙට්ල් පද්ධතියේ සමස්ත සැකැස්ම පළමු වන වෙළුමෙන් විස්තර කෙරේ. ලංකාසෙක්‍යු පද්ධතියේ ප්‍රධාන අංගයන් වනුයේ:

- නිර්ලේඛිත සුරැකුම්පත් ගනුදෙනු පියවීම සඳහා පහසුකම් සපයනු ලබන නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය (SSSS) ;
- නිර්ලේඛිත සුරැකුම්පත් වල හිමිකම (අයිතිය) වාර්තා කරනු ලබන මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS);
- සුරැකුම්පත් ගනුදෙනු උපදෙස් හුවමාරු කෙරෙන ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මූල්‍ය සන්නිවේදන සංගමයේ මූල්‍ය තොරතුරු ජාලය (SWIFT FIN);
- සහභාගිකරුවන් හට විමසීම් සහ පෙළ ගැසී ඇති ගනුදෙනු උපදෙස් කළමනාකරණය කර ගැනීමට පහසුකම් සපයනු ලබන බ්‍රව්සර් අතුරු මුහුණත් පහසුකම;
- බ්‍රව්සර් අතුරු මුහුණත ලංකාසෙක්‍යු පද්ධතියට සම්බන්ධ කරනු ලබන CBSL Net පුළුල් පරාස ජාලය (Wide Area Network); සහ
- ලංකාසෙක්‍යු ගනුදෙනු වල ගෙවීම් පාදය හැසිරවීම සිදු කරනු ලබන තත්කාලීන දළ පියවුම් (RTGS) පද්ධතියට සම්බන්ධ අතුරු මුහුණත

1.2 **ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය**

ශ්‍රී ලංකා මහ බැංකුව ලංකාසෙක්‍යු පද්ධතිය තුළ පහත සඳහන් කාර්යභාරයන් සිදු කරනු ලබයි.

- ලංකාසෙක්‍යු පද්ධති ක්‍රියාකරු වශයෙන් කටයුතු කිරීම;
- නිර්ලේඛිත ආකාරයට නව සුරැකුම්පත් නිකුත් කිරීම පරිපාලනය කිරීම, ප්‍රාථමික වෙන්දේසීන් පැවැත්වීම සහ රජයේ සුරැකුම්පත් සඳහා ගෙවිය යුතු පොලී සහ කල්පිරීමේ වටිනාකම් ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම;
- නිර්ලේඛිත ආකාරයට මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරන්නා ලෙස කටයුතු කිරීම;
- විශේෂයෙන්ම විවට වෙළඳපොළ කටයුතු පැවැත්වීමට අදාලව රජය විසින් නිකුත් කරනු ලබන නිර්ලේඛිත සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු කිරීම සහ පියවීමේ අයිතියට අදාල ප්‍රතිපාර්ශවය ලෙස කටයුතු කිරීම;
- එක් දින ද්‍රවශීලතා පහසුකම හරහා සහභාගිකරුවන් හට ද්‍රවශීලතා පහසුකම් සපයන්නා ලෙස කටයුතු කිරීම; සහ
- දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත (LTBO) සහ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනතට (RSSO) අනුව රජයේ සුරැකුම්පත් සහ ඒවායෙහි සහභාගිකරුවන් සඳහා වෙළඳපොළ නියාමක සහ තැන්පතු පහසුකම් සපයන්නා ලෙස කටයුතු කිරීම. ලංකාසෙක්‍යු පද්ධතිය තුළ සහභාගිකරුවන්ගේ ගනුදෙනු පරීක්ෂා කිරීම සහ ප්‍රාථමික අලෙවිකරුවන් හා ඍජු අලෙවි සහභාගිකරුවන් අධීක්ෂණය කිරීම මෙම කාර්යභාරයට ඇතුළත් වේ.

2. **සහභාගිකරුවන් සහ භාරකාරත්වයේ වගකීම්**

2.1 **සහභාගිකරුවන්**

දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතේ (LTBO) සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතේ (RSSO) විධිවිධාන යටතේ “ඍජු සහභාගිකරුවන්” ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත්කරන ලද සහභාගිකරුවන් හට ලංකාසෙක්‍යු පද්ධතියේ සහභාගිත්වය ලබා ගත හැකිය. සෑම සහභාගිකරුවෙක්ම වෙළුම 01 හි 2.8 වගන්තියේ සඳහන් පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ගිවිසුම් වලට එළඹිය යුතු වන අතර SWIFT ජාලයේ දායකත්වය ලබා ගැනීමද අවශ්‍ය වේ.

ලංකාසෙක්‍යු පද්ධතිය පහත පරිදි තනි ස්ථරයේ සාමාජිකත්වයක් මත ක්‍රියාත්මක වීමට ව්‍යුහගත කර ඇත:

- පද්ධතියට ප්‍රවේශ වීම සහභාගිකරුවන් හට පමණක් සීමා වේ.
- සෑම සහභාගිකරුවෙකුටම තත්කාලීන දල පියවුම් (RTGS) පද්ධතියේ පියවීමේ ගිණුමක් හා ලංකාසෙක්‍යු පද්ධතියේ සුරැකුම්පත් ගිණුමක් ඇත.

පොදුවේ, සියළුම සහභාගිකරුවන් එකම පද්ධති පහසුකම් භාවිතා කළ යුතුය. මෙම පොදු තත්ත්වය සඳහා ව්‍යාතිරේක වනුයේ:

- LTBO සහ RSSO යටතේ පත්කරන ප්‍රාථමික අලෙවිකරුවන් LTBO සහ RSSO හි විධිවිධාන යටතේ නිකුත් කරන ලද රෙගුලාසි වලින් බලය පවරන ලද ක්‍රියාකාරකම් වලට අනුකූලව කටයුතු කිරීම සඳහා පමණක් ලංකාසෙට්ල් පද්ධතිය භාවිතා කළ යුතුය;
- රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා පවත්වනු ලබන ප්‍රාථමික වෙන්දේසි වලට, LTBO සහ RSSO යටතේ පත් කරන ලද, ප්‍රාථමික අලෙවිකරුවන් සහ මහ බැංකුව විසින් නම් කරන ලද අලෙවිකරුවන් නොවන ලංසු තබන ආයතන වලට පමණක් සහභාගි විය හැකිය; සහ
- LTBO සහ RSSO යටතේ සෘජු අලෙවි සහභාගිකරුවන් (ප්‍රාථමික වෙළඳුන් ඇතුළුව) ලෙස පත් කර ඇති ආයතන වලට පමණක් අනෙකුත් අය වෙනුවෙන් සුරැකුම්පත්හි ගනුදෙනු කිරීමට හැකියාව ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවට සිය අභිමතය පරිදි තනි හෝ සහභාගිකරුවන් කාණ්ඩ සඳහා පද්ධති ක්‍රියාකාරීත්වයන්ට ඇති ප්‍රවේශයන් සීමා කළ හැකිය.

## 2.2 භාරකාරත්වයේ වගකීම්

සෘජු අලෙවි සහභාගිකරුවන්, සෘජු අලෙවි සහභාගිකරුවෙකු ලෙස තම ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අදාල නීති, රෙගුලාසි සහ විධාන වලට අනුකූල විය යුතුය.

සෘජු අලෙවි සහභාගිකරුවන් ලංකාසෙක්‍යු පද්ධතිය තුළ ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ භාරකරුවන් ලෙස කටයුතු කළ යුතුයි. මෙම භාරකාරත්වය පහත සඳහන් වගකීම් දරයි.

2.2.1 ලංකාසෙක්‍යු පද්ධතිය තුළ සිටින ගනුදෙනුකරුවන්ගේ සුරැකුම්පත්හි නීත්‍යානුකූල හිමිකම ලබා ගන්නා විට, එම සෑම ගනුදෙනුකරුවෙකුගේම නම, වලංගු තැපැල් ලිපිනය, සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ සමාගම් ලියාපදිංචි අංකය හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වෙනත් හඳුනාගැනීමේ ලේඛනයක අංකය අනිවාර්ය පදනම යටතේ වහාම සහ නිවැරදිව (ස්ථාවර දුරකථන අංකය) වාර්තා කළ යුතුය. තවද එම අවස්ථාවේදීම වලංගු විද්‍යුත් තැපැල් ලිපිනය සහ වලංගු ජංගම දුරකථන අංකයක්ද (අන්තර්ජාතික දුරකථන අංක ආකෘතියට අනුව , උදා: 94nnnnnnnnn) පහත 2.2.1.1 හා 2.2.1.2 ට යටත්ව වාර්තා කල යුතුය.

2.2.1.1 ලංකාසෙක්‍යු පද්ධතියෙහි, සියළුම සෘජු අලෙවි සහභාගිකරුවන් විසින් තමන්ගේ සෑම ගනුදෙනුකරුවෙක්ගෙන්ම තත්කාලීන දැනුම්දීමේ මාධ්‍යය, තමන්ගේ මනාපය පරිදි කවරක්ද යන්න ලිඛිතව තහවුරු කර ගැනීම අත්‍යාවශ්‍යවේ. තත්කාලීන දැනුම්දීමේ මාධ්‍යය “Email” (විද්‍යුත් තැපෑල) “SMS” (Short Message Service) (කෙටි පණිවිඩ) “Email & SMS (විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවිඩ) හෝ “None” ගනුදෙනුකරුවන් විද්‍යුත් තැපෑල හෝ කෙටි පණිවිඩ සේවාව යන කිසිදු මාධ්‍යයක් හරහා තත්කාලීන දැනුම්දීම් ලැබීමට අදහස් නොකරන බව ‘None’ යන විකල්පයෙන් අර්ථගැන්වේ.) යන විකල්ප යටතේ ලංකාසෙක්‍යු පද්ධතියෙහි වාර්තා විය යුතුය. ඉහත සඳහන් කල ගනුදෙනුකරුවාගේ තත්කාලීන දැනුම්දීමේ මාධ්‍ය තහවුරු කිරීමේ ලේඛණය ඉදිරි භාවිතයන් සඳහා සංරක්ෂණය විය යුතුය.

2.2.1.2 දැනුම් දීමේ මාධ්‍යය ලෙස ‘SMS’ විකල්පය තෝරා ගැනුනු අවස්ථාවකදී, වලංගු ජංගම දුරකථන අංකයක්ද, ‘Email’ විකල්පය තෝරා ගැනුනු අවස්ථාවකදී වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයක්ද ‘Email & SMS’ විකල්පය තෝරා ගැනුනු අවස්ථාවකදී වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයක් සහ දුරකථන අංකයක් යන දෙකමද වාර්තා කල යුතුය.

2.2.1.3 මධ්‍යම තැන්පතු පද්ධතිය මගින් තැපැල්/විද්‍යුත් තැපැල් ලිපිනය ගිණුම් ප්‍රකාශන ගනුදෙනුකරුවන් වෙත යැවීම සඳහාද ලංකාසෙක්‍යු පද්ධතියෙහි ඇති සෑම සුරැකුම්පත් ගිණුමකටම අදාලව සිදුවන සෑම නිර්ලේඛන සුරැකුම්පත් හර හා බැර සටහනක්ම විද්‍යුත් තැපෑල (E-mail)/කෙටිපණිවිඩ සේවාව (SMS) හරහා තත්කාලීනව දැනුම් දීම සඳහාද භාවිතා කරයි.

2.2.2 ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවක කාල සීමාව තුලදී ඕනෑම මොහොතකදී ඊට අදාල ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම, (Master Repurchase Agreement-MRA) ගනුදෙනුකරුවන් / සහභාගිකරුවන් දෙන ලද උපදෙස් සහ අදාළ අනෙකුත් ගිවිසුම් වලට අනුව, සහභාගිකරු විසින්;

2.2.2.1. ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිමිලදී ගැනීම් (ගනුදෙනු කළ හැකි) ගිණුමකදී (RET) හෝ සහභාගිකරු ප්‍රතිමිලදී ගැනීම් (ගනුදෙනු කළ හැකි) ගිණුමක දී (PRT) සිදු කරන ලද ආයෝජනයට ප්‍රමාණවත් සුරැකුම්පත් ශේෂයන් පවත්වා ගත යුතුය (ආදේශ කිරීමෙන් හෝ නැවත පිරවීමෙන්). මෙහිදී, වෙන් කරන ලද සුරැකුම්පත්හි වෙළඳ වටිනාකම ගැළපීම ප්‍රතිමිලදී ගැනීම්, ප්‍රතිවිකුණුම් ගනුදෙනුවලට

අදාළව බලපැවැත්වෙන පරිදි නිකුත් කර ඇති රෙගුලාසි, විධාන, මාර්ගෝපදේශයන්ට අනුව සිදුවිය යුතුය.

2.2.2.2. ගනුදෙනුකරුවන්ගෙ ප්‍රතිමිලදී ගැනීම් (ගනුදෙනු කළ නොහැකි) (REN) ගිණුමකදී හෝ සහභාගිකරු ප්‍රතිමිලදී ගැනීම් (ගනුදෙනු කළ නොහැකි) ගිණුමකදී (PRN)

(a) අදාල සුරැකුම්පත් සරිලන ප්‍රමාණයක් මගින් පිරවීමෙන් හෝ

(b) අදාල සුරැකුම්පත් සරිලන ප්‍රමාණයන් නොමැති අවස්ථාවන් හී දී ඒ හා සමාන වූ සුරැකුම්පතක සරිලන ප්‍රමාණයක් මගින් පිරවීමෙන් සිදු කරන ලද ආයෝජනයට ප්‍රමාණවත් සුරැකුම්පත් ශේෂයන් පවත්වා ගත යුතුය. මෙහිදී, වෙන් කරන ලද සුරැකුම්පත්හි වෙළඳ වටිනාකම ගැළපීම ප්‍රතිමිලදී ගැනීම්, ප්‍රති විකුණුම් ගනුදෙනු වලට අදාළව බලපැවැත්වෙන පරිදි නිකුත් කර ඇති රෙගුලාසි, විධාන, මාර්ගෝපදේශයන්ට අනුව සිදුවිය යුතුය.

2.2.3 සුරැකුම්පත්හී හිමිකාරීත්වය, හිමිකාරීත්වයේ වෙනස්කම් හෝ සුරැකුම්පත් හිමිකරුගේ විස්තර ලංකාසෙක්‍යු පද්ධතියේ වහාම හා නිවැරදිව වාර්තා කළ යුතුය. එසේ වාර්තා කිරීමට අසමත් වුවහොත් ශ්‍රී ලංකා මහ බැංකුව සිය අභිමතය පරිදි මෙම වෙළුමෙහි 2.2.4 වගන්තියේ දක්වා ඇති අය කිරීම්/ නියාමන ක්‍රියාමාර්ගයන් අලෙවිකරණ ඍජු සහභාගිකරුවන් මත පනවනු ලැබිය හැකිය.

2.2.4 ඉහතින් දක්වා ඇති තත්වයන්ට අගති රහිත වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවට පහත දැක්වෙන පියවර අනුගමනය කළ හැකිය.

| ***අනුකූල නොවන වාර ගණන*** | ***ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාව*** |
|---|---|
| 1 වන අවස්ථාව | දැඩි ලිඛිත අවවාද කිරීම් |
| 2 වන අවස්ථාව | එක් ගනුදෙනුවකට රු. 25,000/- හෝ ගනුදෙනුවක මුහුණත වටිනාකමින් 1% හෝ වන දෙකෙන් වඩා ඉහළ වටිනාකමක් අය කිරිම |
| 3 වන අවස්ථාව | එක් ගනුදෙනුවකට රු. 50,000/- හෝ ගනුදෙනුවක මුහුණත වටිනාකමින් 2% හෝ වන දෙකෙන් වඩා ඉහළ වටිනාකමක් අයකිරීම |
| අවස්ථා 3 කට වැඩි වාර ගණනක දී | බලපත්‍රලාභී වාණිජ බැංකුවක් නම් අලෙවිකරණ ඍජු සහභාගිකරු තත්වය සහ ප්‍රාථමික අලෙවිකරුවකු නම් ප්‍රාථමික අලෙවිකරු තත්වය අත්හිටුවීම ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන දැඩි නියාමන ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලද කාල සීමාවකට පැනවීම |

2.2.4.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අය කිරීම් සඳහා තීන්දුව ගත් දිනට පසුව එළඹෙන ඊළඟ කාර්යාලීය දිනයේදී එසේ අයකරනු ලබන මුදල පියවීම් ගිණුමෙන් හර කර ගනු ලබන අතර ශ්‍රී ලංකා මහ බැංකු ගිණුමට බැර කර ගනු ලැබේ. සහභාගිවන්නන්ගේ පියවීමේ ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් නොමැති අවස්ථාවකදී එම අයකරනු ලබන මුදල් අය කිරීමේ තීරණය දැනුම් දුන් දින සිට ව්‍යාපාරික දින 3 ක් ඇතුළත සහභාගිකරුවන් විසින් ගෙවිය යුතුයි.

2.2.4.2 එසේ බැර කරන ලද සෑම අය කිරීමකම 10% ශ්‍රී ලංකා මහ බැංකු පරිපාලන ගාස්තුවක් ලෙස අඩු කරනු ලැබේ. ඉතිරි මුදල්, ශ්‍රී ලංකා මහ බැංකු මුදල් මණ්ඩලයේ අනුමැතියට යටත්ව බැංකු හා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා භාවිතා වේ. එම පුහුණු කිරීම් සඳහා සහභාගිකරුවන්, අදාල වන පරිදි ශ්‍රී ලංකා බැංකු සංගමයේ (සහතික) සමාගම සහ/ හෝ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය, මගින් අයදුම්පතක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එවිය යුතුය.

2.2.4.3 සුරැකුම්පත් වල හිමිකාරත්වය, හිමිකාරත්වයේ වෙනස්කම් හෝ සුරැකුම්පත් හිමියන්ගේ විස්තර වාර්තා කිරීමට අපොහොසත් වීම, ගනුදෙනු වාර්තා නොකිරීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවන් වෙත පනවන ලද ඉහත සඳහන් කිසිදු අයකිරීමක්, සහභාගිකරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම, නඩු ගොනු කිරීම, නඩු කටයුතු පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතු හෝ සතුවිය හැකි අයිතිවාසිකමක් හෝ හිමිකමක් අවලංගු කිරීමක්, වැළැක්වීමක් සඳහා ආදේශ නොකළ යුතුය.

2.2.5. සහභාගිකරුවන්ගේ ගනුදෙනුකරුවන් හට නියමිත පොලී මුදල් හෝ උත්පාදන (කල් පිරීමේ වටිනාකම) ඒ සම්බන්ධයෙන් නිකුත් කර ඇති විධාන වලට අනුකූලව ගිණුම්ගත කිරීම හා ගෙවීම.

2.2.6. සහභාගිකරුවන් විසින් ඔවුන්ගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් ගනුදෙනු කිරීම, ගනුදෙනුකරුවන්ගෙන් ඒ සඳහා ලැබෙන උපදෙස් අනුව පමණක් සිදුකල යුතු අතර, එම උපදෙස් නීත්‍යානුකූල, එනම් මෙම පද්ධති රීති උල්ලංඝනය නොකරන උපදෙස් විය යුතුය.

ගනුදෙනුකරුවන්ගේ සුරැකුම්පත් පැවරීමේදී සෘජු අලෙවි සහභාගිකරුවන් විසින් ගනුදෙනුකරුවන්ගේ උපදෙස් වලට දැඩිලෙස අනුකූල විය යුතුය.

## 3. නිර්ලේඛිත සුරැකුම්පත්

### 3.1 සුරැකුම්පත් නිර්ලේඛිත ස්වරූපයෙන් නිකුත් කිරීම සඳහා පවතින ව්‍යවස්ථාදායක අධිකාරිය

ලංකාසෙක්‍යූ පද්ධතියෙහි පවත්නා නිර්ලේඛිත භාණ්ඩාගාර බිල්පත් සහ නිර්ලේඛිත භාණ්ඩාගාර බැඳුම්කර පිළිවෙලින්, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතෙහි විධිවිධාන වලට අනුව නිකුත් කර ඇත. මීට අමතරව, මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවට නිර්ලේඛිත මහ බැංකු සුරැකුම්පත් නිකුත් කළ හැකිය.

### 3.2 ලංකාසෙක්‍යූ පද්ධතියේ පවතින සුරැකුම්පත්

දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ හා ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හෝ වෙනත් ඕනෑම සුරැකුම්පත් හා මුදල් නීති පනත යටතේ නිර්ලේඛිත ආකාරයෙන් නිකුත් කරන ලද මහ බැංකු සුරැකුම්පත් ලංකාසෙක්‍යූ පද්ධතියෙහි පවතී.

#### 3.2.1 භාණ්ඩාගාර බිල්පත්

භාණ්ඩාගාර බිල්පත් යනු, සාමාන්‍යයෙන් කල් පිරීමේදී ගෙවනු ලබන මුහුණතෙහි ප්‍රකාශිත අගයට වට්ටමක් සහිතව හා දින 91, 182 සහ 364 යන පරිණත කාලයන් සහිතව නිකුත් කරනු ලබන රාජ්‍ය සුරැකුම්පත් වන අතර මේවා ගනුදෙනු කළ හැකි මූල්‍ය උපකරණ වේ. ගැනුම් මිල හා කල්පිරීමේ වටිනාකම් අතර වෙනස මත පදනම්ව ආයෝජන ඵලදා හෝ ප්‍රතිලාභ ගණනය කරනු ලැබේ.

#### 3.2.2 භාණ්ඩාගාර බැඳුම්කර

භාණ්ඩාගාර බැඳුම්කර යනු මුලදී වසර 2 ක් හෝ ඊට වැඩි පරිණත කාලයන් සහිතව නිකුත් කරනු ලබන රාජ්‍ය සුරැකුම්පත් වන අතර මේවා ගනුදෙනු කළ හැකි උපකරණ වේ.

භාණ්ඩාගාර බැඳුම්කර සාමාන්‍යයෙන් අර්ධ වාර්ෂික පොලී ගෙවීම් සහිත වේ. අර්ධ වාර්ෂික ගෙවීම් වල, පළමු පොලී ගෙවීමේ දිනය (කූපන් දිනය) වන්නේ එය නිකුත් කල දින සිට මාස 6 කට පසු දිනයයි (යම් විශේෂිත බැඳුම්කර කාණ්ඩයක් නිකුත් කළ සහ සහ පොලී මුදල් ඉපැයීම ආරම්භ කළ දින සිට) දෙවන පොලී ගෙවීමේ දිනය පළමු පොලී ගෙවීමේ දිනට මාස 6 කට පසු දිනය වේ. මෙම රටාව කල් පිරීමේ දිනය වන තුරු දිගටම පවතිනු ඇත. අවසාන පොලී ගෙවීමේ දිනය වන්නේ නියමිත කල් පිරීමේ දිනයයි. මූලික (ප්‍රධාන) මුදල ගෙවීම කල් පිරීමේ දිනයේදී සිදු කෙරේ.

#### 3.2.3 මහ බැංකු සුරැකුම්පත්

මහ බැංකු සුරැකුම්පත් මුදල් නීති පනතෙහි විධිවිධාන යටතේ නිකුත් කරනු ලබයි. මහ බැංකු සුරැකුම්පත් වල කල්පිරීමේ කාලයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවය මත රඳා පවතී. මෙම සුරැකුම්පත් ගනුදෙනු කල හැකි මූල්‍ය උපකරණ වන නමුත් ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා ඇපයක් ලෙස මෙම සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු නොලැබේ.

### 3.3 ලේඛිත සුරැකුම්පත්හි සහපැවැත්ම

ලංකාසෙක්‍යූ පද්ධතිය හඳුන්වාදීමට පෙර රාජ්‍ය සුරැකුම්පත් ලිඛිත සහතික ආකාරයෙන් නිකුත් කරන ලදී.

මෙම ලිඛිත සුරැකුම්පත්, ස්වේච්ඡා යෝජනා ක්‍රමයක් හරහා මේ සඳහා නිකුත් කරන ලද අදාළ නීති හා රෙගුලාසි වලට යටත් කිරීම සහ පරිවර්තනය කිරීම මගින් නිර්ලේඛිත සුරැකුම්පත් බවට පරිවර්තනය කළ හැක.

නිර්ලේඛිත ආකාරයට පරිවර්තනය කිරීමෙන් පසු ලේඛිත ආකාරයෙන් නිකුත් කල සුරැකුම්පත් වුවද, එම සුරැකුම්පත් සඳහා මෙම පද්ධති රීති අදාල වේ.

නිර්ලේඛිත ආකාරයට පරිවර්තනය නොකරන ලද ලේඛිත ආකාරයෙන් නිකුත් කර ඇති සුරැකුම්පත් එහි කල් පිරීමේ දිනය වන තුරු ලිඛිත ආකාරයෙන්ම පවතී.

### 3.4 ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය (International Securities Identification Number (ISIN)

සෑම නිර්ලේඛිත සුරැකුම්පත් නිකුතුවක්ම ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකගත කිරීමේ ක්‍රමවේදයට අනුව නිර්මාණය කරන අංකයකින් අනන්‍ය ලෙස හඳුනාගනී. ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය අක්ෂර 12 ක දිගකින් යුක්ත වේ. රටේ කේතය, සුරැකුම්පතේ වර්ගය, කාල සීමාව හා කල් පිරීමේ දිනය මෙම අක්ෂර වලින් දක්වා ඇත. පරීක්ෂා කිරීමේ අංකය ISO6166 ප්‍රමිතියට අනුව ගණනය කරනු ලැබේ.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| L | K | | | | | Y | Y | M | D | D | |

රටේ කේතය | සුරැකුම්පත් වර්ගය | කාල සීමාව | කල් පිරීමේ දිනය | පරික්ෂා කිරීමේ අංකය

**සුරැකුම්පත් වර්ගය හා කාල සීමාව අර්ථ දැක්වීම සඳහා කේතයන් භාවිතා කරයි. කල් පිරීමේ දිනය වර්ෂයේ අවසාන අංක දෙකෙන් (YY), මාසය (M) ඉංග්‍රීසි අක්ෂර මාලාවේ අනුක්‍රමික අක්ෂරයෙන් (උදා:A = ජනවාරි, B=පෙබරවාරි යනාදී වශයෙන් L=දෙසැම්බර් වනතුරු) සහ මාසයේ අදාල දිනයෙන් (DD) සමන්විත වේ.**

**සුරැකුම්පත් වර්ගය**

| | |
|---|---|
| A | භාණ්ඩාගාර බිල්පත් |
| B | භාණ්ඩාගාර බැඳුම්කර - පොලී සහිත |
| C | භාණ්ඩාගාර බැඳුම්කර - පොලී රහිත |
| D | මහ බැංකු සුරැකුම්පත් |
| E | උද්ධමන ගැලපුම් බැඳුම්කර |

**කාල සීමාව (උදා:)**

| | |
|---|---|
| 091 | දින 91 |
| 182 | දින 182 |
| 364 | දින 364 |
| 002 | අවුරුදු 2 |
| 003 | අවුරුදු 3 |
| 010 | අවුරුදු 10 |
| 030 | අවුරුදු 30 |

### 3.5 ඒකක ප්‍රමාණය සහ අලෙවිකල හැකි අවම කොටස්

නිර්ලේඛිත සුරැකුම්පත් ශ්‍රී ලංකා රුපියල් 1 ක ගුණාකාර වලින් ප්‍රකාශිත මුහුණත වටිනාකම් වලින් නිකුත් කෙරේ. ලංකාසෙක්‍යු පද්ධතියේ ගනුදෙනු, එම හුවමාරුවන විශේෂිත සුරැකුම්පත් කාණ්ඩයෙහි (ISIN හී) ඒකක ප්‍රමාණයකින් ප්‍රකාශිත වේ.

ගනුදෙනු සඳහා ඇති සුරැකුම්පත් වල අලෙවි කළ හැකි අවම කොටස් ඒකක 1 කි. (ශ්‍රී ලංකා රුපියල් 1 ක මුහුණත වටිනාකම)

## 4 සුරැකුම්පත් ගිණුම්

### 4.1 ගිණුම් නිර්වචනයන් සහ සැකැස්ම

ලංකාසෙක්‍යු පද්ධතිය සුරැකුම්පත් පියවීමේ උපදෙස් ලැබීම මත වලංගු ගිණුම් නිර්ණායකයන් මගින් විශේෂණය කර ඇති සුරැකුම්පත් ගිණුම් පිහිටවනු ලබයි. ලංකාසෙක්‍යු පද්ධතියේ තනි පුද්ගල ගිණුම්, නිර්ණායක හතරක් මගින් නිර්වචනය වේ.

- සහභාගිකරු (Participant)
- ගිණුම් වර්ගය (Account Type)
- ප්‍රතිලාභ හිමිකරු (අදාල වන පරිදි) (Beneficial Owner)
- සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය (ISIN)

ඉහත නිර්ණායකයන්ට අනුව, අවශ්‍ය පරිදි එක් එක් සුරැකුම්පත් පියවීමේ උපදෙස් වල අඩංගු තොරතුරු මත ලංකාසෙක්‍යු පද්ධතිය මගින් ස්වයංක්‍රීයව සුරැකුම්පත් ගිණුම් නිර්මාණය කෙරේ. ඒ අනුව, මෙම නිර්ණායකයන්හී එකතුව අනන්‍ය වන සෑම සුවිශේෂ සිදුවීමක් සඳහාම වෙන වෙනම සුරැකුම්පත් ගිණුම් නිර්මාණය වේ.

සහභාගිකරුවෙකු විසින් පවත්වාගෙන යනු ලබන සුරකුම්පත් ගිණුමක් නිර්මාණය වනුයේ එහි පාලනය යටතේ ඇති තනි පුද්ගල සුරකුම්පත් ගිණුම් බොහෝ ප්‍රමාණයකිනි. ප්‍රතිලාභ හිමියෙකු සහිත ගිණුම්, සහභාගිකරුවෙකු ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් තමන්ගේ භාරයේ තබා ගන්නා ගිණුම් ලෙස සටහන් කෙරේ. ප්‍රතිලාභ හිමියකු වාර්තා කර නොමැති ගිණුම් සහභාගිකරුට හිමි සුරකුම්පත් එනම් සහභාගිකරුගේ හිමිකාරත්ව සුරකුම්පත් ලෙස වාර්තා වේ.

4.2. **ලංකාසෙක්‍යු පද්ධතිය තුළ පවතින ගිණුම් වර්ගීකරණයන්**

පහත දැක්වෙන ගිණුම් වර්ගීකරණයන් ලංකාසෙක්‍යු පද්ධතිය තුළ භාවිතා වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඔවුන්ගේ අභිමතය පරිදි ඕනෑම සහභාගිකරුවෙකුට හෝ සහභාගිකරුවන් ප්‍රභේදයකට ලබා ගත හැකි ගිණුම් වර්ග මෙන්ම එක් එක් ගිණුම් වර්ගවලට භාවිත කළ හැකි ගනුදෙනු වර්ගද සීමා කල හැකිය.

| ගිණුම් වර්ගය | කේතය | අරමුණ |
|---|---|---|
| **සහභාගිකරුවන්ගේ/ ශ්‍රී ලංකා මහ බැංකුවේ හිමිකාරත්වය (Own) ගිණුම්** | OWN | සහභාගිකරුවන්ට / ශ්‍රී ලංකා මහ බැංකුවට අයිති නිර්ලේඛිත සුරකුම්පත් රඳවා තැබීම. (සහභාගිකරුවන්ගේ "ගනුදෙනු කිරීම්" සහ "ආයෝජන" කළඹවල් මෙම ගිණුම යටතේ රඳවිය යුතු අතර හිමිකාරත්වය පිළිවෙලින් "ගනුදෙනු කිරීම්" සහ "ආයෝජන" ලෙස නම් කළ යුතුයි. |
| **එක් දින ද්‍රවශීලතා පහසුකම් ගිණුම (ILF)** | ILF | සහභාගිකරුවෙකු එක්දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම සඳහා ඇපකර ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත හුවමාරු කිරීමට ඇති රජයේ සුරකුම්පත් ද ශ්‍රී ලංකා මහ බැංකුව එක්දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම සඳහා සහභාගිකරුවන් විසින් ඇපකර ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත හුවමාරු කරනු ලැබූ රජයේ සුරකුම්පත්ද මෙහි රඳවා තැබීම. |
| **ඔඩපන ගිණුම (Pledged Account)** | PLG | 2004 අංක 02 දරන සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර (ගනුදෙනු) නියෝග සහ 2004 අංක 02 දරන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් (ගනුදෙනු) නියෝග අනුව ඔඩපන කරන ලද නිර්ලේඛිත සුරකුම්පත් රඳවා තැබීම. |
| **ගනුදෙනුකරුගේ ගිණුම (නේවාසික)** | CSL | සහභාගිකරුවෙකුගේ ගනුදෙනුකරුවෙකුගේ එනම් "ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයකු" ට අයිති නිර්ලේඛිත සුරකුම්පත් රඳවා තැබීම සුරකුම්පත් ගනුදෙනුවල යෙදෙන නේවාසික හිමියකු විශේෂණය කොට දක්වමින් මෙම ගිණුම් නිර්මාණය වේ. මෙම ගිණුම් වර්ගය අලෙවිකරණ ඍජු සහභාගිකරුවන්ට පමණක් ලබා ගැනීමට හැකිය. |
| **ගනුදෙනුකරුගේ ගිණුම (අනේවාසික)** | CSF | ශ්‍රී ලංකාවෙන් පිටත (අනේවාසික) සිටින පුද්ගලයෙකුට අයිති සුරකුම්පත් රඳවා තැබීම සුරකුම්පත් ගනුදෙනුවල යෙදෙන අනේවාසික හිමියකු විශේෂණය කොට දක්වමින් මෙම ගිණුම් නිර්මාණය වේ. මෙම ගිණුම් වර්ගය අලෙවිකරණ ඍජු සහභාගිකරුවන්ට පමණක් ලබා ගැනීමට හැකිය. |
| **විදේශයන් හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් සහ විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුරකුම්පත් ගිණුම** | CFD | විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් සහ ද්විත්ව පුරවැසිභාවය ඇති ගනුදෙනුකරුවන් ඇතුළුව විදේශීය ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට විශේෂ වැඩ සටහනක් යටතේ නිකුත් කරන ලද නිර්ලේඛිත සුරකුම්පත් රඳවා තැබීම. |
| **සහභාගිකාර ප්‍රතිමිලට ගැනීම් ගිණුම (ගනුදෙනු කළ හැකි)** | PRT | ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුමක් යටතේ එක් සහභාගිකරුවෙකු විසින් වෙනත් සහභාගිකරුවෙකුට, ඉදිරි දිනකදී නැවත පවරා ගැනීම සඳහා ඉහත ගිවිසුමේ අඩංගු කොන්දේසිවලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරකුම්පත් රඳවා තැබීම.<br>මෙම ගිණුමෙහි ඇති සුරකුම්පත් ගනුදෙනු කළ හැකිය.<br>(සහභාගිකරුවන් දෙදෙනෙකු අතර ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳ විශේෂ මාර්ගෝපදේශයන් මෙම වෙළුමෙහි 4.3 රීතිය යටතේ බලන්න.) |
| **සහභාගිකාර ප්‍රතිමිලදී ගැනීම් ගිණුම (ගනුදෙනු කළ නොහැකි)** | PRN | ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුමක් යටතේ සහභාගිකරුවෙකු විසින් වෙනත් සහභාගිකරුවෙකුට ඉදිරි දිනකදී නැවත පවරා ගැනීම සඳහා ඉහත ගිවිසුමේ අඩංගු කොන්දේසිවලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරකුම්පත් රඳවා තැබීම. මෙම ගිණුමෙහි ඇති සුරකුම්පත් ගනුදෙනු කළ නොහැක. (සහභාගිකරුවන් දෙදෙනෙකු අතර ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳව විශේෂ මාර්ගෝපදේශයන් මෙම වෙළුමෙහි 4.3 රීතිය යටතේ බලන්න.) |

| | | |
|---|---|---|
| **ගනුදෙනුකාර ප්‍රතිමිලට ගැනීම් ගිණුම (ගනුදෙනු කළ හැකි)** | **RET** | ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුමක් යටතේ සහභාගිකරුවෙකු විසින් ගනුදෙනුකරුවෙකුට හෝ ගනුදෙනුකරුවෙකු විසින් වෙනත් ගනුදෙනුකරුවෙකුට ඉදිරි දිනක දී නැවත පවරා ගැනීම සඳහා ඉහත ගිවිසුමේ අඩංගු කොන්දේසි වලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරැකුම්පත් රඳවා තැබීම.<br>මෙම ගිණුමෙහි ඇති සුරැකුම්පත් ගනුදෙනු කළ හැක.<br>(ගනුදෙනුකාර ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳ විශේෂ මාර්ගෝපදේශයන් මෙම වෙළුමෙහි 4.3 රීතිය යටතේ බලන්න.) |
| **ගනුදෙනුකාර ප්‍රතිමිලදී ගැනීම් (ගනුදෙනු කළ නොහැකි) ගිණුම** | **REN** | ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුමක් යටතේ සහභාගිකරුවෙකු විසින් ගනුදෙනුකරුවෙකුට හෝ ගනුදෙනුකරුවෙකු විසින් වෙනත් ගනුදෙනුකරුවෙකුට ඉදිරි දිනකදී නැවත පවරා ගැනීම සඳහා ඉහත ගිවිසුමේ අඩංගු කොන්දේසි වලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරැකුම්පත් රඳවා තැබීම.<br>මෙම ගිණුමෙහි ඇති සුරැකුම්පත් ගනුදෙනුකළ නොහැක.<br>(ගනුදෙනුකාර ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳ විශේෂ මාර්ගෝපදේශයන් මෙම වෙළුමෙහි 4.3 රීතිය යටතේ බලන්න.) |
| **ගනුදෙනුකාර ප්‍රති විකුණුම් (ගනුදෙනු කළ හැකි) ගිණුම** | **RRT** | ගනුදෙනුකරුවෙකු විසින් සහභාගිකරුවෙකුට ප්‍රතිවිකුණුම් ගිවිසුමක් යටතේ ඉදිරි දිනකදී නැවත පවරා දීම සඳහා අදාළ ගිවිසුමේ අඩංගු කොන්දේසි වලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරැකුම්පත් රඳවා තැබීම.<br>මෙම ගිණුමෙහි ඇති සුරැකුම්පත් ගනුදෙනු කළ හැකිය.<br>(ගනුදෙනුකාර ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳ විශේෂ මාර්ගෝපදේශයන් මෙම වෙළුමෙහි 4.3 රීතිය යටතේ බලන්න.) |
| **ගනුදෙනුකාර ප්‍රති විකුණුම් (ගනුදෙනු කළ නොහැකි) ගිණුම** | **RRN** | එක් ගනුදෙනුකරුවෙකු විසින් සහභාගිකරුවෙකුට ප්‍රතිවිකුණුම් ගිවිසුමක් යටතේ ඉදිරි දිනකදී නැවත පවරා දීම සඳහා අදාළ ගිවිසුමේ අඩංගු කොන්දේසි වලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරැකුම්පත් රඳවා තැබීම.<br>මෙම ගිණුමෙහි ඇති සුරැකුම්පත් ගනුදෙනු කළ නොහැක. මෙම ගිණුමෙහි ඇති සුරැකුම්පත් ආදේශ කළ නොහැක.<br>(ගනුදෙනුකාර ප්‍රතිවිකුණුම් ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳ විශේෂ මාර්ගෝපදේශයන් මෙම වෙළුමෙහි 4.3 රීතිය යටතේ බලන්න.) |
| **ව්‍යවස්ථාපිත ආයෝජන ගිණුම** | **STI** | සහභාගිකරු මත පවරන ලද ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය සපුරාලීම සඳහා සහභාගිකරුට හිමි නිර්ලේඛිත සුරැකුම්පත් රඳවයි. |
| **ප්‍රාථමික වෙන්දේසියෙන් මිලට ගැනීම් ගිණුම** | **PAP** | ප්‍රාථමික වෙන්දේසියෙන්/ ඍජු නිකුතුන් වලින් ප්‍රාථමික අලෙවිකරුවන් සහ නිලලත් අලෙවිකරුවන් නොවන ලංසු තබන්නා/ තබන්නන් මිලදී ගනු ලබන සුරැකුම්පත්, ඒවා බෙදාහරින තෙක් රඳවා ගනු ලබයි. |
| **ලේඛිත ආකෘති ලියවිලි ගිණුම** | **SCR** | 2004 පෙබරවාරි මසට පෙර ලේඛිත ආකෘතියෙන් නිකුත් කරන ලද නොපියවූ භාණ්ඩාගාර බැඳුම්කර වල වටිනාකම දක්වයි. මෙය සිහිවටන ගිණුමක් පමණක් වේ. මෙම ගිණුම් පියවීම ලංකාසෙක්‍යු පද්ධතියට පිටතින් සිදු කෙරේ. |
| **දේශීය මෙහෙයුම් සඳහා වූ එක් දින ප්‍රති මිලට ගැනුම් ගිණුම** | **DOP** | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවෙකු වෙත ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම යටතේ නැවත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරි දිනයකදී පවරා ගැනීම සඳහා අදාළ ගිවිසුමේ අඩංගු කොන්දේසි වලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරැකුම්පත් රඳවයි. මෙම ගිණුමෙහි ඇති සුරැකුම්පත් ගනුදෙනු කළ නොහැක. |
| **දේශීය මෙහෙයුම් සඳහා වූ දිගු කාලීන ප්‍රතිමිලට ගැනීම් ගිණුම** | **DOT** | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවෙකු වෙත දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම යටතේ නැවත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරි දිනයකදී පවරා ගැනීම සඳහා අදාළ ගිවිසුමේ අඩංගු කොන්දේසිවලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරැකුම්පත් රඳවයි.<br>මෙම ගිණුමෙහි ඇති සුරැකුම්පත් ගනුදෙනු කළ හැකි වනුයේ ඉහත ගිවිසුමේ අඩංගු නියමයන් හා කොන්දේසි වලින් අවසර ලැබේ නම් පමණි. |
| **දේශීය මෙහෙයුම් සඳහා වූ ප්‍රති විකුණුම් ගිණුම** | **DRP** | සහභාගිකරුවෙකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත, ප්‍රතිවිකුණුම් ගිවිසුමක් යටතේ සහභාගිකරු වෙත නැවත ඉදිරි දිනක දී පවරා දීම සඳහා අදාළ ගිවිසුමේ අඩංගු කොන්දේසි වලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරැකුම්පත් රඳවයි. |
| **දේශීය මෙහෙයුම් සඳහා වූ කාලීන ප්‍රති විකුණුම් ගිණුම** | **DRT** | සහභාගිකරුවෙකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත, දිගුකාලීන ප්‍රතිවිකුණුම් ගිවිසුමක් යටතේ සහභාගිකරු වෙත නැවත ඉදිරි දිනකදී පවරා දීම සඳහා අදාළ ගිවිසුමේ අඩංගු කොන්දේසි වලට යටත්ව හුවමාරු කරන ලද නිර්ලේඛිත සුරැකුම්පත් රඳවයි. |
| **දේශීය මෙහෙයුම් සඳහා වූ ණය ගැනීම් ගිණුම** | **DOB** | විවට වෙළඳපොළ කටයුතු පවත්වා ගෙන යාමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවන්ගෙන් ණයට ගනු ලබන නිර්ලේඛිත සුරැකුම්පත් රඳවයි. |
| **අර්ථසාධක අරමුදල් විශ්‍රාමික සේවකයන්ගේ ගිණුම** | **EPF** | සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට ඔවුන් විශ්‍රාම යන අවස්ථාවේ දී රජයේ සුරැකුම්පත් නිකුත් කෙරෙන විශේෂ යෝජනා ක්‍රමය යටතේ ඔවුන්ට හිමිවූ නිර්ලේඛිත සුරැකුම්පත් රඳවයි. |

## 4.3 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වාර්තාකරණයට අදාළ විශේෂ මාර්ගෝපදේශයන්

### 4.3.1 සහභාගිකරුවන් දෙදෙනෙකු අතර සිදුවන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුව

| ගිණුම් වර්ගය | ගනුදෙනුව | ගනුදෙනුවෙහි අර්ථනිරූපණය | ගනුදෙනු වාර්තා කිරීමේ මාර්ගෝපදේශයන් | |
|---|---|---|---|---|
| PRT | සහභාගිකරුවන් අතර සිදුවන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුව (ගනුදෙනු කළ හැකි) | සහභාගිකරු A → සුරැකුම්පත් → සහභාගිකරු B<br>සහභාගිකරු B → අරමුදල් → සහභාගිකරු A | සහභාගිකරු B<br>↓<br>PRT<br>↓<br>සහභාගිකරු A ගේ BIC*<br>(බැංකු හැඳුනුම් කේත අංකය)<br>↓<br>අයිතිය/හිමිකම/වත්කම (ISIN - සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය, මුහුණත වටිනාකම) | සුරැකුම්පත් ලබා ගන්නා සහභාගිකරු (සහභාගිකරු B) එවැනි සුරැකුම්පත් (ISIN සහ මුහුණත වටිනාකම) 'PRT' ගිණුම යටතේ විකුණුම්කරුගේ (සහභාගිකරු A) බැංකු හැඳුනුම් කේත අංකය සමඟ සුරැකුම්පත් වල ප්‍රතිලාභ හිමිකරුගේ කේත අංකය (Beneficial owner code)ලෙස වාර්තා කළ යුතුවේ. |
| PRN | අන්තර් සහභාගිකරුවන් අතර සිදුවන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුව (ගනුදෙනු කළ නොහැකි) | සහභාගිකරු A → සුරැකුම්පත් → සහභාගිකරු B<br>සහභාගිකරු B → අරමුදල් → සහභාගිකරු A | සහභාගිකරු B<br>↓<br>PRN<br>↓<br>සහභාගිකරු A ගේ BIC*<br>(බැංකු හැඳුනුම් කේත අංකය)<br>↓<br>හිමිකම<br>(ISIN,මුහුණත වටිනාකම) | සුරැකුම්පත් ලබා ගන්නා සහභාගිකරු (සහභාගිකරු B) එවැනි සුරැකුම්පත් (ISIN සහ මුහුණත වටිනාකම) 'PRN' ගිණුම යටතේ විකුණුම්කරුගේ (සහභාගිකරු A) බැංකු හැඳුනුම් කේත අංකය සමඟ සුරැකුම්පත් වල ප්‍රතිලාභ හිමිකරුගේ කේත අංකය (Beneficial owner code) වාර්තා කළ යුතුවේ. මෙම ගිණුමෙහි පවතින සුරැකුම්පත් ගනුදෙනු කළ නොහැක. |

*BIC – SWIFT (ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන සංගමය) ජාලයේ බැංකු හැඳුනුම් කේත අංකය

### 4.3.2 සහභාගිකරුවන් දෙදෙනෙකුගේ ගනුදෙනුකරුවන් දෙදෙනෙකු අතර සිදුවන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුව



| ගිණුම් වර්ගය | ගනුදෙනුව | ගනුදෙනුවෙහි අර්ථනිරූපණය | ගනුදෙනු වාර්තා කිරීමේ මාර්ගෝපදේශයන් | |
|---|---|---|---|---|
| RET | සහභාගිකරුවන් දෙදෙනෙකුගේ ගනුදෙනුකරුවන් අතර සිදුවන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුව (ගනුදෙනු කළ හැකි) | සහභාගිකරු A (ගනුදෙනුකරු X) → සුරැකුම්පත් → සහභාගිකරු B (ගනුදෙනුකරු Y)<br>සහභාගිකරු B (ගනුදෙනුකරු Y) → අරමුදල් → සහභාගිකරු A (ගනුදෙනුකරු X) | සහභාගිකරු B<br>↓<br>RET<br>↓<br>ගනුදෙනුකරු Y ගේ කේත අංකය<br>↓<br>හිමිකම<br>(ISIN, මුහුණත වටිනාකම) | සහභාගිකරු B, විසින් 'RET'ගිණුම යටතේ සුරැකුම්පත් (ISIN,සහ මුහුණත වටිනාකම) සහ ගනුදෙනුකරු Y ට වෙන් කර ඇති ගනුදෙනුකරුගේ කේත අංකය, ලෙස ප්‍රතිලාභ හිමිගේ කේත අංකය වාර්තා කළ යුතුයි |

| | | | | |
|---|---|---|---|---|
| REN | සහභාගිකරුවන් දෙදෙනෙකුගේ ගනුදෙනුකරුවන් අතර සිදුවන ප්‍රතිමිලදී ගනුදෙනුව | සහභාගිකරු A (ගනුදෙනුකරු X) —සුරැකුම්පත්→ සහභාගිකරු B (ගනුදෙනුකරු Y)<br>සහභාගිකරු B (ගනුදෙනුකරු Y) —අරමුදල්→ සහභාගිකරු A (ගනුදෙනුකරු X) | සහභාගිකරු B<br>↓<br>REN<br>↓<br>ගනුදෙනුකරු Y ගේ කේත අංකය<br>↓<br>හිමිකම<br>(ISIN, මුහුණත වටිනාකම) | සහභාගිකරු B, විසින් 'REN'ගිණුම යටතේ සුරැකුම්පත් (ISIN, මුහුණත වටිනාකම) සහ ගනුදෙනුකරු Y ට වෙන් කර ඇති ගනුදෙනුකරුගේ කේත අංකය, ලෙස ප්‍රතිලාභ හිමිගේ කේත අංකය ලෙස වාර්තා කළ යුතුයි. මෙම ගිණුමෙහි පවතින සුරැකුම්පත් ගනුදෙනු කළ නොහැක. |


4.3.3. **සහභාගිකරුවෙකු සහ ඔහුගේ ගනුදෙනුකරුවෙකු අතර සිදුවන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව**

| ගිණුම් වර්ගය | ගනුදෙනුව | ගනුදෙනුවෙහි අර්ථනිරූපණය | ගනුදෙනු වාර්තා කිරීමේ මාර්ගෝපදේශයන් | |
|---|---|---|---|---|
| RET | සහභාගිකරුවෙකු හා ගනුදෙනුකරුවකු අතර සිදුවන ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනුව (ගනුදෙනු කළ හැකි) | සහභාගිකරු —සුරැකුම්පත්→ ගනුදෙනුකරු<br>ගනුදෙනුකරු —අරමුදල්→ සහභාගිකරු | සහභාගිකරු<br>↓<br>RET<br>↓<br>ගනුදෙනුකරුගේ කේත අංකය<br>↓<br>හිමිකම<br>(ISIN, මුහුණත වටිනාකම) | සහභාගිකරු විසින් සුරැකුම්පත් (ISIN, හා මුහුණත වටිනාකම) 'RET'ගිණුම යටතේ එම විශේෂ ගනුදෙනුකරුට වෙන් කර ඇති ගනුදෙනුකරුගේ කේත අංකය, ප්‍රතිලාභ හිමිගේ කේත අංකය වාර්තා කළ යුතුයි. |
| REN | සහභාගිකරුවෙකු හා ගනුදෙනුකරුවකු අතර සිදුවන ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනුව (ගනුදෙනු කළ නොහැකි) | සහභාගිකරු —සුරැකුම්පත්→ ගනුදෙනුකරු<br>ගනුදෙනුකරු —අරමුදල්→ සහභාගිකරු | සහභාගිකරු<br>↓<br>REN<br>↓<br>ගනුදෙනුකරුගේ කේත අංකය<br>↓<br>හිමිකම<br>(ISIN, මුහුණත වටිනාකම) | සහභාගිකරු විසින් 'REN' ගිණුම යටතේ සුරැකුම්පත් (ISIN, සහ මුහුණත වටිනාකම) සහ එම විශේෂ ගනුදෙනුකරුට වෙන් කර ඇති ගනුදෙනුකරුගේ කේත අංකය, ලෙස ප්‍රතිලාභ හිමිගේ කේත අංකය ලෙස වාර්තා කළ යුතුයි. මෙම ගිණුමෙහි පවතින සුරැකුම්පත් ගනුදෙනු කළ නොහැක. |

4.3.4 සහභාගිකරුවෙකු සහ ඔහුගේ ගනුදෙනුකරුවෙකු අතර සිදුවන ප්‍රතිවිකුණුම් ගනුදෙනුව

| ගිණුම් වර්ගය | ගනුදෙනුව | ගනුදෙනුවෙහි අර්ථනිරූපණය | ගනුදෙනු වාර්තා කිරීමේ මාර්ගෝපදේශයන් | |
|---|---|---|---|---|
| RRT | සහභාගිකරුවෙකු හා ගනුදෙනුකරුවෙකු අතර සිදුවන ප්‍රතිවිකුණුම් ගනුදෙනුව (ගනුදෙනු කළ හැකි) |  | සහභාගිකරු<br>↓<br>RRT<br>↓<br>ගනුදෙනුකරුගේ කේත අංකය<br>↓<br>හිමිකම<br>(ISIN, මුහුණත වටිනාකම) | සහභාගිකරු විසින් 'RRT' ගිණුම යටතේ සුරැකුම්පත් (ISIN, මුහුණත වටිනාකම) සහ එම විශේෂ ගනුදෙනුකරුට වෙන් කර ඇති ගනුදෙනුකරුගේ කේත අංකය ලෙස ප්‍රතිලාභ හිමිගේ කේත අංකය වාර්තා කළ යුතුයි |
| RRN | සහභාගිකරුවකු හා ගනුදෙනුකරුවකු අතර සිදුවන ප්‍රති විකුණුම් ගනුදෙනුව (ගනුදෙනු කළ නොහැකි) |  | සහභාගිකරු B<br>↓<br>RRN<br>↓<br>ගනුදෙනුකරුගේ කේත අංකය<br>↓<br>හිමිකම<br>(ISIN, මුහුණත වටිනාකම) | සහභාගිකරු විසින් 'RRN' ගිණුම යටතේ සුරැකුම්පත් (ISIN සහ මුහුණත වටිනාකම) සහ එම විශේෂ ගනුදෙනුකරුට වෙන් කර ඇති ගනුදෙනුකරුගේ කේත අංකය ප්‍රතිලාභ හිමිගේ කේත අංකය වාර්තා කළ යුතුයි. මෙම ගිණුමෙහි පවතින සුරැකුම්පත් ගනුදෙනු කළ නොහැක. |

4.3.5 එක් සහභාගිකරුවෙකුගේ ගනුදෙනුකරුවන් දෙදෙනෙකු අතර සිදුවන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව

| ගිණුම් වර්ගය | ගනුදෙනුව | ගනුදෙනුවෙහි අර්ථනිරූපණය | ගනුදෙනු වාර්තා කිරීමේ මාර්ගෝපදේශයන් | |
|---|---|---|---|---|
| RET | එක් සහභාගිකරුවෙකුගේ ගනුදෙනුකරුවන් දෙදෙනෙකු අතර සිදුවන ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුව (ගනුදෙනු කළ හැකි) |  | සහභාගිකරු<br>↓<br>RRT<br>↓<br>ගනුදෙනුකරු Y ගේ කේත අංකය<br>↓<br>හිමිකම<br>(ISIN, මුහුණත වටිනාකම) | සහභාගිකරු විසින් 'RET' ගිණුම යටතේ සුරැකුම්පත් (ISIN සහ මුහුණත වටිනාකම) සහ ගනුදෙනුකරු Y ට වෙන් කර ඇති ගනුදෙනුකරුගේ කේත අංකය, ලෙස ප්‍රතිලාභ හිමිගේ කේත අංකය වාර්තා කළ යුතුයි |

| | | | | |
|---|---|---|---|---|
| REN | එක් සහභාගිකරුවකු ගේ ගනුදෙනුකරුවන් දෙදෙනෙකු අතර සිදුවන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුව (ගනුදෙනු කළ නොහැකි) | ගනුදෙනුකරු X → සුරැකුම්පත් → සහභාගිකරු Y<br>සහභාගිකරු Y → අරමුදල් → ගනුදෙනුකරු X | සහභාගිකරු<br>↓<br>REN<br>↓<br>ගනුදෙනුකරු Y ගේ<br>කේත අංකය<br>↓<br>හිමිකම<br>(ISIN, මුහුණත වටිනාකම) | සහභාගිකරු විසින් ‘REN’ ගිණුම යටතේ සුරැකුම්පත් (ISIN සහ මුහුණත වටිනාකම) සහ ගනුදෙනුකරු Y ට වෙන් කර ඇති ගනුදෙනුකරුගේ කේත අංකය ලෙස ප්‍රතිලාභ හිමිගේ කේත අංකය වාර්තා කළ යුතුයි. මෙම ගිණුමෙහි පවතින සුරැකුම්පත් ගනුදෙනු කළ නොහැක. |

## 5. වෙළඳ ගනුදෙනු සැකසුම සහ පියවීම

### 5.1 ලංකාසෙක්‍යු පද්ධතියේ කාර්ය භාරය

ලංකාසෙක්‍යු පද්ධතිය රජයේ සුරැකුම්පත් සඳහා තැන්පතු දරන්නා වන අතර එම සුරැකුම්පත් පියවීමේ පහසුකමද සලසනු ලබයි. එබැවින්, වෙළඳ ක්‍රියාකාරකම් පද්ධතියට බාහිරව සිදුවන අතර එමගින් කිසිදු මිල අනාවරණය වීමක් හෝ වෙළඳාම් සාකච්ඡා කිරීමේ කටයුතු වලට උපකාර නොකෙරේ. එහි කාර්යභාරය වනුයේ සම්පූර්ණ කළ වෙළඳාම් සම්බන්ධයෙන් උපදෙස් පිළිපැදීම සහ අදාළ අරමුදල් පාදය පියවීමෙන් පසු සුරැකුම්පත් එහි නිරූපිත පරිදි හුවමාරු කිරීමයි.

### 5.2 ගනුදෙනු වර්ග

ලංකාසෙක්‍යු පද්ධතිය මගින් මූලික ගනුදෙනු වර්ග තුනකට පහසුකම් සලසයි. එනම්:

- ගෙවීමට එදිරිව මුදා හැරීම/ලැබීම
- මුදල් ලැබීමක් නොමැතිව මුදා හැරීම/ලැබීම
- සහභාගිකරුවෙකුගේ ගිණුම් අතර මාරු කිරීම්

ගෙවීමට එදිරිව මුදාහැරීමේ/ලැබීමේ ගනුදෙනුවක් සිදු කිරීමේදී සුරැකුම්පත් හා අරමුදල් යන දෙකෙහිම හුවමාරුව සම්පූර්ණ විය යුතුයි. එවැනි ගනුදෙනුවක දී සහභාගිකරුවන් දෙදෙනෙකු අතර අදාළ සුරැකුම්පත් හුවමාරු වීම සිදුවේ. මේ යටතේ ඇති සෑම ගනුදෙනුවක්ම ද්විපාර්ශවික වේ. එනම්, ගනුදෙනුව පියවීම සඳහා අදාළ පාර්ශවයන් දෙකම ගැළපෙන පරිදි පියවීමේ උපදෙස් ඉදිරිපත් කළ යුතුයි.

මුදල් ලැබීමක් නොමැතිව මුදා හැරීමේ /ලැබීමේ ගනුදෙනුවක් සිදු කිරීමට සුරැකුම්පත් හුවමාරු වීම පමණක් අවශ්‍ය වේ. පද්ධතිය තුළ ඊට සම්බන්ධ අරමුදල් හුවමාරුවක් සිදුනොවේ. එවැනි ගනුදෙනුවක දී සහභාගිකරුවන් දෙදෙනෙකු අතර අදාළ සුරැකුම්පත් හුවමාරු වීම සිදුවේ. මේ යටතේ ඇති සෑම ගනුදෙනුවක්ම ද්විපාර්ශ්වික වේ. එනම්, ගනුදෙනුව පියවීම සඳහා අදාළ පාර්ශවයන් දෙකම ගැළපෙන පරිදි පියවීමේ උපදෙස් ඉදිරිපත් කළ යුතුයි.

සහභාගිකරුවෙකුගේ ගිණුම් අතර මාරු කිරීම් යනු, එකම සහභාගිකරුවෙකු යටතේ පවත්වාගෙන යන ගිණුම් අතර සුරැකුම්පත් හුවමාරු වන මුදල් ලැබීමක් නොමැතිව මුදාහරිනු ලබන ගනුදෙනු වේ. ඊට සම්බන්ධ අරමුදල් හුවමාරු සිදු නොවේ. මේ යටතේ ඇති සෑම ගනුදෙනුවක්ම ඒක පාර්ශ්වික වන අතර ගැලපීම අවශ්‍ය නොවේ.

### 5.3 සහභාගිකරුවන්ගේ සුරැකුම්පත් ගිණුම් අතර හුවමාරු වීම්

මැන්ඩේට් ගිවිසුමේ (Mandate Agreement) දක්වා ඇති පරිදි සහභාගිකරුවන්ගේ සුරැකුම්පත් ගිණුම් වලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුරැකුම්පත් හර සහ/බැර කරනු ලැබේ. ගිණුම් සම්බන්ධ ක්‍රියාකාරීත්ව ගැටලු වල හෝ දෝෂ වල සංශෝධන වලට සම්බන්ධ හර කිරීමේ සහ/බැර කිරීම්ද මෙහි අඩංගු වේ.

### 5.4 පණිවුඩ යැවීමේ ක්‍රියාවලිය

සුරැකුම්පත් සම්බන්ධ උපදෙස් හුවමාරු කර ගැනීම සඳහා ලංකාසෙක්‍යු පද්ධතිය විසින් සම්මත SWIFT ජාලය භාවිතා කරනු ලබන අතර එම පණිවුඩ සෘජුවම ලංකාසෙක්‍යු පද්ධතිය වෙත යවනු ලැබේ. පහත සඳහන් සීමාවන් සහභාගිකරුවන්ගේ පහසුව සඳහා පනවා ඇත.

වටිනාකම රුපියල් මිලියන 5 ක් හෝ ඊට වඩා අඩු හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර තීරණය කරනු ලබන එවැනි වෙනත් වටිනාකමක් සහිත, ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිමිලදී ගැනීමේ ප්‍රතිස්ථාපන ගනුදෙනුවකට අදාළව හෝ ගනුදෙනුකරුවන්ගේ අත්පිට මිලදී ගැනීමේ ප්‍රතිස්ථාපන ගනුදෙනුවකට අදාළව ගිණුම් අතර සුරැකුම්පත් හුවමාරු කර ගැනීමක දී පද්ධති රීතීන් සහ මෙහෙයුම් උපදෙස් වල දැක්වෙන පරිදි CBSL Net භාවිතා කිරීමට අදාළ පරිචයන්ට යටත්ව CBSL Net හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයා ඇති CSS Trades යන වෙබ් පාදක යෙදුම ඔස්සේ ගනුදෙනු පණිවුඩ සම්ප්‍රේෂණය කළ යුතුවේ. වටිනාකම රුපියල් මිලියන 5 ඉක්මවන හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර තීරණය කරනු ලබන එවැනි වෙනත් වටිනාකමකින් යුත් ගනුදෙනුකරුවෙකුගේ ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවකට අදාළව හෝ ගනුදෙනුකරුවෙකුගේ අත්පිට මිලදී ගැනීමේ ගනුදෙනුවකට අදාළව ගිණුම් අතර සුරැකුම්පත් හුවමාරු කර ගැනීමක දී ගනුදෙනු පියවීම සඳහා SWIFT පණිවිඩ පද්ධතිය භාවිතා කිරීමෙන් පණිවිඩ සම්ප්‍රේෂණය කළ යුතුවේ.

### 5.5 ලෝක ව්‍යාප්ත අන්තර්බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන සංගමය (SWIFT) විසින් සහභාගිකරුවන් සඳහා දෙන ලද බැංකු හඳුනාගැනීමේ කේත අංකයන් (BIC)

ලංකාසෙක්‍යු ගනුදෙනු සඳහා වූ SWIFT පණිවුඩ ලංකාසෙක්‍යු උපදෙස් පිළිගැනීම සඳහාම විශේෂයෙන් ස්ථාපනය කරන ලද බැංකු හඳුනාගැනීමේ කේත අංකයකට යවනු ලැබේ. ලංකාසෙක්‍යු පද්ධතියට යවනු ලබන සියළුම SWIFT පණිවුඩ තුළ "Place of Settlement" යන ක්ෂේත්‍රයෙහි ලංකාසෙක්‍යු හි බැංකු හඳුනා ගැනීමේ කේත අංකය යෙදිය යුතුය. ලංකාසෙක්‍යු පද්ධතියෙහි බැංකු හඳුනාගැනීමේ කේත අංකය වනුයේ **CBCELKLS** ය.

සුරැකුම්පත් සම්බන්ධ උපදෙස් සෘජුවම ලංකාසෙක්‍යු පද්ධතියට යැවිය යුතු අතර ගෙවීම් සම්බන්ධ උපදෙස් ගෙවීම් ලැබිය යුතු සහභාගිකරුගේ බැංකු හඳුනා ගැනීමේ කේත අංකයට යැවිය යුතුය. පද්ධතිය තුළ සිටින එක් එක් සහභාගිකරුවන් හඳුනා ගනු ලබන්නේ ඔවුන්ගේ SWIFT බැංකු හඳුනා ගැනීමේ කේත අංකය (BIC) මගිනි. තත්කාලීන දළ පියවුම් පද්ධතිය තුළ එක් එක් සහභාගිකරුවන් හඳුනා ගැනීම සඳහා භාවිතා කරනුයේ ද මෙම බැංකු හඳුනා ගැනීමේ කේත අංකයමය. (**ඇමුණුම ඈ** හි සහභාගිකරුවන්ගේ BIC කේතයන් ලැයිස්තුවක් සපයා ඇත.)

### 5.6 SWIFT පණිවුඩ සඳහා වන දත්ත අවශ්‍යතාවයන්

ලංකාසෙක්‍යු උපදෙස් සඳහා SWIFT පණිවුඩ ආකෘතිය තුළ අන්තර්ගත සියළුම ක්ෂේත්‍රයන් භාවිතයට ගනු නොලබන අතර ලංකාසෙක්‍යු ක්‍රියාවලිය තුළ ප්‍රයෝජනයට සහ කියවීමට ගනු ලබන්නේ තෝරාගත් ක්ෂේත්‍රයන් පමණි.

### 5.7 වෙළඳ නියමයන් පිළිබඳ ගිවිසුම සඳහා අනුගමනය කළ යුතු සුරැකුම්පත් උපදෙස්

ගනුදෙනු ගැළපීම සහ කිසියම් වූ වරදක් ඇත්නම් එය නිවැරදි කර ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් තහවුරු කර ගැනීම පිණිස සහභාගිකරුවන් විසින් ප්‍රතිපාර්ශව සමඟ එළඹෙන වෙළඳ නියාමනයන් සම්බන්ධ ගිවිසුම අනුව සුරැකුම්පත් සම්බන්ධ උපදෙස් ලංකාසෙක්‍යු පද්ධතියට හැකි ඉක්මනින් ඇතුළත් කළ යුතුය.

### 5.8 ඉදිරිදාතම ගනුදෙනු

ලංකාසෙක්‍යු පද්ධතිය ඉදිරි වලංගු දිනක දී පියවීම සඳහා වූ සුරැකුම්පත් උපදෙස් පිළිගන්නා අතර එම ඉදිරි පියවීම් දින දක්වා එම උපදෙස් ගබඩා කොට තබා ගනු ලබයි. පද්ධතිය විසින් වර්තමාන දිනයේ සිට ඉදිරියට කැලැන්ඩර් දින 364 ක් දක්වා සුරැකුම්පත් උපදෙස් පිළිගන්නා අතර ඉදිරි දින ගණන කැලැන්ඩර් දින 364 ඉක්මවන්නේ නම් එම උපදෙස් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ගනුදෙනුව පියවිය යුතු දිනය ඒ වන විටත් පසුවූ දිනයක් සඳහා සුරැකුම්පත් සම්බන්ධ උපදෙස් ලංකාසෙක්‍යු පද්ධතියට ලැබුණු විටදී පද්ධතිය මගින්ම එය ප්‍රතික්ෂේප කෙරේ.

සෑම දිනයක් ආරම්භයේදීම එක් එක් සුරැකුම්පත් උපදෙස් සඳහා වලංගු ගනුදෙනු දිනයක් පවතීද යන්න තහවුරු කරගැනීම සඳහා ලංකාසෙක්‍යු පද්ධතිය මගින් එහි ගබඩා වී ඇති සුරැකුම්පත් උපදෙස් පරීක්ෂා කරනු ලබයි. ගබඩා වී ඇති උපදෙස් වල ගනුදෙනු දිනය දැනටමත් පසු වූ සුරැකුම්පත් උපදෙසක් වේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කාර්යාලීය දිනයක් "අවලංගු" කරන ලද අවස්ථාවක දී, උදාහරණයක් ලෙස විශේෂ වූ තත්වයන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව කාර්යාලීය කටයුතු සඳහා විවෘත නොවන දිනයක දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂයෙන් උපදෙස් නිකුත් කර නොමැති නම් අදාළ ගනුදෙනු දිනයට ගබඩා කොට ඇති සුරැකුම්පත් සම්බන්ධ උපදෙස් අවලංගු කිරීම හෝ නව ගනුදෙනු දිනයන් සහිතව නැවත එවීම සහභාගිකරුවෙකුගේ වගකීම වේ.

### 5.9 වෙළඳ ගනුදෙනු ගැළපීම

ලංකාසෙක්‍යු පද්ධතිය මගින් සියළුම ගෙවීමට එදිරිව මුදාහැරීමේ/ලැබීමේ උපදෙස් සහ මුදල් ලබා ගැනීමක් නොමැතිව මුදා හැරීම/ ලැබීමට අදාළ උපදෙස් අදාළ දවස තුළදී ගැළපීම සිදු කරනු ලබයි. එකම සහභාගිකරුගේ ගිණුම් අතර මාරු කිරීම් සඳහා අවශ්‍ය වන්නේ මුදල් ලැබීමක් නොමැතිව මුදා හැරීමට අදාළ තනි උපදෙසක් පමණක් වීම ව්‍යතිරේකී අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

ඕනෑම පාර්ශවයකට (ගැනුම්කරු හෝ විකුණුම්කරු) ඔවුන්ගේ උපදෙස් පළමුව ඇතුළත් කළ හැකිය.

උපදෙස් ගැළපීම සිදු කරනු ලබන්නේ;

- ගැනුම්කරුගේ හා විකුණුම්කරුගේ විස්තර
- යොමු අංකය (Reference Number)
- සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය
- ගනුදෙනු පියවීමේ දිනය (Value Date)
- ප්‍රමාණය
- සම්පූර්ණ මිල

ගැළපීමක් සිදුකළ නොහැකි සෑම උපදෙසක්ම ගැළපිය හැකි උපදෙසක් ලැබෙන තුරු හෝ උපදෙසෙහි ඇති ගනුදෙනුව පියවිය යුතු දිනය අවලංගු වන තුරු ලංකාසෙක්‍යු පද්ධතියේ පවතියි.

## 5.10 ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු

මෙම වෙළුමෙහි රීති අංක 5.2 හි විස්තර කර ඇති උපදෙස් මාලාව උපයෝගී කර ගනිමින් ලංකාසෙක්‍යු පද්ධතිය තුළ ප්‍රති මිලදීගැනුම්/ ප්‍රතිවිකුණුම් ගනුදෙනු පියවීම සිදු කරනු ලබයි. ගනුදෙනුවකට අදාළ සෑම පාදයක්ම වෙන් වෙන් වශයෙන් වූ ගෙවීමට එදිරිව මුදා හැරීම්/ ලබා ගැනීමට අදාළ උපදෙස් දෙකකින් ඇතුළත් කළ යුතුය. ලංකාසෙක්‍යු පද්ධතිය මෙම ගනුදෙනු උපදෙස් ගැළපීමේදී උපදෙස්හි අමතර තොරතුරු ප්‍රතිමිලදී ගැනුම් ප්‍රතිවිකුණුම් දිනය හෝ ගෙවුම් වටිනාකම භාවිතා කිරීමක් වුවහොත් හැර අනෙකුත් සෑම අවස්ථාවකදීම, සාමාන්‍ය ක්‍රමය භාවිතා කරයි. පද්ධතිය මගින් විමර්ශනය කිරීමේ සහ වාර්තා කිරීමේ අරමුණින් ප්‍රති මිලදී ගැනුම්/ ප්‍රති විකුණුම් වෙනම ගනුදෙනු වර්ගයක් ලෙස හඳුනා ගනියි. සුරැකුම්පත් රඳවා තබා ගැනීම සඳහා ප්‍රති මිලදී ගැනුම් වලට යටත්ව වෙනම ගිණුම් වර්ගයක් භාවිතා කෙරේ.

අදාළ නීති යටතේ ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් සඳහා නිකුත් කරන ලද රෙගුලාසි වලට සහභාගිකරුවන් අනුකූල විය යුතුය.

## 5.11 උපදෙස් අවලංගු කිරීම

SWIFT හෝ බ්‍රව්සර් අතුරු මුහුණත භාවිතා කිරීම මගින් පහත තත්වයන්ට අදාළ සුරැකුම්පත් උපදෙස් අවලංගු කිරීමට සහභාගිකරුවෙකුට හැකිය.

- ගැලපිය නොහැකි වූ ගනුදෙනු උපදෙස් සහ එකම සහභාගිකරුවෙකුගේ ගිණුම් අතර සුරැකුම්පත් මාරු කිරීම්; අවලංගු කළ හැක්කේ ප්‍රාරම්භකයා විසින් පමණි.

- ගලපන ලද උපදෙස් ; දෙපාර්ශවයේම එකඟත්වය මත පමණක් අවලංගු කළ හැකි අතර එක් එක් අය විසින් අවලංගු කිරීමේ උපදෙස් නිකුත් කළ යුතුය.

කෙසේ වෙතත් පියවෙමින් පවතින හෝ පියවුණු ගනුදෙනු අවලංගු කළ නොහැකිය.

## 5.12 ගෙවීමට එදිරිව මුදාහැරීමේ / පියවීමේ ක්‍රියාවලිය

ලංකාසෙක්‍යුහි ගනුදෙනු පියවීම සඳහා පහත රූප සටහනේ විස්තර කර ඇති ක්‍රියාවලිය අනුගමනය කරනු ලබයි. ලංකාසෙක්‍යු පද්ධතියේ සහ තත්කාලීන දළ පියවුම් පද්ධතියේ අදාළ ගිණුම් වල පිළිවෙලින් සුරැකුම්පත් සහ අරමුදල් පවතින්නේ නම් පමණක් ගෙවීමට එදිරිව මුදා හැරීම/ ලබා ගැනීම සම්බන්ධ උපදෙස් පියවීම සිදුවේ.

මුදල් ලැබීමක් නොමැතිව මුදා හැරීමේ ක්‍රියාවලිය තුළ අරමුදල් හුවමාරු වීමක් නොමැතිනම් මුදල් ලැබීමක් නොමැතිව මුදා හැරීමේ/ ලබා ගැනීමේ ගනුදෙනු ක්‍රියාවලිය ගෙවීමට එදිරිව මුදා හැරීමේ/ ලබා ගැනීමේ ක්‍රියාවලියට සමාන වේ.

පියවීමේ ක්‍රියාවලියේ පියවර

විකුණුම්කරු විසින් ගෙවීමට එදිරිව මුදා හැරීමේ උපදෙස් ඇතුළත් කිරීම

ගැනුම්කරු විසින් ගෙවීමට එදිරිව ලබාගැනීමේ උපදෙස් ඇතුළත් කිරීම

↓

අදානයන් වලංගුගත කිරීම සහ ගැළපීම

↓

පියවීමේ දිනය දක්වා ගනුදෙනු රඳවා තැබීම

↓

ගනුදෙනු පියවීම සඳහා පෙළ ගැසීම

↓

ගනුදෙනු සඳහා පවතින/අදාල සුරැකුම්පත් පරීක්ෂා කිරීම

↓

තෝරාගත් සුරැකුම්පත් වෙන් කිරීම සහ හුවමාරු කළ නොහැකි ලෙස පවත්වාගෙන යාම (Frozen)

↓

තත්කාලීන දළ පියවුම් පද්ධතිය වෙත පියවීම සඳහා ඇති ඉල්ලීම යොමු කිරීම

↓

අරමුදල් පවතින්නේ දැයි පරීක්ෂා කිරීම

↓

පියවීමේ ගිණුම් හර කිරීම සහ බැර කිරීම

↓

ලංකාසෙක්‍යු පද්ධතියට තහවුරු කිරීමේ පණිවුඩය ලබා දීම

↓

සුරැකුම්පත් පැවරීම

---

කෙටි පණිවුඩ විද්‍යුත් තැපැල මගින් තත්කාලීන දැනුම්දීම

අවශ්‍ය පරිදි ගනුදෙනුකරුවන් හට ප්‍රකාශනයන් යැවීම (මෙම ක්‍රියාවලිය සුරැකුම්පත් ගිණුම් සම්බන්ධ පද්ධතියෙන් පිටත ක්‍රියාවලියකි)

### 5.13 ගනුදෙනු වාර්තාකරණයට අදාළ විශේෂ උපදෙස්

සියලු සහභාගිකරුවන් අතර සිදුවන ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම් හා අත්පිට ගනුදෙනු වාර්තා කිරීමේදී පහත සඳහන් වන විශේෂිත උපදෙස් පිළිපැදිය යුතුය.

| විස්තරය | වාහක-අගය (සහභාගිකරු විසින් ඇතුළත් කළ යුතුය.) SWIFT (22F::SETR/ XXXX) | ආපසු ලබාදෙන දිනය (සහභාගිකරු විසින් ඇතුළත් කල යුතුය) | ප්‍රතිමිලදී ගැනීම් වර්ගය පළමු පාදය (ලංකාසෙක්‍යු පද්ධතියෙන් ස්වයංක්‍රීයව ජනනය කරනු ලැබේ.) | පණිවිඩ වර්ගය (Message type) (IMT) පළමු පාදය (ලංකාසෙක්‍යු පද්ධතියෙන් ස්වයංක්‍රීයව ජනනය කරනු ලැබේ.) | ප්‍රතිමිලදී ගැනීම් වර්ගය දෙවන පාදය (ලංකාසෙක්‍යු පද්ධතියෙන් ස්වයංක්‍රීයව ජනනය කරනු ලැබේ.) | පණිවිඩ වර්ගය (Message type) (IMT) දෙවන පාදය ලංකාසෙක්‍යු පද්ධතියෙන් ස්වයංක්‍රීයව ජනනය කරනු ලැබේ.) |
|---|---|---|---|---|---|---|
| අන්තර් සහභාගිකරු- **(පළමු පාදය)** ස්වයංක්‍රිය ආපසු හැරවීම සමඟ | MT 543 **REPU** MT 541 **RVPO** | ඉදිරි දිනය | REPO | REP, RRE | REPC | RRE, REP |
| අන්තර් සහභාගිකරු- **(පළමු පාදය)** අපේක්ෂිත ස්වයංක්‍රිය නොවන ආපසු හැරවීම් සමඟ | MT 543 **REPU** MT541 **RVPO** | පළමු පාද පියවීමේ දිනයට සමාන දිනය | REPO | REP, RRE | N/A | N/A |
| අන්තර් සහභාගිකරු **(දෙවන පාදය)** ආපසු හැරවීම ස්වයංක්‍රිය නොවන සමඟ | MT543 **RVPO** MT541 **REPU** | පළමු පාද පියවීමේ දිනයට සමාන දිනය | REPC | REP, RRE | N/A | N/A |
| ගනුදෙනුකරු **(පළමු පාදය)** ස්වයංක්‍රිය ආපසු හැරවීම සමඟ | MT 542 **REPU** | ඉදිරි දිනය | REPO | CRE | REPC | CRR |
| ගනුදෙනුකරු **(පළමු පාදය)-** අපේක්ෂිත ස්වයංක්‍රිය නොවන ආපසු හැරවීම සමඟ | MT542- **REPU** | පළමු පාද පියවීමේ දිනයට සමාන දිනය | REPO | CRE | N/A | N/A |
| ගනුදෙනුකරු **(දෙවන පාදය)** ස්වයංක්‍රිය නොවන ආපසු හැරවීම | MT542- **RVPO** | පළමු පාද පියවීමේ දිනයට සමාන දිනය | REPC | CRR | N/A | N/A |
| ගනුදෙනුකරු **(පළමු පාදය)** ස්වයංක්‍රිය ආපසු හැරවීම සමඟ | CSSTrades (CBSLNet-MTF) **REPO** | ඉදිරි දිනය | REPO | CRE | REPC | CRR |
| ගනුදෙනුකරු **(පළමු පාදය)** ස්වයංක්‍රිය නොවන ආපසු හැරවීම සමඟ | CSS Trades (CBSL Net-MTF)- **REPO** | පළමු පාද පියවීමේ දිනයට සමාන දිනය | REPO | | N/A | N/A |
| ගනුදෙනුකරු- **(දෙවන පාදය)** ස්වයංක්‍රිය නොවන ආපසු හැරවීම | CSS Trades (CBSL Net-MTF)- **REPC** | පළමු පාද පියවීමේ දිනයට සමාන දිනය | REPC | CRR | N/A | N/A |

**සටහන: නැවත ස්ථානගත කෙරෙන ගනුදෙනු 22F: SETR// OWNI යන පරාමිතිය සහිතව SWIFT MT542 යන පණිවිඩ වර්ගය භාවිතා කරමින් සිදුකෙරෙයි නම් ඒවා භාවිතා කළ යුත්තේ ගනුදෙනුකරුවන්ගේ අත්පිට ගනුදෙනු (මිලදී ගැනීම් හෝ විකුණුම් ) සඳහා පමණි.**

**5.14 ලංකාසෙක්‍යු පද්ධතිය තුළ පෙළගැසීම්**

පියවීම සිදු කරනු ලබන අවස්ථාවේ දී ලංකාසෙක්‍යු පද්ධතිය තුළ ඇති සුරැකුම්පත් ගිණුම්වල පවතින ශේෂය ඉක්මවා යන පරිදි සුරැකුම්පත් ඉවත්කර ගැනීමට අදාළ පියවීමේ උපදෙස් සහභාගිකරු විසින් ඇතුළත් නොකළ යුතුය. පියවීමේ උපදෙස්වල සඳහන් කරන ලද සුරැකුම්පත් එහි සඳහන් අදාළ ගිණුම තුළ නොපවතියි නම් එම සුරැකුම්පතේ උපදෙස්වල සඳහන් සුරැකුම්පත් ලංකාසෙක්‍යු පද්ධතිය තුළ පෙළ ගැසේ.

ගනුදෙනු පියවීම සිදුවන දිනයේදී ප්‍රමුඛතා පදනම මත පෙළගැස්ම සකස් වේ. ප්‍රමුඛතාවය තුළ, උපදෙස් ගළපන ලද වේලාව හා දිනය මත හෝ ගැළපුම් අවශ්‍ය නොවන තනි ගනුදෙනු සඳහා උපදෙස් ඇතුළත් කරන ලද දිනය සහ වේලාව මත හෝ පෙළ ගැස්ම සකස් වේ.

සහභාගිකරුවන්ගේ මෙම පෙළගැස්වීම, ජාල හිරවීම සඳහා විසඳුම (Gridlock Resolution) නිශ්කාෂණය පහසුකම්, මහබැංකුව සෘජුවම තනි පුද්ගල ගනුදෙනු සඳහා ප්‍රති ප්‍රමුඛතාවය ලබා දීම, විශේෂිත ගනුදෙනු වලට නියම කරන ලද ප්‍රමුඛතා ලබා දීම වැනි පහසුකම් තුළින් ප්‍රමුඛතාවයන් ඉක්මවා යා හැකි බව සහභාගීකරුවන් පිළිගනී. ගනුදෙනුව පියවෙන දිනය හෝ ඊට පෙර සුරැකුම්පත් උපදෙස් සඳහා දෙනු ලබන එම ප්‍රමුඛතාවයන් වෙනස් කළ හැකි අතර සහභාගිකරුවන් මගින් දෙනු ලබන ප්‍රමුඛතාවයට අනුව සියළුම සුරැකුම්පත් උපදෙස් පෙළ ගැසීම සිදුවේ. බ්‍රව්සර් අතුරුමුහුණත් පහසුකම හරහා මෙම ප්‍රමුඛතා වෙනස්කිරීම් සිදු කළ හැකිය.

ඉහළම ප්‍රමුඛතාවය 0 වූද, 99 අවම ප්‍රමුඛතාවය වූද 0 සහ 99 අතර පරාසයක විහිදුණු අංක මගින් ප්‍රමුඛතාවය පවරනු ලැබේ. 12 සිට 98 දක්වා වූ ප්‍රමුඛතා පරාසය සහභාගිකරුවන් සඳහා පවතියි. පද්ධතියේ ක්‍රියාකරු ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව සහ පද්ධතිය සඳහා වෙන්වූ ප්‍රමුඛතාවයන් 0 සිට 11 දක්වා වේ. උදාහරණයක් ලෙස එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි අරමුදල් කාලීන වශයෙන් බෙදාහැරීම සහ නැවත ලබා ගැනීම සහතික කිරීම සඳහා එක්දින ද්‍රවශීලතා ගනුදෙනු සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් වූ අංක 5 ලබා දී ඇත.

සහභාගිකරුවෙකු විසින් ප්‍රමුඛතා අංකයක් නොමැතිව ගෙවීම් උපදෙසක් හෝ සුරැකුම්පත් උපදෙසක් ඇතුළත් කළ හොත් පද්ධතිය මගින්ම එයට අංක 98 ලබා දෙනු ඇත. එනම්, එය සහභාගිකරුගේ පෙළගැස්මෙහි එම මොහොතේ පවතින පසුපසට යැවෙනු ඇත.

**5.15 ලංකාසෙක්‍යු පද්ධතියෙහි ජාල හිරවීම සඳහා විසඳුම (Gridlock Resolution)**

අරමුදල් පියවීම සඳහා පෙළගැසී ඇති ගෙවීම් උපදෙස් නිරවුල් කිරීම සඳහා තත්කාලීන දළ පියවුම් (RTGS) පද්ධතිය තුළ පවතින ජාල හිරවීම සඳහා විසඳුම (Gridlock Resolution) පහසුකමට අමතරව ලංකාසෙක්‍යු පද්ධතිය තුළ ද පෙළ ගැසී ඇති සුරැකුම්පත් උපදෙස් නිරවුල් කිරීම සඳහා ජාල හිරවීම සඳහා විසඳුම (Gridlock Resolution) පහසුකම පවතියි.

ලංකාසෙක්‍යු පද්ධතිය තුළ ක්‍රමවත් කාලාන්තර වලට ජාල හිරවීම සඳහා විසඳුම (Gridlock Resolution) ක්‍රියාත්මක වේ. පියවීමට නියමිතව ඇති අනුක්‍රමික අනුපිළිවෙල හේතුවෙන් පද්ධතියේ රැඳවී ඇති ගෙවීම් උපදෙස් කාණ්ඩ වශයෙන් පද්ධතිය විසින් හඳුනා ගනී. ජාල හිරවීම සඳහා විසඳුම (Gridlock Resolution) ගනුදෙනු උපදෙස් වලට පැවරී ඇති ප්‍රමුඛතාවයන් (අනුක්‍රමික අනුපිළිවෙල) යටපත් කරමින් පියවීමේ ක්‍රියාවලිය සිදුකිරීමට නැවත උත්සහ කරයි. මෙම ක්‍රියාවලිය තුලදී RTGS සහ DVP ක්‍රියාවන්ට අදාළ පටිපාටියන් විනය නීති පද්ධතිය මගින් ක්‍රියාවට නංවනු ලැබේ. එබැවින් සුරැකුම්පත් ගිණුම් හෝ පියවීම් ගිණුම් ශේෂයන් ඉක්මවා යාමක් (අයිරා) මෙම ක්‍රියාවලියේ දී සිදු නොවේ.

මෙම ක්‍රියාවලියේ දී මුල් ගෙවීම් උපදෙස් අනුක්‍රමික අනුපිළිවෙල යටපත් වන බව සහභාගිකරුවන් විසින් පිළිගැනේ.

**5.16 දවස අවසාන වන විට ලංකාසෙක්‍යු තුළ නොපියවුණු ගනුදෙනු සඳහා පිළියම**

ගනුදෙනුව පියවීමට අදාළ වලංගු දිනය අවසාන වන විට නොපියවුනු ගනුදෙනු සඳහා අදාළ පියවීමේ උපදෙස් පද්ධතිය මගින් ප්‍රතික්ෂේප කෙරේ. ගනුදෙනු ප්‍රතික්ෂේප වීමක දී අදාළ පාර්ශවයන් හට ප්‍රතික්ෂේප වීම සම්බන්ධව දැනුම් දීමට SWIFT පණිවුඩ නිකුත් කෙරේ.

## 6. ප්‍රාථමික වෙන්දේසි

**6.1 ප්‍රාථමික වෙන්දේසි පද්ධතිය සමඟ ලංකාසෙක්‍යු පද්ධතියේ අන්තර් ක්‍රියාකාරීත්වය**

ප්‍රාථමික වෙන්දේසියකදී පැවැත්වීම සඳහා වන මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබේ.

ප්‍රාථමික වෙන්දේසියක දී ලංසු අනුමත කිරීමේ සහ සුරැකුම්පත් වෙන් කිරීමේ ක්‍රියාවලි සඳහා ලංකාසෙක්‍යු පද්ධතියෙන් අනුග්‍රහයක් නොලැබේ. එම නිසා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඒ සඳහා විශේෂිත වෙන්දේසි පද්ධතීන් පවත්වා ගෙන යනු ලැබේ. කෙසේ වුවත් ප්‍රාථමික වෙන්දේසි මගින් හටගන්නා සියලුම ගෙවීම් අවශ්‍යතාවයන් පියවීම, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ (RTGS System) ඇති පියවුම් ගිණුම් ඔස්සේ සිදු කළ යුතුවේ.

ප්‍රාථමික වෙන්දේසි ගනුදෙනු පියවීමකදී, තත්කාලීන දළ පියවීමේ පද්ධතියේ (RTGS System) පියවුම් ගිණුමට ගෙවිය යුතු මුදල හර වූ පසුව ලංකාසෙක්‍යු පද්ධතිය විසින් සාර්ථක ලංසු තබන්නන්ගේ ගිණුම් වලට සුරැකුම්පත් වල අයිතිය පවරනු ලැබේ.

වෙන්දේසි දිනයන් හා ඊට අදාළ පියවුම් දිනයන් ලංකාසෙක්‍යු පද්ධතියට පරිබාහිරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිවේදනය කරනු ලැබේ.

### 6.2 ප්‍රාථමික වෙන්දේසි පියවීම

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිවේදනය කරන ලද පියවීමේ දිනයන්හීදී 04 වෙනි වෙළුමෙහි රීති අංක 1.2 හි සඳහන් දෛනික මෙහෙයුම් වැඩසටහනට අනුකූලව ප්‍රාථමික වෙන්දේසි පියවීම සිදු කරනු ලැබේ.

පියවීම සිදුකරන අවස්ථාවේදී යම් කිසි සහභාගිකරුවෙකුගේ ගිණුමෙහි පියවීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය නොතිබුණහොත්, සහභාගිකරු වෙත අදාළ සුරැකුම්පතෙහි අයිතිය පවරනු නොලැබේ. ප්‍රාථමික වෙන්දේසි පියවීමක දී ඇතිවන මුදල් ඌණතාවයකදී අනුගමනය කරන ක්‍රියාවලිය මෙම වෙළුමෙහි නීති අංක 6.3 හි පැහැදිලි කරනු ලැබේ.

### 6.3 ප්‍රාථමික වෙන්දේසි පියවීමට ක්‍රියා නොකිරීම

සහභාගිකරුවෙකුට ප්‍රාථමික වෙන්දේසි මිලදී ගැනීමක් පියවීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය නොමැති අවස්ථාවක දී, එම ගනුදෙනුව පෙළ ගස්වනු ලැබේ. එවැනි සහභාගිකරුවන්ට අදාළ පියවීම සම්පූර්ණ කිරීම සඳහා අදාළ පියවීමේ දිනය පැය 13 00 දක්වා කාලය ලබා දෙනු ලැබේ.

පියවීමක් අදාළ දිනයේ පැය 1300 ට පෙර සම්පූර්ණ කිරීමට යම් සහභාගිකරුවෙකු අසමත් වේ ද, එම ගැනුම්කරුවා ප්‍රාථමික වෙන්දේසි පියවීමට අදාළ වගකීම් ඉටු කිරීමට අපොහොසත් වූවෙකු ලෙස සලකනු ලැබේ. එවැනි අවස්ථාවක දී ගනුදෙනුව අහෝසි වන අතර අගරුකිරීම පිළිබඳව ශ්‍රී ලංකා රජය දැනුවත් කරනු ලැබේ. මෙවැනි, අනුමත ලංසුවක් පියවීමේ වගකීම පැහැර හැරීම එම ලංසු තබන්නා හට දැනට පවතින නීති අනුව සම්බාධක පැනවීමට හේතු වේ.

## 7. කල් පිරීම් ගෙවීම

### 7.1 කල් පිරීමේ වටිනාකම් ගෙවීමේ ක්‍රියාවලිය

කල් පිරීමේ මුදල් ප්‍රමාණය, කල් පිරීමේ දිනයේ දී ගෙවිය යුතුවේ.

කල් පිරීමේ මුදල් ගෙවීම කල්පිරීමේ දිනයට පෙරාතුව යෙදෙන ව්‍යාපාරික දිනයේ දී පද්ධතිය විසින්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දෛනික මෙහෙයුම් කාලසටහනෙහි නියම කර ඇති පරිදි ව්‍යාපාර සඳහා පද්ධතිය වසාදමන වේලාවේදී ජනනය කරනු ලැබේ. පියවීම් අදාළ කල් පිරීමේ දිනයේදී අදාළ පියවීම් ගිණුමට බැර කරනු ලැබේ.

කල් පිරීමේ මුදල් ප්‍රමාණයන් ගනුදෙනුකරුවන්ට ගෙවනු ලබන්නේ සහභාගිකරුවකු ඔස්සේ පමණක් වේ. කල් පිරෙන දිනයේ දී, තත්කාලීන දළ පියවීම් (RTGS) පද්ධතියෙහි එක් එක් සහභාගිකරුගේ පියවීම් ගිණුමට තනි පියවීමක් ලෙස සිදුකෙරේ. මෙම තනි පියවීම සහභාගිකරු හිමිකම් දරණ සුරැකුම්පත්හී කල් පිරෙන මුදල් ප්‍රමාණයද සෘජු අලෙවි සහභාගිකරුවකු වන අවස්ථාවකදී එහි ගනුදෙනුකරුවන් හිමිකම් දරණ සුරැකුම්පත්වල කල් පිරෙන මුදල් ප්‍රමාණය යන දෙකම අඩංගු වේ.

එවැනි තනි පියවීමක අඩංගු එක් එක් කල් පිරීමේ මුදල් ගෙවීම් වලට අදාළ විස්තර පද්ධතියේ අතුරු මුහුණතෙන් ලබා දෙයි. (එක් එක් ගනුදෙනුකරුගේ කල් පිරෙන පියවීම් වාර්තාව අතුරු මුහුණත ඔස්සේ ලබාගත හැකිය.)

### 7.2 කල් පිරීමට පෙර පියවීමේ විකල්පය සහිත සුරැකුම්පත්

අදාළ නීති වලට අනුකූලව, රජය විසින් සුරැකුම්පත් නිකුත් කරන අවස්ථාවේ දී එම සුරැකුම්පත් කල් පිරීමට පෙර නිදහස් කිරීමේ හැකියාව සහිතව නිකුත් කිරීම සිදු කරනු ලැබේ. එවැනි පෙර නිදහස් කර ගැනීමකදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුරැකුම්පත්දාරීන් දැනුවත් කරනු ලබයි.

### 7.3 කල් පිරීමේ දිනය බැංකු නිවාඩු දිනයක් වීම

කල් පිරීමේ දිනයක් බැංකු නිවාඩු දිනයක් වන අවස්ථාවකදී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වෙනස් නීති මාලාවක් අනුගමනය කෙරේ.

භාණ්ඩාගාර බිල්පත් සඳහා මෙවන් අවස්ථාවක දී, කල් පිරෙන දිනයට පෙර යෙදෙන ආසන්නතම ව්‍යාපාරික දිනයේදී කල් පිරෙන මුදල් ප්‍රමාණයට කිසිඳු වෙනස්කමක් නොමැතිව පියවීම සිදු කෙරේ.

කෙසේ වෙතත්, 2022.01.01 දිනට හෝ ඊට පසුව එළඹෙන බැංකු නිවාඩු දිනයක දී භාණ්ඩාගාර බිල්පතක් කල් පිරෙන අවස්ථාවකදී කල් පිරෙන දිනයට පසුව යෙදෙන ආසන්නතම පළමු ව්‍යාපාරික දිනයේ දී කල් පිරෙන මුදල් ප්‍රමාණයට කිසිදු වෙනස්කමක් නොමැතිව පියවීම සිදු කෙරේ.

භාණ්ඩාගාර බැඳුම්කර සඳහා මෙවැනි අවස්ථාවකදී, කල් පිරෙන දිනයට පසුව යෙදෙන ආසන්නතම පළමු ව්‍යාපාරික දිනයේ දී කල් පිරෙන මුදල් ප්‍රමාණයට කිසිඳු වෙනස්කමක් නොමැතිව පියවීම සිදු කෙරේ.

**7.4 කල් පිරීමේ ගෙවීම් ගනුදෙනුකරුවන් වෙත ගෙවීම සම්බන්ධයෙන් සහභාගිකරුගේ වගකීම්**

අදාළ වන ලිඛිත නීතීන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති විධානයන්ට අනුකූලව සෘජු අලෙවි සහභාගිකරුවන් විසින් ගනුදෙනුකරුවෙකුට අදාළ කල්පිරීමේ ගෙවීම් තම ගිණුමට බැර වූ පසු ගනුදෙනුකරුවාට හෝ ඒ සඳහා හිමිකම් සහිත ඕනෑම පුද්ගලයෙකුට නියමිත කාලරාමු තුළදී ගෙවීම් සිදුකළ යුතුය.

**7.5 ගනුදෙනුකරුවන්ට කල් පිරීමෙන් ලැබෙන මුදල් ගෙවීමට නොහැකි වීම.**

මෙම වෙළුමේ 7.4 හි නීතිය අනුව සහ මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන්ට අනුව සහභාගිකරුවෙකු හට ඔහුගේ පාලනයෙන් ඔබ්බට ගිය හේතූන් මත ගනුදෙනුකරුවෙකුට කල් පිරීමේදි ගෙවිය යුතු මුදල් ගෙවීමට නොහැකි වූ විට, එම නොගෙවූ මුදල් දෙන ලද කාල රාමුව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත (රජයේ සුරැකුම්පත් හිමිකම් නොපෑ ගිණුමේ බැරට) ප්‍රේෂණය යුතුය.

එවැනි ප්‍රේෂණ සඳහා වන ගෙවීම් උපදෙස් වල, මුදල් ආපසු පැමිණීමට හේතුව සහ සුරැකුම්පත් කල් පිරීමට අදාළ මුල් ගෙවීම් පිළිබඳ සියලු විස්තර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**8. පොලී ගෙවීම**

**8.1 පොලී ගෙවීම් ක්‍රියාවලිය**

අදාළ කාණ්ඩය සඳහා නියම කර ඇති පොලී ගෙවීම් දිනයන්හිදී පොලී ගෙවීම් සිදු කළ යුතු වේ. නිර්ලේඛිත සුරැකුම්පත් වල හිමිකරුවන් සඳහා අදාළ පොලී ගෙවීම සිදු කරනු ලබන්නේ සහභාගිකරුවන් හරහා පමණි. මේ සඳහා ගෙවීම් සිදු කළ යුතු දිනයේ දී, සහභාගිකරුවන්ගේ තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ ඇති පියවීමේ ගිණුම් වලට තනි ගෙවීමක් ලෙස සිදු කරනු ලබයි. මෙම තනි ගෙවීම තුළ සෘජු අලෙවි සහභාගිකරුවෙකු සිටින අවස්ථාවකදී සහභාගිකරුවන් හිමිකම් දරන සුරැකුම්පත් සඳහා මෙන්ම එහි ගනුදෙනුකරුවන්ට හිමි සුරැකුම්පත් සඳහාද ගෙවිය යුතු මුළු පොලිය ද අන්තර්ගත වේ.

මෙම තනි ගෙවීමට අන්තර්ගතවූ එක් එක් පුද්ගලයාට අදාළ පොලී ගෙවීම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු, පද්ධතියේ අතුරු මුහුණත මගින් (Browser Interface) ලබාදෙයි. එමෙන්ම එක් පුද්ගලයාට අදාළ පොලී ගෙවීම් පිළිබඳ විස්තර වාර්තාවක් පද්ධති අතුරු මුහුණත මඟින් ලබාගත හැක.

**8.2 නිවාඩු දිනයන් වලට යෙදෙන පොලී ගෙවීම**

භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන පොලී ගෙවීම නිවාඩු දිනයකට යෙදුනහොත්, අදාළ ගෙවීම එම නිවාඩු දිනයට පසුව යෙදෙන පළමු ව්‍යාපාරික දිනයේ දී පොලී මුදල් ප්‍රමාණයට කිසිඳු වෙනස්කමක් නොමැතිව සිදු කරනු ලබයි.

**8.3 වාර්තාගත හිමිකමට අනුව පොලිය ගෙවීම**

පොලිය ගෙවීමට නියමිත දිනයට පෙර ව්‍යාපාරික දිනය අවසානයේදී ලංකාසෙක්‍යු පද්ධතියේ වාර්තා වී ඇති සුරැකුම්පත් හිමිකමට අනුව සහභාගිකරුවන් වෙත පොලී මුදල් ගෙවීම සිදු කරනු ලබයි.

සුරැකුම්පත් ගනුදෙනු කර ඇති නමුත් පියවීම හෝ පැවරීම ලංකාසෙක්‍යු පද්ධතිය තුළ සිදු නොකර ඇති අවස්ථාවකදී, සහභාගිවන්නන් විසින් පොලී ගෙවීම් නිවැරදි ප්‍රතිලාභියා වෙත ලැබීම තහවුරු කළ යුතුය. එකතු වුණ පොලිය (එනම් ඉදිරියට ලැබිය යුතු පොලිය, විකුණුම් මිලෙහි අන්තර්ගත වීම) පදනමින් සුරැකුම්පත් අලෙවි කර ඇති විටදී, සුරැකුම්පත්හී නව හිමිකරු වෙත පොලිය ලබා දිය යුතුය. පොලී ගෙවීමට නියමිත දිනයට පෙර කරනු ලබන බොහෝ සුරැකුම්පත් අලෙවියන්ගේ මිල එකතු වුණ පොලිය පදනමින් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ.

පොලී ගෙවීමක නිවැරදි ප්‍රතිලාභියා පිළිබඳ සහභාගිවන්නා හට අවිනිශ්චිත අවස්ථාවකදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඒ සඳහා විධානයන් නිකුත් කර ඇති නම් ඒ අනුව ගනුදෙනුවේ විස්තරාත්මක සියලු තොරතුරු සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ ගෙවීම ආපසු ලබා දිය යුතුය (රජයේ සුරැකුම්පත් හිමිකම් නොපෑ ගිණුමේ බැරට).

**8.4 ගනුදෙනුකරුවාට අයත් පොලී ගෙවීමේදී සහභාගිකරුගේ වගකීම**

ගනුදෙනුකරුවෙකු හෝ යම් අදාළ ලිඛිත නීතියක් යටතේ හිමිකම් ලබන ඕනෑම පුද්ගලයෙකුට/පුද්ගලයින්ට අදාළ පොලී ගෙවීමක් සහභාගිකරුගේ ගිණුමට ලැබීමෙන් පසු, සහභාගිකරු විසින් දෙන ලද කාල රාමුව තුළ හා ඊට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද යම් විධානයක් වේ නම්, ඒ අනුව ගනුදෙනුකරුට හෝ හිමිකම් ලබන එවැනි පුද්ගලයින්ට එකී පොලී ගෙවීම සිදු කළ යුතුය.

**8.5 ගනුදෙනුකරුට පොලී ගෙවීමට නොහැකි වීම**

සහභාගිකරු විසින් නියමිත පොළිය අදාළ ගනුදෙනුකරුට හෝ හිමිකම්ලාභි පුද්ගලයෙකුට ගෙවීමට නොහැකි වූ අවස්ථාවකදී, එවැනි මුදල්, දෙන ලද කාල රාමුව තුළ සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ විධිවිධාන නිකුත් කර ඇත්නම්, ඊට අනුකූලව (රජයේ සුරැකුම්පත් හිමිකම් නොපෑ ගිණුමේ බැරට) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ආපසු ලබාදිය යුතුය.

එවැනි ප්‍රේෂණ සඳහා ගෙවීම් උපදෙස්වල, ආපසු මුදල් පැමිණීමට හේතුව සහ මුල් පොලී ගෙවීම් වල විස්තර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**9. ගනුදෙනුකරුවන්ගේ ප්‍රකාශන**

**9.1 ගනුදෙනුකරුවන්ගේ තොරතුරු වාර්තාගත කිරීම**

ගනුදෙනුකරුවන්ගේ තොරතුරු පහත දැක්වෙන පරිදි කාණ්ඩ 3ක් යටතේ වාර්තා කළ යුතුය.

| 1. හිමිකරුගේ තොරතුරු | | |
|---|---|---|
| **ශීර්ෂය** | **අක්ෂර ගණන** | **අන්තර්ගතය** |
| හිමිකරුගේ කේතය | අක්ෂර 20 | ගනුදෙනුකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය, සමාගම් ලියාපදිංචි අංකය හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලැබූ වෙනත් හඳුනාගැනීමේ ලියවිල්ලක අංකය |
| විකල්ප කේතය 1 | අක්ෂර 10 | සහභාගිකරු විසින් භාවිතා කරන ගනුදෙනුකරුගේ අභ්‍යන්තර යොමු අංකය |
| විකල්ප කේතය 2 | අක්ෂර 20 | ගනුදෙනුකරු හඳුනාගැනීමට අදාල වෙනත් තොරතුරු |
| හිමිකරු වර්ගය | | ඇමුණුම ඇ හි දැක්වෙන පරිදි ප්‍රතිලාභ හිමියාගේ වර්ගීකරණය |
| **2. ප්‍රාථමික සම්බන්ධීකරණ/ඇමතුම් තොරතුරු** | | |
| **ශීර්ෂය** | **අක්ෂර ගණන** | **අන්තර්ගතය** |
| නම | අක්ෂර 100 | ගනුදෙනුකරුගේ නම |
| ලිපිනය | අක්ෂර 35 බැගින් වූ පේළි 3 ක් | ගනුදෙනුකරුගේ තැපැල් ලිපිනය |
| දුරකථන අංකය (ස්ථාවර) | අක්ෂර 20 | ගනුදෙනුකරුගේ ස්ථාවර දුරකථන අංකය |
| ජංගම දුරකථන අංකය | අක්ෂර 20 | ගනුදෙනුකරුගේ ජංගම දුරකථන අංකය |
| ෆැක්ස් අංකය | අක්ෂර 20 | ගනුදෙනුකරුගේ ෆැක්ස් අංකය |
| විද්‍යුත් තැපැල් ලිපිනය | අක්ෂර 50 | ගනුදෙනුකරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය |
| හුවමාරු/පියවීම් දැනුම්දීම් මාධ්‍යය | - | "SMS", "Email", "SMS and Email", "none" විකල්ප අතරින් තෝරා ගැනීම |
| උපන් දිනය | DD/MM/YYYY | දින ආකෘතිය |
| **3. විකල්ප සම්බන්ධීකරණ/ ඇමතුම් තොරතුරු** | | |
| **ශීර්ෂය** | **අක්ෂර ගණන** | **අන්තර්ගතය** |
| නම | අක්ෂර 100 | ගනුදෙනුකරුගේ නම |
| ලිපිනය | අක්ෂර 35 බැගින් වූ පේළි 3ක් | ගනුදෙනුකරුගේ විකල්ප තැපැල් ලිපිනය |
| විද්‍යුත් තැපැල් ලිපිනය | අක්ෂර 50 | ගනුදෙනුකරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය |

ගනුදෙනුකරු තනි පුද්ගලයෙකු නම් ජාතික හැඳුනුම්පත් අංකය (ජා.හැ.අ.) ද සමාගමක් නම් සමාගම් ලියාපදිංචි අංකය (ස.ලි.අ.) හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලැබූ වෙනත් හඳුනාගැනීමේ ලියවිල්ලක අංකය ද, මූලික ප්‍රතිලාභ හිමියාගේ කේතය ලෙස සලකනු ලැබේ. මීට අමතරව ජාතික හැඳුනුම්පතේ/ සමාගම් ලියාපදිංචි සහතිකයේ/ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලැබූ වෙනත් හඳුනාගැනීමේ ලියවිල්ලක සඳහන් පරිදි ආයෝජකයාගේ නම ලේඛනගත කළ යුතුය. **ඇමුණුම ඇ** හි දී ඇති ලැයිස්තුව අනුව සෘජු අලෙවි සහභාගිකරු විසින් ආයෝජකයන් වර්ගීකරණය කළ යුතු වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවන්ගේ ගනුදෙනුකරුවන් වෙත ප්‍රකාශන යැවීමේ දී එම සහභාගිකරුවන් විසින් නම තැපැල් ලිපිනය, ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය යන ශීර්ෂ යටතේ ලේඛනගත කරන ලද තොරතුරු භාවිතා කරනු ලැබේ. එම නිසා ගනුදෙනුකරුවන් වෙත නියමිත වේලාවට ප්‍රකාශන ලැබීමට පහසුකම් සැලසීමට නම්, නම සහ ලිපිනය ඇතුළු ගනුදෙනුකරුවන්ගේ විස්තර සම්පූර්ණ මෙන්ම යාවත්කාලීන විස්තර වීම අවශ්‍ය වේ. යම් සහභාගිකරුවෙකු යටතේ සිටින ගනුදෙනුකරුවෙකු (මධ්‍යම තැන්පත් පද්ධතියේ ගිණුම් හිමියෙකු) සිය නම, ලිපිනය, ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය යන තොරතුරු වල වෙනසක් සිදු කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර එම සහභාගිකරු වෙත එසැණින්ම දැනුම්දෙනු ලබන බවට එම සහභාගිකරු වගබලා ගත යුතු අතර එම විස්තර ගනුදෙනුකරු දැනුම්දුන් පරිදි එසැණින් මධ්‍යම තැන්පතු පද්ධතියේ සංශෝධනය කිරීම සහභාගිකරුගේ වගකීම වේ.

ඉහත තොරුතුරු නිවැරදි සහ යාවත්කාලීන බවට සහභාගිකරු සැමවිටම වගබලාගත යුතුවේ.

### 9.2 ගනුදෙනුකරුවන්ගේ හිමිකම් සහ ගනුදෙනු සම්බන්ධ ප්‍රකාශනය

මෙම වෙළුමෙහි රීති අංක 10.2 ට යටත්ව, සුරැකුම්පත් හිමිකම් සහ ගනුදෙනු පිළිබඳ ප්‍රකාශයන් සෘජුවම ලංකාසෙක්‍යු පද්ධතියෙහි වාර්තා වී ඇති අදාළ සුරැකුම්පත් ගිණුමෙහි ගනුදෙනුකරු වෙත යවනු ලැබේ. මෙය ගනුදෙනුකරුවන් හට සිය සුරැකුම්පත් හිමිකම් සහ ගනුදෙනු පිළිබඳව තහවුරුවක් දෙනු ලබයි. හිමිකම් ප්‍රකාශයන් අර්ධ වාර්ෂිකව සපයනු ලබන අතර ගනුදෙනු ප්‍රකාශයන් මාසිකව සපයනු ලැබේ. මෙම ප්‍රකාශනය, අදාළ සෘජු අලෙවි සහභාගිකරු විසින් සපයනු ලබන ප්‍රාථමික තහවුරු කිරීමට අමතර, ද්විතියික තහවුරු කිරීමක් ලෙස සලකනු ලැබේ.

සහභාගිකරුවන් සම්බන්ධයෙන්, ඔවුන්ට එම විස්තර SWIFT හරහා ලංකාසෙක්‍යු පද්ධතිය වෙතින් හෝ සෙවුම් අතුරු මුහුණත ඔස්සේ සෘජුවම ලබා ගත හැක.

මීට අමතරව, ගනුදෙනුකරුවන්ට සහ සහභාගිකරුවන්ට සිය සුරැකුම්පත් හිමිකම් සහ ගනුදෙනු පිළිබඳ විස්තර පිරික්සීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයා ඇති "ලංකාසෙක්‍යු නෙට්" පහසුකම භාවිත කළ හැකි අතර ඒ සඳහා අදාළ සෘජු අලෙවි සහභාගිකරු හරහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පරිශීලක නාමය/අනන්‍යතාවය (User ID) සහ මුරපදයක් ලබාගත යුතුය.

### 9.3 ගනුදෙනුකරුවන්ගේ පොලී හා කල්පිරීම සම්බන්ධ ප්‍රකාශන

කල්පිරීම් සහ පොලී ගෙවීම් අවසානයේ ඒ සම්බන්ධයෙන් වන ප්‍රකාශනයන් ගනුදෙනුකරු වෙත සෘජුවම යවනු ලැබේ. මෙමඟින් ගනුදෙනුකරුවන් හට සෘජු අලෙවි සහභාගිකරු හරහා තමාට ලැබිය යුතු කල් පිරීම් සහ පොලී ගෙවීම් පිළිබඳ විස්තර ලබා ගත හැක. මෙම ප්‍රකාශනය, අදාළ සෘජු අලෙවි සහභාගිකරු විසින් සපයනු ලබන ප්‍රාථමික තහවුරු කිරීමට අමතර ද්විතියික තහවුරු කිරීමක් ලෙස සලකනු ලැබේ.

සහභාගිකරුවන් සම්බන්ධයෙන්, ඔවුන්ට එම විස්තර SWIFT හරහා ලංකාසෙක්‍යු පද්ධතිය වෙතින් හෝ සෙවුම් අතුරු මුහුණත ඔස්සේ සෘජුවම ලබා ගත හැක.

මීට අමතරව, ගනුදෙනුකරුවන්ට සහ සහභාගිකරුවන්ට සිය සුරැකුම්පත් හිමිකම් සහ ගනුදෙනු පිළිබඳ විස්තර පිරික්සීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අන්තර්ජාලය හරහා සපයා ඇති "ලංකාසෙක්‍යු නෙට්" පහසුකම භාවිත කළ හැකි අතර ඒ සඳහා අදාළ සෘජු අලෙවි සහභාගිකරු හරහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පරිශීලක නාමය/ අනන්‍යතාවය (User ID) සහ මුරපදයක් ලබාගත යුතුය.

### 9.4 සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධ කෙටිපණිවිඩ/විද්‍යුත් තැපැල හරහා දැනුම් දීම

ඉහත 9.2 රීතියෙහි සඳහන් වන ගනුදෙනු සම්බන්ධ ගනුදෙනුකරුවන්ගේ මාසික ප්‍රකාශනයන්ට අමතරව, සෘජු අලෙවි සහභාගිකරුවෙකු හරහා ලංකාසෙක්‍යු පද්ධතියෙහි පවත්වාගෙන යනු ලබන ගනුදෙනුකරුවකුගේ පාරිභෝගික සුරැකුම්පත් ගිණුමක සිදුවන සෑම ගනුදෙනුවකටම අදාළව එම ගනුදෙනුව සිදු වූ වහාම කෙටි පණිවිඩ සේවාව සහ/හෝ විද්‍යුත් තැපැල හරහා දැනුම්දීමක් සිදු කෙරේ. මෙමඟින් ගනුදෙනුකරු හට ගනුදෙනු සම්බන්ධ තත්කාලීන දැනුම්දීමක් ලැබේ. මෙම දැනුම්දීම් අදාළ සෘජු අලෙවි සහභාගිකරු විසින් සපයනු ලබන ප්‍රාථමික තහවුරු කිරීමට අමතර ද්විතියික තහවුරු කිරීමක් වේ.

### 9.5 ලිපිනයන් වැරදි ලෙස වාර්තා වීම

ගනුදෙනුකරුවෙකුගේ ප්‍රකාශනයක් තැපැල් මගින් බාරදිය නොහැකිව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ආපසු හරවා ලැබුනේ නම් හෝ විද්‍යුත් තැපැල් දැනුම්දීමක් ආපසු හරවා ලැබුනේ නම් අදාළ ඍජු අලෙවි සහභාගිකරු හරහා ලිපිනයන් සම්බන්ධ තොරතුරු නිවැරදි කරනු ලැබීම අවශ්‍ය වේ. මේ පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව අදාළ සහභාගිකරු දැනුවත් කිරීම සිදු කරනු ලබන අතර සහභාගිකරු විසින් ලංකාසෙක්‍යු පද්ධතියෙහි ඇති අදාළ ගනුදෙනුකරුගේ ලිපිනය/විද්‍යුත් තැපැල් ලිපිනය වහාම නිවැරදි කළ යුතු වේ. මාස දෙකක කාලයක් තුළදී නව ලිපිනයක් වාර්තා කිරීමට සහභාගිකරු අපොහොසත් වන්නේ නම්, ලිපිනය ඉවත් කර "ගනුදෙනුකරු සම්බන්ධ කර ගැනීමට නොහැකිය" යනුවෙන් ප්‍රතිස්ථාපනය කළ යුතුය. ඍජු අලෙවි සහභාගිකරු විසින් ගනුදෙනුකරු සම්බන්ධ කර ගැනීමට දැරූ ප්‍රයත්නයන් පිළිබඳ වාර්තාවන් පවත්වාගෙන යා යුතුවේ.

## 10. ඔඩපන කිරීම

### 10.1. ඔඩපන සටහන් කිරීම

ඔඩපන සටහන් කිරීම සඳහා වෙනම ගිණුම් වර්ගයක් ඇත. මෙම ගිණුම් වර්ගය යටතේ සුරැකුම්පත් හුවමාරු කිරීමට හැකි එකම ක්‍රමය නම් ගනුදෙනු නැවත ප්‍රතිස්ථාපනය කිරීමයි. මෙම ගිණුම් ස්ථාපනය කිරීමෙන් පසුව මෙම ගිණුම් වලින් සුරැකුම්පත් මිලදී ගැනීමට හෝ විකිණීමට සහභාගිකරුවන්ට නොහැක.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අභිමතය පරිදි ඇතැම් සුරැකුම්පත් වර්ග ඔඩපන කිරීමට නොහැකි සුරැකුම්පත් ලෙස හඳුන්වාදෙනු ලබන අතර ලංකාසෙක්‍යු පද්ධතිය මගින් අවශ්‍යතාවය පදනම්ව එවැනි සීමා කිරීම් ක්‍රියාත්මක කරනු ඇත.

2004 අංක 2 දරණ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් (ගනුදෙනු) සඳහා වූ නියෝග හා 2004 අංක 2 දරන සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර (ගනුදෙනු) සඳහා වූ නියෝග අනුව සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර ඔඩපන කිරීමට හැකිය.

සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ඔඩපන කිරීම සඳහා ඔඩපනලාභියෙකු වෙත සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර භාර දීම සිදු කළ යුතුය.

පහත සඳහන් ඡේදයට යටත්ව, සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර ලබා දීම, බලපවත්වනු ලබන්නේ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර ඔඩපනලාභියකු හෝ ඔඩපන දායකයකු නොවන ඍජු අලෙවි සහභාගිකරුවෙකු විසින් නඩත්තු කරනු ලබන ඔඩපන ගිණුමකට මාරු කිරීමෙන් පසුවය. මෙම ගිණුමෙහි ඔඩපනදායකයා සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර වල හිමිකරු වශයෙන් සඳහන් කරනු ලැබේ.

ඉහත ඡේදයෙන් එසේ සඳහන් වුවද, උකස් පනත (89 ඡේදය) අනුව ඔඩපනලාභියා සහතිකලත් ණය නියෝජිත ආයතනයක් වන විටදී, නිර්ලේඛිත භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර ඔඩපනය, පහත සඳහන් අංක (i) හෝ (ii) පරිදි සිදු කළ හැකිය.

එසේම ඔඩපනලාභියා සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කරයෙහි හිමිකරු වශයෙන් සඳහන් කරනු ලැබේ.

i. ඔඩපනලාභියා ඍජු සහභාගිකරුවෙකු වන අවස්ථා වලදී, ඔඩපනයට යටත් වන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර ඔඩපනලාභියා විසින් පවත්වාගෙන යනු ලබන ඔඩපන ගිණුමට මාරු කිරීමෙන්,

ii. ඔඩපනලාභියා ඍජු සහභාගිකරුවෙකු නොවන අවස්ථා වලදී, ඔඩපනයට යටත්වන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර අලෙවිකරණ ඍජු සහභාගිකරුවෙකු විසින් පවත්වාගෙන යනු ලබන ඔඩපන ගිණුමට මාරු කිරීමෙන්.

ඔඩපන ගිණුම පවත්වා ගෙන යන සහභාගිකරු විසින්, එම ගිණුම සඳහා පද්ධතිය තුළ වෙනම හිමිකම් වාර්තාවක් පිහිටුවා ගත යුතුවේ. හිමිකරුගේ නම හා ලිපිනය වාර්තා කිරීම සඳහා සාමාන්‍යයෙන් භාවිතා කරනු ලබන ක්ෂේත්‍ර වල ඔඩපන තොරතුරු වාර්තා කරනු ලැබේ.

| ක්ෂේත්‍රය | අක්ෂර ගණන | අන්තර්ගතය |
|---|---|---|
| හිමිකරු | අක්ෂර 20 | ගනුදෙනුකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය, සමාගම් ලියාපදිංචි අංකය හෝ ශ්‍රී ලංකා මහ බැංකු විසින් අනුමත කරනු ලැබූ වෙනත් හඳුනාගැනීමේ ලියවිල්ලක අංකය |
| නම ලිපිනය | රේඛාව 1 | ඔඩපනකරුගේ /ඔඩපන දායකයාගේ නම (එනම් හිමිකරු) |
| නම ලිපිනය | රේඛාව 2 | ඔඩපනලාභියාගේ නම |
| නම ලිපිනය | රේඛාව 3 | නිකුත් කිරිමට අපේක්ෂිත දිනය (දිනය, මාසය, අවුරුද්ද) |
| නම ලිපිනය | රේඛාව 4 | ඔඩපනහි තත්වය - උදාහරණ: ඔඩපනය ආරවුලකට හෝ හිමිකමකට යටත් නම් මෙම ක්ෂේත්‍රය යොදා ගත යුතුය උදා - ගෙවීම පැහැර හැරීම |
| විකල්ප හිමිකරුගේ කේතය | අක්ෂර 20 | සහභාගිකරු විසින් භාවිතා කරන ගනුදෙනුකරුගේ අභ්‍යන්තර යොමු අංකය |

| 1. හිමිකරුගේ විස්තර | | |
|---|---|---|
| ක්ෂේත්‍රය | අක්ෂර ගණන | අන්තර්ගතය |
| හිමිකරුගේ කේතය | අක්ෂර 20 | ගනුදෙනුකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය, සමාගම් ලියාපදිංචි අංකය හෝ ශ්‍රී ලංකා මහ බැංකු විසින් අනුමත කරනු ලැබූ වෙනත් හඳුනාගැනීමේ ලියවිල්ලක අංකය |
| විකල්ප කේතය 1 | අක්ෂර 10 | සහභාගිකරු විසින් භාවිතා කරන ගනුදෙනුකරුගේ අභ්‍යන්තර යොමු අංකය |
| විකල්ප කේතය 2 | අක්ෂර 20 | ගනුදෙනුකරු හඳුනාගැනීමට අදාළ වෙනත් තොරතුරු |
| හිමිකම් වර්ගය | | ඇමුණුම "ඇ" හි දැක්වෙන පරිදි ප්‍රතිලාභ හිමියාගේ වර්ගීකරණය |

| 2. ප්‍රාථමික සම්බන්ධතා විස්තර | | |
|---|---|---|
| ක්ෂේත්‍රය | අක්ෂර ගණන | අන්තර්ගතය |
| නම | අක්ෂර 100 | ගනුදෙනුකරුගේ නම |
| ලිපිනය | අක්ෂර 35 බැගින් වූ පේළි 3ක් | ගනුදෙනුකරුගේ තැපැල් ලිපිනය |
| ස්ථිර දුරකථන අංකය | අක්ෂර 20 | ගනුදෙනුකරුගේ දුරකථන අංකය |
| ජංගම දුරකථන අංකය | අක්ෂර 20 | ගනුදෙනුකරුගේ ජංගම දුරකථන අංකය |
| ෆැක්ස් අංකය | අක්ෂර 20 | ගනුදෙනුකරුගේ ෆැක්ස් අංකය |
| විද්‍යුත් තැපැල් ලිපිනය | අක්ෂර 50 | ගනුදෙනුකරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය |
| හුවමාරු/පියවීම් දැනුම්දීම් මාධ්‍යය | - | "SMS" , "Email", SMS & Email", "None" යන විකල්ප අතරින් තෝරා ගැනීම |
| උපන් දිනය | දිනය/ මාසය/ අවුරුද්ද | දින ආකෘතිය |

| 3. විකල්ප සම්බන්ධතා විස්තර | | |
|---|---|---|
| **ක්ෂේත්‍රය** | **අක්ෂර ගණන** | **අන්තර්ගතය** |
| නම | අක්ෂර 100 | ගනුදෙනුකරුගේ නම |
| ලිපිනය | අක්ෂර 35 බැගින් වූ පේළි 3 | ගනුදෙනුකරුගේ විකල්ප තැපැල් ලිපිනය |
| විද්‍යුත් තැපැල් ලිපිනය | අක්ෂර 50 | ගනුදෙනුකරුගේ විද්‍යුත් ලිපිනය |

සුරැකුම්පත් ගිණුමේ හිමිකාරීත්වය පවත්වාගෙන යනු ලබන සහභාගිකරු වෙත ඔඩපන සුරැකුම්පත්හී පොලී හා කල් පිරුනු ගෙවීම් සිදු කරනු ලැබේ. සහභාගිකරු විසින් අදාළ අයිතිකරුට මෙම පද්ධති රීති වලට අනුකූලව ගෙවීම් සිදු කළ යුතුය.

**10.2 ඔඩපන ප්‍රකාශන සහ තහවුරු කිරීම්**

ලංකාසෙක්‍යු හි ලිපිනයන් සඳහන් කිරීම සඳහා සාමාන්‍යයෙන් වෙන්වූ ක්ෂේත්‍රයන් වල ඔඩපන විස්තර සටහන් කෙරේ. ඒ අනුව, ඔඩපන ගිණුම දරණ සහභාගිකරු හට ප්‍රකාශන නිකුත් කෙරේ. ප්‍රකාශනය ලැබෙන පාර්ශවය, ඔඩපන පාර්ශවය සඳහා, හෝ, පොලී ගෙවීමේ අවස්ථාවලදී, අදාළ සුරුකුම්පත් හිමිකරුට ප්‍රකාශන ලබා දීම සඳහා වගකිවයුතු වේ.

**10.3 ඔඩපන බලාත්මක කිරීම සඳහා සහභාගිකරුවන්ගේ වගකීම**

අදාළ රෙගුලාසි වලට අනුකූලව ඔඩපන බලාත්මක කිරීම සහ නිදහස් කිරීම සඳහා සහභාගිවන්නන් වගකිව යුතුය.

**11. එක් දින ද්‍රවශීලතා පහසුකම**

**11.1. එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි ක්‍රියාකාරීත්වය**

එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි ක්‍රියාකාරීත්වය දෙවන වෙළුමේ 7 වන රීතිය මගින් විස්තර කර ඇත.
සහභාගිකරුවන්ගේ එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම සඳහා වූ ගිණුම් වල සුරකුම්පත් ස්ථානගත කිරීම සඳහා ලංකාසෙක්‍යු පද්ධතිය භාවිතා කරනු ලැබේ. එනම් ප්‍රතිස්ථාපන උපදෙස් භාවිත කිරීම මඟිනි. එක්දින ද්‍රවශීලතා පහසුකම වෙනුවෙන් ඔඩපන කිරීම සඳහා වූ සියලුම සුරකුම්පත් සහභාගිකරුගේ හිමිකම් ගිණුමෙන් එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම සඳහා වූ ගිණුමට මාරු කළ යුතුය.

**11.2. එක් දින ද්‍රවශීලතා පහසුකම සඳහා යෝග්‍ය සුරකුම්පත්**

ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම සඳහා කෙරෙන ගනුදෙනු සඳහා සහභාගිකරුවන් විසින් ගනුදෙනුකරුවන්ට විකුණූ සුරකුම්පත් හෝ ගනුදෙනුකරුවන් සමඟ නැවත මිලදී ගැනීමේ ගනුදෙනු සඳහා යොදාගත් හෝ සහභාගිකරුට අයත් නොවන සුරකුම්පතක් භාවිතා නොකළ යුතුය.

**11.3. එක් දින ද්‍රවශීලතා රීති උල්ලංඝනයට අදාළ වන දඩ**

ඉහත 11.2 දරන ඡේද රීතිය උල්ලංඝනය කළහොත් පහත දැක්වෙන ගාස්තු ගෙවීම සඳහා සහභාගිකරුවන් බැඳී සිටී.

(a) රුපියල් මිලියන1000 ක් දක්වා ණයට ගතහොත් දිනකට එම මුදලින් 2%
(b) රුපියල් මිලියන1000 කට වැඩියෙන් ණයට ගත හොත් දිනකට එම මුදලින් 2.5% කි

**11.4 සහභාගිකරුවන් විසින් හසුරුවාගනු ලබන එක්දින ද්‍රවශීලතා පහසුකම**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාකාරී මැදිහත්වීමකින් තොරව එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම සඳහා මුලපිරීමට සහභාගිවන්නන් හට හැකියාව ඇත.

සහභාගිකරු හට ඔඩපන කළ සුරැකුම්පතක, සුරැකුම්පතෙහි සම්පූර්ණ ප්‍රමාණයෙන් හෝ ඔඩපනකල සුරැකුම්පතෙහි ප්‍රමාණයෙන් කොටසක් මත හෝ ඔඩපන සියලුම සුරකුම්පත් ප්‍රමාණයෙන් හෝ සහභාගිකරු හට ලබාගත් එක් දින ද්‍රවශීලතා පහසුකම පුනරාවර්ථනය කළ හැකිය. ව්‍යාපාරික දිනයන්හී දී පෙ. ව. 8.00 සිට ප. ව. 3.45 දක්වා සුදුසුකම්ලත් සහභාගිකරුවන් සඳහා මෙම සහභාගිකරුවන් විසින් හසුරුවාගනු ලබන එක් දින ද්‍රවශීලතා පහසුකම සඳහා මුල පිරීම සිදු කළ හැක. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම සහභාගිවන්නන් විසින් එක් දින ද්‍රවශීලතා පහසුකම සඳහා ඔඩපන කරන ලද සියලුම සුරැකුම්පත් නැවත පියවීම සෑම ව්‍යාපාරික දිනයකදීම ප. ව. 4.15 ට සිදු කරයි.

**11.4.1. එක්දින ද්‍රවශීලතා පහසුකම සඳහා කාල සීමාව දීර්ඝ කිරීම**

සහභාගිකරුවන් ඔවුන්ගේ එක්දින ද්‍රවශීලතා පහසුකම් සඳහා මුල පිරීම් ලබා දී ඇති මෙහෙයුම් සටහනේ පරිදි අදාළ කාලසීමාව තුළ සම්පූර්ණ කළ යුතුයි. එක් දින ද්‍රවශීලතා පහසුකම සඳහා වෙන් කර ඇති කාල සීමාව දීර්ඝ කිරීම සඳහා වන ඉල්ලීම් අදාළ සිද්ධියේ පසුබිම පදනම්ව සලකා බලනු ලැබෙන්නේය. සහභාගිකරුවන් මිලදී ගැනීම් සඳහා වන පද්ධතියේ පවතින එක් දින ද්‍රවශීලතා සඳහා වන කාල සීමාව දීර්ඝ කර ගැනීම සඳහා අවශ්‍ය වූ විට පහත පියවර අනුගමනය කළ යුතුයි.

- අ) සහායක අංශය (Help Desk) වෙත කරන ඇමතුමක් මඟින් ඉල්ලීම සිදු කළ යුතුයි; සහ
- ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලිඛිත ඉල්ලීමක් සිදු කළ යුතු අතර එය අදාළ ව්‍යාපාරික දිනයේ ප. ව. 3.30 ට පෙර, ඒ සඳහා අදාළ වන සාධාරණ තොරතුරු සහිතව ඉදිරිපත් කළ යුතුයි.

සහභාගිකරුවන් දීර්ඝ කිරීමේ අවස්ථාවන් ලබා ගැනීම පිළිබඳව විශ්වාසය නොතැබිය යුතුයි. ශ්‍රී ලංකා මහ බැංකුව සාමාන්‍ය පොදු මූලධර්මයක් ලෙස දීර්ඝ කිරීම් සඳහා වන ඉල්ලීම් සලකා බලනුයේ තීරණාත්මක අවස්ථාවන්හි දී පමණි.

## 04 වන වෙළුම

## මෙහෙයුම් සහ පරිපාලනය

### පටුන


1. මෙහෙයුම් දින දර්ශනය හා කාල සටහන ........ 54A
 1.1 ලංකාසෙට්ල් මෙහෙයුම් දිනය ........ 54A
 1.2 දෛනික මෙහෙයුම් කාලසටහන ........ 54A
 1.3 ලංකාසෙට්ල් හි මෙහෙයුම් සැසිවාරයන් සහ වේලාවන් අවස්ථානුකූලව වෙනස් කිරීම ........ 54A
 1.4 කලින් සැලසුම් නොකළ, විශේෂ බැංකු නිවාඩු දින සඳහා විධිවිධාන ........ 54A

2. තාක්ෂණික, ආරක්ෂාව සහ පසුගාමී ප්‍රමිතීන් ........ 54A
 2.1 ලංකාසෙට්ල් මෙහෙයුම්වල ආරක්ෂාව සහතික කිරීම සඳහා සහභාගිකරුගේ වගකීම ........ 54A
 2.2 ආරක්ෂාවෙහි සැබෑ හෝ සැක කටයුතු උල්ලංඝනය කිරීම් ........ 54A
 2.3 වංචනික ක්‍රියාකාරකම් ........ 54A
 2.4 SWIFT – FIN ආරක්ෂක හා පාලන විධිවිධාන ........ 55A
 2.5 ලංකාසෙක්‍යු පද්ධතිය සඳහා BIC ලිපිනය ........ 55A
 2.6 සම්බන්ධතා කළමණාකරන යෙදුම (RMA) ........ 55A
 2.7 ලංකාසෙට්ල් බ්‍රවුසරයෙහි අතුරු මුහුණතෙහි ආරක්ෂාව ........ 55A
 2.8 බ්‍රවුසරයෙහි අතුරු මුහුණත් පරිශීලක ප්‍රවේශය නඩත්තුව පාලනය ........ 55A
 2.9 අඛණ්ඩතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව ........ 55A
 2.10 ලංකාසෙට්ල් පහසුකම් බාහිරින් ලබාගැනීම හෝ හුවමාරු කර ගැනීම ........ 56A

3. හදිසි අවස්ථාවන් ........ 56A
 3.1 හදිසි අවස්ථාවන් අර්ථ දැක්වීම ........ 56A
 3.2 ශ්‍රී ලංකා මහ බැංකු ආපදා ප්‍රතිප්‍රාප්ති පහසුකම් ........ 56A
 3.3 තනි සහභාගිත්ව අවස්ථාව ........ 56A
  3.3.1 පද්ධති ඇනහිටීම පිළිබඳ දැනුම් දීම ........ 56A
  3.3.2 අනිකුත් සහභාගිවන්නන්ට උපදෙස් ........ 56A
  3.3.3 අභ්‍යන්තර ගනුදෙනු අඛණ්ඩව පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය ........ 57A
  3.3.4 පරිගණක පාදක පර්යන්ත සිදුවීම් සමබන්ධතා නැවත ස්ථාපිත කිරීම ........ 57A
  3.3.5 ස්වයංක්‍රීය නොවන ආකාරයට (Manually) අරමුදල් පැවරීම ........ 57A
  3.3.6 ස්වයංක්‍රීය නොවන ආකාරයට (Manually) සුරැකුම්පත් පැවරීම ........ 57A
 3.4 SWIFT අවස්ථා ........ 57A
 3.5 ලංකාසෙට්ල් පරිගණක පාදක පර්යන්ත අවස්ථාව (CBT) ........ 58A
 3.6 RTGS යෙදුම් අවස්ථාව ........ 58A
 3.7 හදිසි අවස්ථා වාර්තාව ........ 58A
 3.8 අනෙකුත් හදිසි අවස්ථාවන් ........ 58A
 3.9 හදිසි වැඩපිළිවෙලවල් පරීක්ෂා කිරීම ........ 58A
 3.10 සම්බන්ධතා ස්ථාන ........ 59A
 3.11 පරිපාලන පණිවුඩ ........ 59A
 3.12 සහභාගිවන්නෙකු හෝ ගිණුමක් අත්හිටුවීම ........ 59A
 3.13 අත්හිටවූ සහභාගිකරුවන්ගේ තත්ත්වය ........ 59A

4. පද්ධති පරිපාලනය සහ පරිශීලක සහාය ........ 59A
 4.1 SWIFT පරිශීලක සහාය ........ 59A
 4.2 ලංකාසෙට්ල් උපකාරක කවුළුව ........ 59A

5. සහභාගිවන්නන් අතර ඇතිවන මතභේද ........ 59A

6. පද්ධතියේ වෙනස්කිරීම් සහ වෙනස්කිරීම් පාලනය ........ 60A
 6.1 පද්ධතියේ නිවැරදි කිරීම්, වෙනස්කිරීම් සහ වැඩිදියුණු කිරීම් ........ 60A
 6.2 ලංකාසෙට්ල් පද්ධතියේ වෙනස් කිරීම් සහ වෙනස් කිරීම් පාලනය කිරීම ........ 60A
 6.3 SWIFT ප්‍රමිතීන්වල වෙනස් කිරීම් ........ 60A

7. ගාස්තු සහ අයකිරීම් ........ 60A

1. **මෙහෙයුම් දින දර්ශනය හා කාලසටහන**

1.1 **ලංකාසෙට්ල් මෙහෙයුම් දිනය**

ලංකාසෙට්ල් මෙහෙයුම් පද්ධතිය සෑම වසරකම සෑම ව්‍යාපාරික දිනයකදීම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. සෑම වසරකම ආරම්භයට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසරේ නිවාඩු දිනයන් පද්ධතියට හඳුන්වා දෙනු ලබන අතර, ඒ අනුව සහභාගිකරුවන්ට මෙහෙයුම් දිනයන් බලාගත හැකි වනු ඇත. ලංකාසෙට්ල් පද්ධතිය ක්‍රියාත්මක වන සෑම අවස්ථාවකම සහභාගිකරුවන්ට ලංකාසෙට්ල් පද්ධතිය සමඟ උපදෙස් හුවමාරු කරගැනීමට සහ අනෙකුත් ලංකාසෙට්ල් ආශ්‍රිත පණිවිඩ හුවමාරු කර ගැනීමට හැකිය.

1.2 **දෛනික මෙහෙයුම් කාලසටහන**

සෑම මෙහෙයුම් දිනයක් තුළම, නියමිත කාලසටහනක් මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාසෙට්ල් පද්ධතිය ක්‍රියාත්මක කරයි. ලංකාසෙට්ල් පද්ධතියේ එක් එක් ව්‍යාපාරික දිනය තුළ වෙන් වෙන් වශයෙන් සැසි පවතින අතර මෙම සැසි තුළ විවිධ ගනුදෙනු හා ක්‍රියාවලීන් ක්‍රියාත්මක වේ. ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාලසටහන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර බෙදා හරිනු ලබයි.

දෛනික මෙහෙයුම් කාල සටහනේ අවශ්‍ය වෙනස්කම් චක්‍රලේඛ මගින් සහභාගිකරුවන්ට දැනුම් දෙනු ලබන අතර, ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පද්ධති රීති සංශෝධනය කරනු ලැබේ. සාමාන්‍ය තත්වයන් තුල, එවැනි වෙනස්කම් පිළිබඳව අවම වශයෙන් දින 7 කට පෙර සහභාගිකරුවන්ට දැනුම් දෙනු ලැබේ.

1.3 **ලංකාසෙට්ල් හි මෙහෙයුම් සැසිවාරයන් හා වේලාවන් අවස්ථානුකූලව වෙනස් කිරීම**

අවිනිශ්චිතතාවයන් සමඟ කටයුතු කිරීම සඳහා වරින් වර මෙහෙයුම් කාලසටහනට අවස්ථානුකූලව ගැලපීම් සිදු කිරීමට අවශ්‍ය විය හැකිය. එවැනි අවස්ථාවකදී ශ්‍රී ලංකා මහ බැංකුව සිය අභිමතය පරිදි මෙහෙයුම් වේලාවන් හා සැසිවාරයන් දීර්ඝ කිරීම හෝ අඩු කිරීම සිදු කරනු ඇත. අවශ්‍ය පරිදි මෙම අවස්ථානුකූලව වෙනස්කම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

සහභාගිකරුවන් විසින් සෑම ව්‍යාපාරික දිනයකදීම තම ගනුදෙනු මෙහෙයුම් කාලසටහනෙහි දක්වා ඇති නියමිත වේලාව තුළ සම්පූර්ණ කර ඇති බවට සහතික විය යුතුය. මෙහෙයුම් දිනයක් හෝ සැසිවාරයක් දීර්ඝ කිරීමක් සඳහා සහභාගිකරුවන් විසින් කරනු ලබන ඉල්ලීම් එක් එක් සිද්ධිය අනුව සලකා බලනු ලැබේ. පද්ධතියේ ක්‍රියාත්මක කාලය දීර්ඝ කිරීමේ අවශ්‍යතාවයක් ඇත්නම් සහභාගිකරුවන් පහත සඳහන් පියවර අනුගමනය කළ යුතුය.

අ) උපකාරක කවුළුව අමතා ඉල්ලීමක් කිරීම; සහ

ආ) එම ඉල්ලීම සඳහා සාධාරණ හේතු සහිතව අදාල ව්‍යාපාරික දිනයේ ප.ව. 4.00 ට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත ලිඛිත ඉල්ලීමක් යැවීම.

සහභාගිකරුවන් කාල දිගුවක් ලබා ගැනීම මත විශ්වාසය නොතැබිය යුතුය. සාමාන්‍ය ප්‍රතිපත්තියක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාලය දීර්ඝ කිරීම් සඳහා අවසර දෙනු ලබන්නේ තීරණාත්මක අවස්ථාවන් වලදී පමණි.

1.4 **කලින් සැලසුම් නොකළ විශේෂ බැංකු නිවාඩු දින සඳහා විධිවිධාන**

රජය විසින් හදිසියේම විශේෂ නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් කල අවස්ථාවක ලංකාසෙට්ල් පද්ධතිය විවෘත කරනු නොලැබේ. එවැනි අවස්ථාවකදී, ප්‍රකාශිත බැංකු නිවාඩු දිනයෙන් පසු දිනය තුලදී පද්ධතිය දින දෙක සඳහාම ක්‍රියාත්මක වේ. එනම් පෙර ව්‍යාපාරික දිනය සඳහා උදෑසන සැසිය ද (ප්‍රකාශිත නිවාඩු දිනයෙහි ගනුදෙනු සඳහා) සහ දහවල් සැසිය එම දිනය (ප්‍රකාශිත නිවාඩු දිනට පසු ඊළග ව්‍යාපාරික දිනය) සඳහාද වේ.

2. **තාක්ෂණික, ආරක්ෂාව හා පසුගාමී ප්‍රමිතීන් (Back-up)**

2.1 **ලංකාසෙට්ල් මෙහෙයුම්වල ආරක්ෂාව සහතික කිරීම සඳහා සහභාගිකරුවන්ගේ වගකීම**

SWIFT සහ ලංකාසෙට්ල් පද්ධතිය යන දෙකම දත්ත ආරක්ෂා කිරීමට, ගෙවීම් පණිවිඩ හුවමාරුවේදී සහ පරිශීලක ප්‍රවේශය පාලනය කිරීමට ආරක්ෂක පහසුකම් සපයයි. සහභාගිකරුවන් තම ආයතනය තුළ ගනුදෙනු, දත්ත හා පරිශීලක ප්‍රවේශවල අඛණ්ඩතාවය සහතික කිරීම සඳහා වගකිව යුතුය.

2.2 **ආරක්ෂාවෙහි සැබෑ හෝ සැක කටයුතු උල්ලංඝනය කිරීම්**

සුරක්ෂිතභාවයෙහි කිසියම් සැබෑ හෝ සැක කටයුතු උල්ලංඝණය කිරීමක් සිදු වූ වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කළ යුතුය.

2.3 **වංචනික ක්‍රියාකාරකම්**

(අ) ලංකාසෙට්ල් පද්ධතියට අදාළ වංචනික ක්‍රියාවන්ට එරෙහිව තමන්ගේ පද්ධතීන් සුදුසු ආරක්ෂාවක් සපයන බවට සහභාගිකරුවන් විසින් සහතික විය යුතුය.

(ආ) පද්ධතිය හා සම්බන්ධ සියළු සත්‍ය හෝ සැක කටයුතු වංචනික ක්‍රියා වහාම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තාකළ යුතුය.
කිසියම් සත්‍ය හෝ සැක කටයුතු වංචාවක මූලාශ්‍රය විමර්ශනය කර හඳුනාගැනීම සඳහා සෑම සහභාගිකරුවෙකුම ශ්‍රී ලංකා මහ බැංකුව හෝ ඕනෑම වෙනත් සහභාගිකරුවෙකු වෙත සියළු සාධාරණ සහාය ලබාදිය යුතුය.

### 2.4 SWIFT FIN ආරක්ෂක හා පාලන විධිවිධාන

SWIFT ආරක්ෂක හා පාලන විධිවිධාන SWIFT FIN පිටපත් සේවා විස්තරයෙහි (Swift Fin Copy Service Description) සහ SWIFT පරිශීලක අත්පොතෙහි ඇති FIN ආරක්ෂක මාර්ගෝපදේශණයෙහි (FIN Security Guide of the SWIFT User Handbook) විස්තර කර ඇත.

ශ්‍රී ලංකා මහබැංකුව LKB සංවෘත පරිශීලක කාණ්ඩය සඳහා සම්බන්ධතා කළමණාකරන යෙදුම (Relationship Management Application) භාවිතා නොකරයි. තත්කාලීන දළ පියවීම් පද්ධතියට (RTGS) SWIFT FIN Y – Copy පණිවිඩ ලැබීමට හා යැවීමට අදාළව තමන්ට ආවේණික බැංකු හඳුනාගැනීමේ කේතයක් (BIC) ඇත. මෙම BIC කේතය වෙනත් අරමුණු සඳහා භාවිතා නොකෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත හෝ එමගින් කරනු ලබන සාමාන්‍ය ගෙවීම් ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ BIC කේතය (CBCELKLX) හරහා හුවමාරු වේ. කෙසේ වෙතත්, තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි BIC ලිපිනය තත්කාලීන දළ පියවීම් පද්ධතිය සමඟ ද්විපාර්ශවික යතුරු හුවමාරුව (Bilateral Key Exchange) සඳහා සහභාගිකරුවන් විසින් භාවිතා කළ යුතුය.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි BIC ලිපිනය වන්නේ CBCELKLA.

### 2.5 ලංකාසෙක්‍යු පද්ධතිය සඳහා BIC ලිපිනය

ලංකාසෙක්‍යු පද්ධතිය හා සහභාගිකරුවන් අතර පණිවුඩ හුවමාරු කර ගැනීම සඳහා වෙනම BIC ලිපියනයක් පවත්වාගෙන යනු ලැබේ.

ලංකාසෙක්‍යු පද්ධතියේ BIC ලිපිනය CBCELKLS වේ.

### 2.6 සම්බන්ධතා කළමණාකරන යෙදුම (Relationship Management Application (RMA))

සම්බන්ධතා කළමණාකරන යෙදුම යටතේ සහභාගිකරුවන් ලංකාසෙක්‍යු පද්ධතියේ BIC සමඟ අවසර හුවමාරු කරගනීම අවශ්‍ය වන්නේ එක්වරක් පමණි. නව පරිශීලකයින් "ලැබීමට අවසරය" සඳහා ඉල්ලීමක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවිය යුතුය. ඉල්ලීම ලැබුණු පසු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "ලැබීමට අවසරයක්" නිකුත් කරනු ඇති අතර එමඟින් පරිශීලකයාට "යැවීමට අවසර" පහසුකම ලබාදෙනු ඇත. යම් පාර්ශවයක් විසින් එවැනි අවසරයක් අවලංගු කරන හෝ මකා දමන තුරු ලබා ගත් අවසරයන් සක්‍රියව පවතිනු ඇත.

### 2.7 ලංකාසෙට්ල් බ්‍රවුසරයෙහි අතුරු මුහුණතෙහි ආරක්ෂාව

සහභාගිකරුවන් CBSLNet පුළුල් පරාස ජාලය හරහා ලංකාසෙට්ල් පද්ධතිය වෙත ප්‍රවේශ වීමට වැඩපල පිරික්සුම් (Workstation Browser) අතුරුමුහුණත භාවිත කරයි. ජාලයට සම්බන්ධ පිරික්සුම් අතුරුමුහුණත් ලංකාසෙට්ල් පද්ධතියෙහි විමසීම් හා පෙළගැස්වීම් කළමණාකරණයට සහාය වේ.

සහභාගිකරුවන්ගේ ආයතනවල සුදුසු අධිකාරිය විසින් පාලනය කළහැකි පරිශීලක හැඳුනුම්පත්, මුරපද සහ ක්‍රියාකාරිත්ව සීමාවන් සපයා ලංකාසෙට්ල් පද්ධතියට ප්‍රවේශ වීමේ ආරක්ෂාව සපයයි. තම ආයතනය තුළ සුදුසු පරිශීලක ප්‍රවේශය, මුර පද ආරක්ෂාව හා බලධාරීන් ස්ථාපිත කිරීම හා බලාත්මක කිරීම එක් එක් සහභාගිකරුවාගේ වගකීම වේ.

### 2.8 බ්‍රවුසරයෙහි අතුරුමුහුණත් පරිශීලක ප්‍රවේශය නඩත්තුව පාලනය

ශ්‍රී ලංකා මහ බැංකුව, සහභාගිකරුවන්ගේ ආයතන තුළ සිටින පරිශීලකයින්ට, පරිශීලක ප්‍රවේශ අයිතිය ලබා දේ. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පිහිටුවන ලද එක් එක් පරිශීලක ගිණුම් මගින් ප්‍රවේශ විය හැකි, පද්ධති ක්‍රියාකාරකම් වෙන වෙනම නිර්වචනය කර ඇත. පරිශීලක ප්‍රවේශ අයිතිය සෑදීම, මකා දැමීම හෝ සංශෝධනය කිරීම සඳහා අයදුම්පත් ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

පරිශීලකයෙකු විසින් බ්‍රවුසර් අතුරුමුහුණතෙහි සැක සහිත වංචාවක් හෝ අනිසි ලෙස භාවිතා කිරීමක් කළවිට, ලංකා සෙට්ල් උපකාරක කවුළුවට වහාම දැනුම් දිය යුතු අතර, එම පරිශීලක ගිණුමෙහි අයිතිවාසිකම් අවලංගු කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කෙරෙනු ඇත.

### 2.9 අඛණ්ඩතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව

තමන්ගේම අභ්‍යන්තර ලංකාසෙට්ල් සැකසුම් පද්ධති හා ක්‍රියාපටිපාටි වල අඛණ්ඩතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා සහභාගිකරුවන් වගකිව යුතුය. සහභාගිකරුවන් විසින් නඩත්තු කළ යුතු වෙනත් දේ නම්,

- Back-up පහසුකම් සහ දත්ත ප්‍රතිගුණනය (Data Replication);
- අවිනිශ්චිත අවස්ථාවකදී සැලසුම් ;
- භෞතික වැඩබිමෙහි ආරක්ෂාව ;
- පද්ධති අස්ථායිවීම්, ගැටළු නිරීක්ෂණය සහ විසඳුම් ක්‍රියාපටිපාටි ;
- පද්ධති ධාරිතාවය ; සහ
- වංචා වැලැක්වීමේ ක්‍රියා පටිපාටි ;

ලංකාසෙට්ල් පද්ධතියට අදාළ සිය මෙහෙයුම් වල අඛණ්ඩතාව සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා අභ්‍යන්තර පද්ධති, පාලන හා ක්‍රියාපටිපාටීන් ප්‍රමාණවත් දැයි තීරණය කිරීමේ අරමුණින් සහභාගිකරුවන්ගේ පරිශ්‍රය ඕනෑම අවස්ථාවක පරීක්ෂා කිරීම සඳහා මහ බැංකුවට හිමිකම් ඇත. සහභාගිකරුවන් විසින් තම ප්‍රාථමික හා ද්විතියික අඩවි වල වත්මන් ස්ථානය සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කළ යුතුය.

### 2.10 ලංකා සෙට්ල් පහසුකම් බාහිරින් ලබා ගැනීම හෝ හුවමාරු කර ගැනීම

සහභාගිකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතියකින් තොරව ඔවුන්ගේ ලංකාසෙට්ල් පහසුකම් බාහිරින් ලබාගැනීමට, හුවමාරු කර ගැනීමට හෝ නැතහොත් තෙවන පාර්ශවයන්ට ප්‍රවේශ වීමට හෝ ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා දීම සඳහා ගිවිසුම් වලට නොඑළඹිය යුතුය.

## 3. හදිසි අවස්ථාවන්

### 3.1 හදිසි අවස්ථාවක් අර්ථ දැක්වීම

හදිසි අවස්ථාවක් යනු ලංකාසෙට්ල් පද්ධතියේ ඕනෑම ආකාරයේ බාධා කිරීමක් හෝ සාමාන්‍ය ක්‍රියාකාරකම් වලට බාධාවක් විය හැකි ආකාරයේ සිදුවීමකි. ප්‍රධාන වශයෙන් මෙවැනි හදිසි අවස්ථාවන් හයක් බලාපොරොත්තු විය හැක.

(i) තනි පුද්ගල සහභාගිත්ව අවස්ථාව
(ii) SWIFT අවස්ථාව
(iii) ලංකාසෙට්ල්හි පරිඝණක පදනම් වූ පර්යන්ත (CBT) අවස්ථාව
(iv) RTGS යෙදුම් අවස්ථාව
(v) ලංකාසෙක්‍යු පද්ධතියේ යෙදුම් අවස්ථාව
(vi) ස්වභාවික විපත් ඇතුළු අනිකුත් හදිසි අවස්ථාවන්
යන සෑම අවස්ථා වර්ගයක්ම පහත සඳහන් අංශයන්හි විස්තර කෙරේ.

පිරික්සීමක්, පෙළගැස්වීම් කලමණාකරනය හෝ වටිනාකමක් නොමැති පණිවුඩ හුවමාරුවක් සඳහා ලංකාසෙට්ල් බ්‍රවුසර් අතුරුමුහුණත භාවිතකර, මධ්‍යම පද්ධතියට පිවිසිය නොහැකි වීම හදිසි අවස්ථාවක් ලෙස නොසලකයි.

### 3.2 ශ්‍රී ලංකා මහ බැංකු ආපදා ප්‍රතිප්‍රාප්ති පහසුකම්

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලංකාසෙට්ල් පද්ධතියට හා එහි SWIFT සබඳතා සඳහා පූර්ණ back-up පහසුකම් සපයනු ලබයි. ප්‍රාථමික වැඩබිම, ප්‍රතිප්‍රාප්ති තත්වයට පත්කළ නොහැකි අවස්ථාවකදී ශ්‍රී ලංකා මහ බැංකුව මගින්, සහභාගිකරුවන්ට උපදෙස් දීමෙන් පසු, ලංකාසෙට්ල් හි මෙහෙයුම් ආපදා ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත ගෙන යනු ඇත.

ලංකාසෙට්ල් මෙහෙයුම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආපදා ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත ගෙනයාමට අවශ්‍ය බව ඔප්පු වූ අවස්ථාවකදී, ගතයුතු සෑම ක්‍රියාමාර්ගයක් ගැනම සහභාගිකරුවන්ට උපදෙස් දෙනු ලැබේ. එයින් අපේක්ෂා කරනුයේ සහභාගිකරුවන් ආපදා ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත සංක්‍රමණය වීම විනිවිදභාවය ආරක්ෂා වන ලෙසට සිදු කිරීමයි. සහභාගිකරුවන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ ආපදා ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත තම බ්‍රවුසර් අතුරු මුහුණත හෝ සර්වරය මගින් නව සම්බන්ධතා සැසිවාරයක් පිහිටුවීම අවශ්‍ය වේ.

### 3.3 තනි සහභාගිත්ව අවස්ථාව

#### 3.3.1 පද්ධති ඇනහිටීම් පිළිබඳ දැනුම් දීම

ගෙවීමක් සහ අනෙකුත් ලංකාසෙට්ල් ආශ්‍රිත පණිවුඩයක් සැකසීමේදී එයට බාධාවන අයුරින් තාක්ෂණික හෝ මෙහෙයුම් ගැටළුවක් ඇතිවුවහොත්, සහභාගිකරුවන් එම ගැටළුව පිළිබඳව දැනුම්වත් වී මිනිත්තු 15 ක් ඇතුලත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය.

සහභාගිවන්නන් විසින් තම තාක්ෂණික හෝ මෙහෙයුම් සැලසුම් වල සිදුවන ඕනෑම වෙනස්වීමක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය.

#### 3.3.2 අනිකුත් සහභාගිකරුවන්ට උපදෙස්

යම් කල් පවතින ගැටළුවක් හෝ පද්ධතියේ සමස්ථ මෙහෙයුම් කටයුතු සඳහා බාධාවන ගැටළුවක් ඇතිවුවහොත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තම අභිමතය පරිදි අනිකුත් සහභාගිකරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

උදා - දවස අවසානයේ මෙහෙයුම් කටයුතු අවසන් වන වේලාවට ආසන්නව

ගැටළුවට මුහුණ පෑ සහභාගිකරුවා සඳහා ගෙවීම් පවත්වාගෙන යන්නේද පිළිබඳ අනෙකුත් සහභාගිකරුවන් විසින් තීරණය කළ යුතුය.

### 3.3.3 ලැබෙන ගනුදෙනු අඛණ්ඩව පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය

සහභාගිකරුවෙකුගේ SWIFT පරිගණක ආශ්‍රිත පර්යන්තය ඇනහිටුණු අවස්ථාවකදී, ලංකාසෙට්ල් පද්ධතිය මගින් සහභාගිකරුවෙකු වෙනුවෙන් දැනටමත් ලැබී පවතින හෝ පසුව SWIFT ගෙවීම් වලින් ලැබුණු MT096 උපදෙස් ක්‍රියාත්මක කිරීම සිදු කරන අතර අනෙකුත් පණිවිඩ SWIFT සමඟ සන්නිවේදන නැවත ස්ථාපිත කරන තුරු SWIFT අපේක්ෂිත වලට එකතු වේ.

### 3.3.4 පරිගණක පාදක පර්යන්ත, සිදුවීම් සම්බන්ධතා නැවත ස්ථාපිත කිරීම

සිය SWIFT CBT සම්බන්ධතාවය යළි ස්ථාපනය කිරීමට සහභාගිකරුවන් උත්සාහ කළ යුතුය.

### 3.3.5 ස්වයංක්‍රීය නොවන ආකාරයට (Manually) අරමුදල් පැවරීම

තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ ඕනෑම හදිසි ගෙවීමක් සිදුකිරීමට සහභාගිකරුවෙකු බලාපොරොත්තු වන්නේ නම්, සහභාගිකරු විසින්, එම ගෙවීම සිදු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත බලයලත් අත්සන් දෙකක් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් දී ඇති ආකෘතිය ආකාරයට ලිඛිත ඉල්ලීමක් කල යුතුය. එවැනි ලිඛිත ඉල්ලීමක් අදාළ ව්‍යාපාර කටයුත්ත සඳහා ඇති අවසන් වේලාවට හෝ ලංකාසෙට්ල් පද්ධතියේ ව්‍යාපාර අවසන් කිරීමට පැය භාගයකටවත් පෙර, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත ලැබීමට සැලැස්විය යුතුය.

එබඳු ගනුදෙනු සිදු කිරීමට හෝ එවැනි ගනුදෙනු පියවීම සඳහා ලංකාසෙට්ල් පද්ධතිය විවෘතව තබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව, කිසිදු වගකීමක් නොපවතී.

### 3.3.6 ස්වයංක්‍රීය නොවන ආකාරයට (Manually) සුරැකුම්පත් පැවරීම

සහභාගිකරුවෙකුට ලංකාසෙක්‍යු පද්ධතිය තුළ කිසියම් තීරණාත්මක සුරැකුම්පත් පැවරීමක් සිදු කිරීමට අවශ්‍ය නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති ආකෘතියට අදාළව ලිඛිත ඉල්ලීමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී වෙත එවිය යුතුය. එවැනි සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු, ගෙවීමක් නොමැති යැවීමක් (DVF) හෝ ගෙවීමක් නොමැති ලැබීමක් (RVF) වර්ගයට අයත් සුරැකුම්පත් හුවමාරුවක් පමණක් වන ඒවා විය යුතුය. එවැනි ගනුදෙනු සඳහා සම්බන්ධ ප්‍රතිවිරුද්ධ පාර්ශවයන්ද එවැනි සුරැකුම්පත් පැවරීමක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබා දී ඇති ආකෘති පත්‍රයට අනුව රාජ්‍ය ණය අධිකාරී වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතුය. පද්ධති ඇනහිටීමක් සහිත සහභාගිකරුවෙකු ද අදාල ප්‍රතිවිරුද්ධ පාර්ශවකරුට/ කරුවන්ට, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සපයා ඇති ආකෘතියට අනුව සුරැකුම් පත් පැවරීමක් සඳහා ඉල්ලීමක්, රාජ්‍ය ණය අධිකාරීගෙන් කළ යුතු බවට දැනුම් දිය යුතුය.

ලංකාසෙට්ල් පද්ධතියේ ව්‍යාපාර කටයුතු වසා දැමීමට විනාඩි 45 කට පෙර රාජ්‍ය ණය අධිකාරී වෙත එවැනි ලිඛිත ඉල්ලීම් ලැබිය යුතුය. නියමිත කාලයට පසුව ලැබෙන එවැනි ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එබඳු ගනුදෙනුවක් සිදු කිරීමට හෝ එවැනි ගනුදෙනුවක් පියවීම සඳහා ලංකාසෙට්ල් පද්ධතිය විවෘතව තබාගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව කිසිදු වගකීමක් නොපවතී.

## 3.4 SWIFT අවස්ථා

දිගුකාලීන SWIFT ඇනහිටීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවන්ගේ සම්බන්ධතා සමඟ අදහස් විමසීම සහ සන්නිවේදනය කිරීම කරනු ඇත. සහභාගිකරුවන්ට මෙම සිද්ධිය පිළිබඳව කෙටි පණිවුඩ ලැබීමට ඔවුනගේ බ්‍රවුසර් අතුරු මුහුණත් වෙත පිවිස සිටිය යුතුය.

SWIFT සහ සහභාගිකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, එම ව්‍යාපාරික දිනයේ ඉතිරි කාලය සඳහා සන්නිවේදනයන් යථා තත්වයට පත් කිරීමට SWIFT හට නොහැකි වනු ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදහස් කරනු ලබන අවස්ථාවකදී, දවසේ ඉතිරි කාලය සඳහා යෙදවිය යුතු ක්‍රියාපටිපාටිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිවේදනය කරනු ඇත.

දිගුකාලීනව SWIFT නැවත යථා තත්වයට පත් කළ නොහැකි අවස්ථාවලදී, සහභාගිකරුවන් විකල්ප ගෙවීම් හුවමාරු ක්‍රමවේද මගින් ශුද්ධ පදනම මත නිරවුල් කල යුතුය. උදා - ස්වයංක්‍රීය නොවන අරමුදල් පැවරීම, ස්වයංක්‍රීය නොවන සුරැකුම්පත් පැවරීම්, බැංකු චෙක්පත්, ද්විපාර්ශවික හුවමාරු ආදිය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවන්ට භාවිතා කළ යුතු විකල්ප ක්‍රම පිළිබඳව උපදෙස් දෙනු ඇත.

**3.5 ලංකාසෙට්ල් /පරිගණක පාදක පර්යන්ත අවස්ථාව (CBT)**

ප්‍රධාන සහ ආපදා ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි ලංකාසෙට්ල් SWIFT අතුරු මුහුණතෙහි දිගුකාලීන ඇනහිටීමකදී, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සහභාගිවන්නන්ගේ සම්බන්ධතා සමඟ අදහස් විමසා සන්නිවේදනය කරනු ඇත. සහභාගිවන්නන් මෙම සිද්ධිය පිළිබඳව කෙටි පණිවුඩ ලැබීමට ඔවුන්ගේ බ්‍රවුසර අතුරු මුහුණත් වෙත පිවිස සිටිය යුතුය.

SWIFT සහ සහභාගිවන්නන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, එම ව්‍යාපාරික දිනයේ ඉතිරි කාලය සඳහා සන්නිවේදනයන් යථා තත්වයට පත් කිරීමට SWIFT හට නොහැකි වන ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදහස් කරනු ලබන අවස්ථාවකදී, දවසේ ඉතිරි කාලය සඳහා යෙදවිය යුතු ක්‍රියාපටිපාටිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිවේදනය කරනු ඇත.

දිගුකාලීනව ලංකාසෙට්ල් CBT අවස්ථාව නැවත යථා තත්වයට පත්කල නොහැකි අවස්ථාවකදී, සහභාගිවන්නන් විකල්ප ගෙවීම් හුවමාරු ක්‍රමවේද මගින් ශුද්ධ පදනම මත නිරවුල් කල යුතුය.
උදා- ස්වයංක්‍රීය නොවන අරමුදල් පැවරීම, ස්වයංක්‍රීය නොවන සුරැකුම්පත් පැවරීම, බැංකු චෙක්පත්, ද්විපාර්ශවික හුවමාරු ආදිය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිවන්නන්ට භාවිතා කල යුතු විකල්ප ක්‍රම පිළිබඳ උපදෙස් දෙනු ලැබේ.

**3.6 RTGS යෙදුම් අවස්ථා**

ලංකාසෙට්ල් පද්ධතියට සහභාගිකරුවන්ගේ ගිණුම්වලට අදාළ ගනුදෙනු කිරීමට නොහැකි වූ අවස්ථාවකදී RTGS යෙදුම් අවස්ථාවක් හටගනී. මෙම ඇනහිටීම SWIFT අතුරු මුහුණතට වඩා RTGS යෙදුම තුලම සිදුවේ. CBT සහ ලංකාසෙට්ල් යෙදුම යන දෙකම සම්බන්ධ පද්ධති සිදුවීමකදී පද්ධති රීති අනුව ක්‍රියාකරනු ලැබේ.

ප්‍රධාන සහ ප්‍රතිප්‍රාප්ති වැඩබිම යන දෙකෙහිම, RTGS යෙදුම දීර්ඝකාලීනව ඇනහිටි අවස්ථාවකදී ශ්‍රී ලංකා මහ බැංකුව සහභාගිකරුවන් සමඟ අදහස් හුවමාරු කර සන්නිවේදනය කරනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවට මෙහෙයුම් දිනයේ ඉතිරි කාලසීමාව සඳහාද RTGS මෙහෙයුම් යථා පරිදි සකස් කිරීමට නොහැකි බව හැඟී යන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් SWIFT වෙත සහතික කරන ලද ඇමතුමක් මගින් (FIN පිටපත් සේවා විස්තරයේ සී 2.3 සහ පී 8 අනුව) RTGS CUG මෙහෙයුම් ආකාරය "වසා ඇත" ලෙස සංශෝධනය කරන ලෙස SWIFT වෙතින් හදිසි ඉල්ලීමක් කරනු ඇත. මේ සඳහා හදිසි ඇමතුම සහතික කිරීමෙන් පසු විනාඩි 45 ක පමණ කාලයක් ගතවෙනු ඇත. "වසා ඇත" ප්‍රකාරයට මාරු කිරීමෙන් පසු SWIFT මගින් සහභාගිවන්නන් යොමු කරන පියවීම් උපදෙස් MT019 අත්හිටුවන නිවේදනයක් මගින් අත්හිටුවනු ලැබේ.

දීර්ඝකාලීනව RTGS යෙදුම යථා තත්වයට පත්කල නොහැකි අවස්ථාවකදී, සහභාගිවන්නන් විසින් විකල්ප ගෙවීම් හුවමාරු ක්‍රමවේද මගින් (උදා - බැංකු චෙක්පත්, ද්විපාර්ශවික හුවමාරු) ශුද්ධ පදනම මත නිරවුල් කල යුතුය.

**3.7 හදිසි අවස්ථා වාර්තාව**

සෑම සහභාගිකරුවෙක්ම සියළුම හදිසි අවස්ථා හා පද්ධති ගැටළු පිළිබඳ ලිඛිත වාර්තාවක් පවත්වා ගත යුතුය. මෙම වාර්තාවේ දිනය, වේලාව, ගැටළුවේ ස්වභාවය, නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ගය සහ නිවැරදි කිරීමේ වේලාව පිළිබඳ විස්තර ඇතුළත් විය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම වාර්තාව කාර්තුමය වශයෙන් සමාලෝචනය කරයි. පිටපත් ලංකාසෙට්ල් උපකාරක කවුළුවේ අධීක්ෂක වෙත යොමු කළ යුතුය.

**3.8 අනෙකුත් හදිසි අවස්ථාවන්**

පැන නඟින අනෙකුත් හදිසි අවස්ථාවන් සඳහා එක් එක් සිද්ධිය අනුව කටයුතු කළ යුතුය.
එබඳු තත්වයන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සලකා බලා අවශ්‍ය යැයි හැඟී යන විට, පහත ක්‍රියාමාර්ග ගනී.

- ලංකාසෙට්ල් මෙහෙයුම් දිනය දීර්ඝ හෝ කෙටි කිරීම
- පද්ධතියේ ක්‍රියාකාරීත්වය අත්හිටුවීම සහ
- මෙම පද්ධති රීති යටතේ පද්ධතියේ මෙහෙයුම් ක්‍රියාපටිපාටිය අත්සිටුවීම

ශ්‍රී ලංකා මහ බැංකුව සහභාගිකරුවන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමට උත්සහ කරන අතර මෙහෙයුම් යථා තත්වයට පත් කිරීම සඳහා උපදෙස් ලබාදෙනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවම ප්‍රමාදයකින්, නැවත මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන හදිසි පියවර ක්‍රියාත්මක කරනු ඇත. මෙම පියවර ක්‍රියාත්මක කිරීමේදී සහභාගිවන්නන් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

**3.9 හදිසි වැඩ පිළිවෙලවල් පරීක්ෂා කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තමන්ගේ හදිසි වැඩපිළිවෙලවල් කලින් කලට පරීක්ෂා කරනු ලැබේ. සියළුම සහභාගිකරුවන් මෙම ක්‍රියාවලිය සඳහා සහයෝගය දැක්වීමට සහ සහභාගී වීම අවශ්‍ය වේ.

සහභාගිකරුවන්ට තමන්ගේම back-up අඩවි සහ පද්ධති ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක්ව පිළියෙල කරගෙන තමන්ට අවශ්‍ය පරිදි තමන්ගේම හදිසි වැඩපිළිවලවල් පරීක්ෂා කිරීම සඳහා සකස් කර ගත හැකිය. අවම වශයෙන්, සහභාගිකරුවන්ට පද්ධතිය තුළ ක්‍රියාත්මක වීමේ හැකියාවට බලපාන ඕනෑම පරීක්ෂණයක් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය.

ශ්‍රී ලංකා මහ බැංකුවට එක් එක් සහභාගිකරුවන්ගෙන් ඔවුනගේ back-up පහසුකම් සහ හදිසි අවස්ථාවකදී වන වැඩපිළිවලවල් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටිය හැක.

### 3.10 සම්බන්ධීකරණ ස්ථාන

සෑම සහභාගිවන්නෙකුම, ගැටළු නිරාකරණය කරගැනීමෙදී විමසීමකට ප්‍රතිචාර දැක්වීම හෝ තොරතුරු හුවමාරු කරගැනීමට පළමු සම්බන්ධතා ස්ථානයක් නම් කළ යුතුය. සෑම සහභාගිකරුවෙක්ම, පළමු සම්බන්ධීකරණ ස්ථානය නොමැති අවස්ථාවලදී දෙවන සම්බන්ධීකරණ ස්ථානයක් නම් කළ යුතු වේ. මේවා ශ්‍රී ලංකා මහ බැංකුවට ලිඛිතව දැන්විය යුතුය. සම්බන්ධතා ස්ථාන පිළිබඳ විස්තර වල වෙනස්වීමක් ඇති වූ වහාම සහභාගිකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට ඒ පිළිබඳව දැන්විය යුතුය.

### 3.11 පරිපාලන පණිවුඩ

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් එවන ලද පරිපාලනමය පණිවුඩ සඳහා සහභාගිකරුවන් ක්ෂණිකව ක්‍රියාත්මක විය යුතුය. එබඳු පණිවුඩ ලැබීමට සහ ඒවාට සුදුසු අකාරයේ ක්‍රියාමාර්ග ගැනීමට සහභාගිකරුවන්ගේ අසමත් වීම තුලින් පැන නගින කවර ආකාරයේ හෝ පාඩුවකට ශ්‍රී ලංකා මහ බැංකුව වගකියනු නොලැබේ.

### 3.12 සහභාගිකරුවෙකු හෝ ගිණුමක් අත්හිටුවීම

ශ්‍රී ලංකා මහ බැංකුව සිය අභිමතය පරිදි, අත්හිටවූ පද්ධති තත්වයක් සහභාගිකරුවෙකුට හෝ සහභාගිකරුවෙකුගේ ගිණුමට පැවරිය හැකිය. මෙය විවිධ තත්ත්වයන් යටතේ භාවිතා කළ හැකි නමුත් වහාම පියවරක් ගත යුතු හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැක. හදිසි අවස්ථාවකදී උද්ගත වන ද්‍රවශීලතා ගැටළු විසඳා ගැනීමට මෙම තාවකාලික අත්හිටුවීම මහ බැංකුවට ඉඩ පහසුකම සලසයි. හදිසි අවස්ථා තත්ත්වය විසඳා ගත් වහාම අත්හිටුවීම ඉවත් කළ හැකිය.

### 3.13 අත්හිටවූ සහභාගිකරුවන්ගේ තත්ත්වය

ශ්‍රී ලංකා මහ බැංකුවට සහභාගිකරුවෙකු හට අත්හිටවූ තත්ත්වයක් පැවරිය හැක. මෙමගින් සහභාගිකරු වෙත සහ සහභාගිකරුවන් විසින් යැවෙන සෑම ගෙවීමක්ම වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ. සහභාගිකරුට අත්හිටවූ තත්ත්වයක් පැවරූ වහාම පද්ධතියේ ඇති සහභාගිකරු වෙත හෝ එම සහභාගිකරු විසින් පිටතට යැවෙන දැනට පද්ධතිය තුළ නොපියවී ඇති සෑම ගනුදෙනුවක්ම ප්‍රතික්ෂේප වේ. මැන්ඩේට් ගිවිසුමෙහි විස්තර කර ඇති තත්ත්වයන්ට අනුව තත්කාලීන දළ පියවීම් පද්ධතිය/ ලංකාසෙක්‍යු පහසුකම් ඉවත් කර ගැනීම සිදුවනු ඇත.

## 4. පද්ධති පරිපාලනය සහ පරිශීලක සහාය

### 4.1 SWIFT පරිශීලක සහාය

SWIFT සම්බන්ධ ගැටළු අත්විඳින සහභාගිකරුවන්, SWIFT පරිශීලක අත්පොතට අනුව ඔවුන්ගේ සාමාන්‍ය SWIFT පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පහසුකම් භාවිතා කළ යුතුය.

### 4.2 ලංකාසෙට්ල් උපකාරක කවුළුව

සහභාගිකරුවන්ට ලංකාසෙට්ල් පද්ධතිය භාවිතා කිරීම සඳහා සහය වීමට සහ සේවා දුෂ්කරතාවලට මුහුණ දීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාසෙට්ල් උපකාරක කවුළුව ස්ථාපිත කර පවත්වාගෙන යනු ලැබේ. ලංකාසෙට්ල් මෙහෙයුම් දිනය පුරාම උපකාරක කවුළුව පවත්වාගෙන යනු ලබයි. උපකාරක කවුළුවේ සම්බන්ධතා තොරතුරු යාවත්කාලීන කරන අතර ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සහභාගිවන්නන් සඳහා එම තොරතුරු වරින් වර යවනු ලැබේ.

## 5. සහභාගිවන්නන් අතර ඇතිවන මතභේද

පද්ධතියේ කිසියම් ගනුදෙනුවක නීත්‍යානුකූලභාවය, වලංගුභාවය හෝ බලාත්මක කිරීමේ හැකියාව තීරණය කිරීම හෝ එවැනි ගනුදෙනුවක් ගිවිසුම් ගතව අවලංගු හෝ අවලංගු කළ හැකිද යන්න තීරණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට කිසිදු වගකීමක් නොමැත. මතභේද වැලැක්වීම සඳහා සහභාගිකරුවන් සියලු ගනුදෙනු වල නීත්‍යානුකූලව වලංගු සහ බලාත්මක කළ හැකි බවට සහතික විය යුතුය. සියළුම ගනුදෙනු නීත්‍යානුකූල, වලංගු සහ බලාත්මක කළ හැකි ඒවා ලෙස සැලකීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හිමිකම් තිබේ.

කිසියම් දෝෂයක්, අතපසුවීමක්, අසමත් වීමක්/ අඩුපාඩුවක්, වංචාවක්, සොරකමක් හෝ පද්ධතියේ හෝ SWIFT හි වැරදි භාවිතය හේතුවෙන් කිසියම් ගනුදෙනුවක් ප්‍රතික්ෂේප කිරීමට හෝ වෙනස් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කිසිදු සහභාගිකරුවෙකුට වග කියනු නොලැබේ.

සහභාගිකරුවන් අතර හෝ සහභාගිකරුවන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර යම්කිසි මතභේදයක් සම්බන්ධයෙන් කිසියම් අයිතිවාසිකමක් පිළිබඳ තීරණයක් ගැනීමට හෝ යම් අයිතිවාසිකමක් තහවුරු කිරීමට පද්ධතියේ මෙහෙයුම් කටයුතු වලට යම් ගැලපීමක් කිරීමට හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට කිසිදු වගකීමක් නැත.

පද්ධතියේ සහභාගිකරුවන් අතර වෙනසක් හෝ මතභේදයක් පැන නැඟුනහොත්, එම වෙනස හෝ මතභේදය සඳහා සම්බන්ධ පාර්ශව, එවැනි මතභේදයක් හෝ වෙනසක් අන්‍යෝන්‍ය සාකච්ඡා මගින්, ගිවිස ගැනීමෙන් හෝ සමාදාන මැදහත් වීමකින් විසඳා ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. ගැටළුව සමාදාන මැදිහත් වීමකින් විසඳා ගැනීමට නොහැකි නම්, එම ගැටළුව බේරුම්කරණයක් මගින් හෝ නඩු මාර්ගයෙන් විසඳා ගත යුතුය. එවැනි බේරුම්කරණයක් තුලින් ගන්නා තීරණය පාර්ශවයන් හා බැඳී පවතී.

මතභේදයට භාජනය වීම මගහැරීම සඳහා, මෙම ප්‍රතිපාදනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිකරුවෙකුගේ නියාමකයෙකු ලෙස හෝ අධීක්ෂකයෙකු ලෙස ඕනෑම නීතියක් යටතේ ගනු ලබන ක්‍රියාමාර්ගයක් හෝ තීරණයක් ගැනීම සඳහා බලනොපායි.

## 6. පද්ධතියේ වෙනස්කිරීම් සහ වෙනස් කිරීම් පාලනය

### 6.1 පද්ධතියේ නිවැරදි කිරීම්, වෙනස් කිරීම් සහ වැඩිදියුණු කිරීම්

පහත සඳහන් අරමුණු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අවශ්‍ය යැයි සලකන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පද්ධතියේ නිවැරදි කිරීම්, වෙනස් කිරීම් හෝ වැඩිදියුණු කිරීම් සිදු කරනු ඇත.

(අ) පද්ධතිය සැලසුම් කර ඇති ආකාරයට ක්‍රියාත්මක වන්නේ යැයි සහතික කිරීම හෝ

(ආ) සහභාගිවන්නන්ගේ අතිරේක සාධාරණ අවශ්‍යතා සපුරාලීම හෝ

(ඇ) පද්ධතියේ සජීවී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද දිනයේ පැවති ක්‍රියාකාරීත්ව මට්ටමට වඩා පද්ධතියේ ක්‍රියාකාරීත්වය වෙනස් කිරීම

එවැනි අවස්ථාවක, අදාල සංශෝධන හෝ වැඩිදියුණු කිරීම් සඳහා යන වියදම සහභාගිකරු හෝ සහභාගිකරුවන් ගෙවිය යුතු ගාස්තු වල ගැලපීම් මගින් පියවාගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ඇත.

පද්ධතියේ නිවැරදි කිරීමක් ඇති වූ විට පද්ධතිය සැලසුම් කර ඇති ආකාරයටම අඛණ්ඩව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා සහභාගිකරුවන්ගේ අදහස් හා උපදෙස් ලබාගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සාධාරණ උත්සාහයක් ගනු ලබයි. කෙසේ වෙතත්, හදිසි සංශෝධන අවශ්‍යතාවයකදී සහභාගිකරුවෙකුගෙන් අදහස් හා උපදෙස් ලබාගැනීම සහභාගිකරුවන්ට විශාල අපහසුවක් ඇති වීමට ඉඩ ඇත්නම් එවැනි නිවැරදි කිරීමක් සිදුකිරීමේදී සහභාගිකරුවන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව බැඳී නොසිටී.

### 6.2 ලංකා සෙට්ල් පද්ධතියේ වෙනස් කිරීම් සහ වෙනස් කිරීම් පාලනය කිරීම

පහත සඳහන් මාර්ගෝපදේශ අනුව ලංකාසෙට්ල් හි සැලසුම් ගත වෙනස් කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාලනය කරනු ඇත.

- සැලසුම්ගත පද්ධති වෙනස් කිරීම් ක්‍රියාත්මක කිරීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිවන්නන් වෙත අවවාද සහ උපදෙස් ලබා දෙයි ;
- පද්ධති රෙගුලාසි හා සම්බන්ධ සංශෝධන සහ අනෙකුත් පද්ධති ලේඛනයන් යෝග්‍ය පරිදි නිකුත් කරනු ලබයි ; සහ
- ඕනෑම නවීකරණයක් ක්‍රියාත්මක කිරීමට පෙර සැලසුම් කරන ලද පරිසරයක් තුළදී පරීක්ෂා කරනු ලැබේ. එබඳු පරීක්ෂණ පැවැත්වීම සඳහා සහභාගිවන්නන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහාය දැක්විය යුතුය.

### 6.3 SWIFT ප්‍රමිතීන් වල වෙනස් කිරීම්

ඉදිරි SWIFT යෙදුම් සහ ප්‍රමිතීන් පිළිබඳ SWIFT ප්‍රගති තොරතුරු, ශ්‍රී ලංකා මහ බැංකුව සමාලෝචනය කරයි. ලංකාසෙට්ල් මෙහෙයුම් සඳහා ඉදිරි වෙනස් කිරීම් බලපෑමක් ඇත්දැයි ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සහභාගිකරුවන්ට මෙම වෙනස්කිරීම් පිළිබඳ උපදෙස් සහ සහභාගිකරුවන් විසින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවද උපදෙස් ලබා දෙනු ලබයි. ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් සඳහා බලපාන ඕනෑම SWIFT වෙනස් කිරීමක් සහභාගිකරුවන් විසින් ක්‍රියාත්මක කළ යුතුය.

## 7. ගාස්තු සහ අයකිරීම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගාස්තු සහ අයකිරීම් ගණනය කොට, මැන්ඩේට් ගිවිසුමට (Mandate Agreement) අනුකූලව සහභාගිකරුවන්ගේ පියවීම් ගිණුමෙන් ඒවා අයකරගනී. තම පරම අභිමතය පරිදි අයකිරීම් සහ ගාස්තු වෙනස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. සංශෝධනයන් ක්‍රියාත්මක කිරීමට අවම වශයෙන් දින 30 කට පෙර සංශෝධිත ගාස්තු සහ අයකිරීම් සහභාගිවන්නන් වෙත දැනුම් දෙනු ලැබේ.

සෑම කැලැන්ඩර් මාසයක් අවසානයේදීම අයකිරීම් ගණනය කොට ඊළඟ මාසයේ තුන්වන වැඩ කරන දිනයේදී සහභාගිවන්නන්ගේ පියවීම් ගිණුමෙන් හර කරනු ලැබේ.

අදාළ පියවීම් ගිණුම් හර කිරීමට පෙර ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු පිළිබඳ විස්තර සහිත ඉන්වොයිසියක් සහභාගිකරුවන්හට ලබා දෙනු ලැබේ.

## ඇමුණුම්

### පටුන

**ඇමුණුම (අ)**
සහභාගිකරුවන් පත් කිරීම ................................................ 62A

**ඇමුණුම (ආ)**
අත්හිටුවීමේ නිවේදන ................................................ 64A

**ඇමුණුම (ඇ)**
ආයෝජක වර්ගීකරණය - අර්ථලාභී හිමිකරු වර්ග ................................................ 65A

**ඇමුණුම (ඈ)**
සහභාගිවන්නන්ගේ බැංකු හඳුනාගැනීමේ (BIC) කේත ................................................ 66A

## ඇමුණුම (අ)

### සහභාගිකරුවන් පත් කිරීම

දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 8 (1) සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරකුම් පත් ආඥා පනතෙහි 21 C (2) ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs), ලංකාසෙට්ල් පද්ධතියෙහි සෘජු සහභාගිකරුවන් සහ අලෙවිකරණ සෘජු සහභාගිකරුවන් ලෙස පත් කිරීම.

1. **තෝරා ගැනීම සඳහා වන නිර්ණායක**

(අ) බලපත්‍රලාභී විශේෂිත බැංකු සෘජු සහභාගිකරුවන් සහ අලෙවිකරණ සෘජු සහභාගිකරුවන් ලෙස තෝරා ගැනීම සඳහා වන නිර්ණායක පදනම් වන්නේ ;

(i) බලපත්‍රලාභී විශේෂිත බැංකුවෙහි මූල්‍ය ස්ථාවරභාවය
බලපත්‍රලාභී විශේෂිත බැංකු අයදුම්කරුට අදාළව පහත දැක්වෙන අනුපාත වල වසර දෙකක සාමාන්‍යය භාවිතා කිරීමෙන් මෙය මනිනු ලබන අතර බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ සාමාන්‍ය, සංසන්දනය කිරීම සඳහා මිණුම් දණ්ඩක් ලෙස සලකනු ලැබේ.

- නියාමන ප්‍රාග්ධනය/ අවදානම මත බර තැබූ වත්කම් (ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR))
- දළ අක්‍රීය ණය අනුපාතය
- ශුද්ධ අක්‍රීය ණය අනුපාතය
- ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය
- හිමිකම් මත ප්‍රතිලාභ
- වත්කම් මත ප්‍රතිලාභ
- සේවක පිරිවැය අනුපාතය (පුද්ගල වියදම්/ මෙහෙයුම් වියදම්)
- ශුද්ධ ආදායමට මෙහෙයුම් වියදම් අනුපාතය (කාර්යක්ෂමතා අනුපාතය)

(ii) දේශීය ශ්‍රේණිගත තත්ත්වය
බලපත්‍රලාභී විශේෂිත බැංකු අයදුම්කරු පිළිගත හැකි ශ්‍රේණිගත කිරීමේ ආයතනයකින් ශ්‍රේණිගත කිරීමක් ලබාගත යුතුය. (ෆිච් රේටින් ලිමිටඩ්, ලංකා රේටින් නියෝජිත ආයතනය, හෝ ඕනෑම ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනයක්)

(iii) අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි මට්ටමක පැවතීම.

(iv) තත්කාලීන දළ පියවීම් පද්ධතියේ (RTGS)/ නිර්ලේඛන සුරකුම්පත් පියවීමේ පද්ධතියේ (SSSS) සහභාගිත්වය සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් පැවතීම ඉදිරි වසර 5 ක කාලය සඳහා සහභාගීත්ව සහ ව්‍යාපාරික ක්‍රමෝපාය සැලැස්මක් ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි පරිදි තිබීම.

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවයන්ට අනුකූලව ජාතික ගෙවීම් පද්ධතියට සම්බන්ධ වීමට අවශ්‍ය තොරතුරු තාක්ෂණ සන්නිවේදන යටිතල පහසුකම් ස්ථාපිත කිරීමට බලපත්‍රලාභී විශේෂිත බැංකුව සතු හැකියාව. ඒ සඳහා අවශ්‍ය අවම අවශ්‍යතා පහතින් දැක්වේ.

- SWIFT සම්බන්ධතාවය
- ශ්‍රී ලංකා මහ බැංකු පුළුල් ප්‍රදේශ ජාල සම්බන්ධතාවය
- තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ අත්දැකීම් පැවතීම

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ඉහත නිර්ණායක යොදාගනිමින් සකස් කරන ලද ලකුණු සටහන් ක්‍රමයක් බලපත්‍රලාභී විශේෂිත බැංකු සෘජු සහභාගිකරුවන් සහ අලෙවිකරණ සෘජු සහභාගිකරුවන් ලෙස පත් කිරීමට අදාල යෝග්‍යතාවය මැන බැලීම සඳහා භාවිතා කරනු ලැබේ.

(ඇ) ඉහත සඳහන් නිර්ණායක වලට අමතරව, බලපත්‍රලාභී විශේෂිත බැංකු සෘජු සහභාගිකරුවන් හෝ අලෙවිකරණ සෘජු සහභාගිකරුවන් ලෙස තෝරා ගැනීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල බලපත්‍රලාභී විශේෂිත බැංකුවෙහි කළමනාකාරීත්වයේ ගුණාත්මකභාවය සහ එහි පෙර වාර්තා, විශේෂයෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකුවල මෙහෙයුම් අන්තරායන් සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව සලකා බලනු ලැබේ.

(ඈ) කෙසේ වෙතත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සෘජු සහභාගිකරුවෙකු හෝ අලෙවිකරණ සෘජු සහභාගිකරුවෙකු ලෙස පත් කිරීමට අවශ්‍ය වන වෙනත් සාධක සලකා බැලීම සඳහා මහ බැංකුවට අභිමතය පරිදි ක්‍රියා කල හැකිවේ.

(ඉ) බලපත්‍රලාභී විශේෂිත බැංකු, සෘජු සහභාගිකරුවන් හෝ අලෙවිකරණ සෘජු සහභාගිකරුවන් ලෙස යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරනු ලබන තේරීම් කමිටුවක් විසින් සිදු කරනු ලබයි.

**2. නියමයන් සහ කොන්දේසි**

මෙහි දක්වා ඇති කොන්දේසි වලට යටත්ව තෝරාගත් බලපත්‍රලාභී විශේෂිත බැංකු තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියේ සෘජු සහභාගිකරුවන්/ අලෙවිකරණ සෘජු සහභාගිකරුවන් ලෙස සලකනු ලැබේ.

(අ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත, මුදල් නීති පනත, හා ලංකාසෙට්ල් පද්ධතියේ රීතිවලට අනුකූලව සෘජු සහභාගිකරුවන්ට/අලෙවිකරණ සෘජු සහභාගිකරුවන්ට අදාල වන රීති හා රෙගුලාසි වලට යටත් වන පරිදි සම්බන්ධ වන බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට සුරැකුම් පියවීමේ ගිණුමක් සහ තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පියවීම් ගිණුමක් සපයනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින්වර තීරණය කරනු ලබන නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, තෝරාගත් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා දෛනික ද්‍රවශීලතා පහසුකම සපයනු ලැබේ.

(ඇ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත, මුදල් නීති පනත සහ ගෙවීම් හා පියවීම පද්ධති පනත අනුව තෝරාගත් බලපත්‍රලාභී විශේෂිත බැංකු වල තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය පිළිබඳව අධීක්ෂණය කිරීමේ පූර්ණ අධිකාරි බලය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතී.

**ඇමුණුම (ආ)**

අත්හිටුවීමේ නිවේදන

RTGS පද්ධතියේ අත්හිටුවන ලද ගෙවීම් පණිවුඩ (MT097) සඳහා නැවැත්වීම දැනුම්දීමේ කේතයන්

| තත්ත්ව කේත | විස්තරය |
|---|---|
| LA070 | සත්‍ය බව සහතික කිරීමට අසමත් වීම හේතුවෙන් අත්හිටුවන ලදී. |
| LA071 | ඉදිරිපත් කිරීමේ හෝ පිළිගැනීමේ සාමාජිකයා නොදන්නා බැවින් අත්හිටුවන ලදී. |
| LA072 | ප්‍රවේශයේදී හෝ රැඳීසිටීමේදී සහ ගෙවීම් මාදිලිය සඳහා පියවීම් තත්ත්වය “වසා ඇත", “ප්‍රතික්ෂේප කර ඇත" හෝ “සම්පූර්ණයි" ලෙස සඳහන් කර ඇති විටදී අත්හිටුවන ලදී. (එනම් CAS මගින් මේ ආකාරයේ ගෙවීමක් පිළිගැනීම හෝ ක්‍රියාත්මක කිරීම නවතා ඇත.) |
| LA073 | වලංගු නොවන ගෙවීම් දිනයක් බැවින් අත්හිටුවන ලදී. |
| LA074 | මෙම වර්ගයේ ගෙවීම් සඳහා අවසර නැති ගෙවීම් ප්‍රවේශයක් බැවින් අත්හිටුවන ලදී. |
| LA075 | භාවිතා කර නැත. |
| LA076 | සහභාගිකරුගේ ආයතනය, ගෙවීම් පැහැරහැර ඇත්නම් අත්හිටුවන ලදී. |
| LA077 | දෙවතාවක් ගෙවීමකි. |
| LA078 | වලංගු නොවන ගෙවීමකි. |
| LA079 | අවලංගු කරන ලදී. |
| LA080 | CAS හි දෝෂයක් |
| LA081 | වලංගු නොවන ආකෘතියකි. |
| LA082 | අරමුදල් ප්‍රමාණවත් නොවීම. (අරමුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී, ගෙවීම් පෝලිම් වීම සඳහා ඉඩ නොදෙන ලෙසට ඇතුලත් කිරීමේ වර්ගය හැඩ ගස්වා ඇති අවස්ථා සඳහා) |
| LA083 | මෙම මුදල, ගෙවීම් පණිවිඩ වර්ග සඳහා වන අවසර දී ඇති අවම ප්‍රමාණයට වඩා අඩු වේ. |
| LA084 | යෝග්‍ය නොවන හර ගිණුමකි. |
| LA085 | යෝග්‍ය නොවන බැර ගිණුමකි. |
| LA086 | මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පෙරනය (AML Filter) මගින් ප්‍රතික්ෂේප විය. |

**ඇමුණුම (ඇ)**
ආයෝජක වර්ගීකරණය - අර්ථලාභී හිමිකරු වර්ග

| අර්ථලාභී හිමිකරු වර්ග | අර්ථලාභී හිමිකරු මාදිලි විස්තරය |
|---|---|
| S | තනි |
| C | සංස්ථාපිත |
| 2 | හවුල් (2) |
| 3 | හවුල් (3) |
| 4 | විදේශීය දූත මෙහෙවර |
| 0 | මහ බැංකුව |
| 1 | සේවක අර්ථසාධක අරමුදල |
| 5 | සේවක භාරකාර අරමුදල |
| 6 | මූල්‍ය සමාගම් |
| 7 | සේනාංක |
| 8 | රාජ්‍ය අධිකාරිය |
| 9 | රාජ්‍ය මණ්ඩලය |
| A | රාජ්‍ය සංස්ථා |
| B | රාජ්‍ය දෙපාර්තමේන්තු |
| D | රාජ්‍ය අරමුදල |
| E | රාජ්‍ය විශ්‍රාම අරමුදල |
| F | පාරිතෝෂික අරමුදල |
| G | ඒක පුද්ගල |
| H | රක්ෂණ සමාගම් |
| I | කල්බදු සමාගම් |
| J | බලපත්‍රලාභී වාණිජ බැංකු |
| K | බලපත්‍රලාභී විශේෂිත බැංකු |
| L | වෙළඳපොල අතරමැදියා |
| M | අමාත්‍යාංශය |
| N | මුදල් තැරැව්කාර සමාගම් |
| O | අන්‍යොන්‍ය අරමුදල |
| P | වෙනත් |
| Q | ප්‍රාථමික අලෙවිකරු |
| R | පෞද්ගලික අරමුදල |
| T | පෞද්ගලික අර්ථසාධක අරමුදල |
| U | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල |
| V | ඉතිරි කිරීමේ ආයතන |
| W | කොටස් තැරැව්කාර සමාගම් |
| X | ඒකක භාර |
| Y | පෞද්ගලික ආයතන |
| Z | සමාජය/ සංගමය |

ඇමුණුම (ඇ)

**සහභාගිවන්නන්ගේ බැංකු හඳුනාගැනීමේ (BIC) කේත**

| | සහභාගිවන්නා | බැංකු හඳුනාගැනීමේ (BIC) කේත |
|---|---|---|
| 1 | ඇක්යුට් සෙකියුරිටීස් සමාගම | HNBSLKLX |
| 2 | අමානා බැංකුව | AMNALKLX |
| 3 | ලංකා බැංකුව | BCEYLKLX |
| 4 | චීන බැංකුව | BKCHLKLX |
| 5 | කැපිටල් අලයන්ස් සමාගම | CALDLKLX |
| 6 | කාර්ගිල්ස් බැංකුව | CGRBLKLX |
| 7 | ශ්‍රී ලංකා මහ බැංකුව | CBCELKLX |
| 8 | මධ්‍යම තැන්පත් පද්ධතිය | CDSPLKLC |
| 9 | සිටි බැංකුව | CITILKLX |
| 10 | කොමර්ෂල් බැංකුව | CCEYLKLX |
| 11 | ඩොයිෂ් බැංකුව | DEUTLKLX |
| 12 | ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකුව | DFCCLKLX |
| 13 | සේවක අර්ථසාධක අරමුදල | CBCELKLXEPF |
| 14 | එන්ට්‍රස්ට් සෙකියුරිටීස් | CSSLLKLX |
| 15 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් සමාගම | FCTLLKLX |
| 16 | හබීබ් බැංකුව | HABBLKLC |
| 17 | හැටන් නැෂනල් බැංකුව | HBLILKLX |
| 18 | හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුව | HSBCLKLX |
| 19 | ඉන්දියානු බැංකුව | IDIBLKLC |
| 20 | ඉන්දියානු විදේශ බැංකුව | IOBALKLC |
| 21 | එම්.සී.බී. බැංකුව | MUCBLKLC |
| 22 | ජාතික සංවර්ධන බැංකුව | NDBSLKLX |
| 23 | නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | NTBCLKLX |
| 24 | නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම | NWSLLKLX |
| 25 | එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම | NSBFLKLX |
| 26 | පෑන් ඒෂියා බැංකුව | PABSLKLX |
| 27 | මහජන බැංකුව | PSBKLKLX |
| 28 | පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම | PPTLLKLX |
| 29 | පබ්ලික් බැංකුව | PBBELKLX |
| 30 | සම්පත් බැංකුව | BSAMLKLX |
| 31 | සෙලාන් බැංකුව | SEYBLKLX |
| 32 | ස්ටෑන්ඩඩ් චාර්ටඩ් බැංකුව | SCBLLKLX |
| 33 | ඉන්දියානු රාජ්‍ය බැංකුව | SBINLKLX |
| 34 | යූනියන් බැංකුව | UBCLLKLC |
| 35 | වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් සමාගම | WTEYLKLX |

02 - 264

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.